# නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

# 2024 ප්‍රගති වාර්තාව

12 වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල

## නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස
## ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



සෑම පුරවැසියෙක්ම විධිමත් හා සැලසුම් සහගත ග්‍රාමීය හා නාගරික පරිසරයක ගුණාත්මකව නිම වූ සෞඛ්‍යාරක්ෂිත හා සැපපහසු නිවාසයක තෘප්තිමත් ජීවිතයක් ගතකරනු දැකීම නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ අරමුණයි. එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ආයතන 17 ක් අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මූල්‍ය හා අනෙකුත් දුෂ්කරතා මධ්‍යයේ වුවද 2024 වසර තුළ අප අමාත්‍යාංශය කාර්යක්ෂම හා ගුණාත්මක මහජන සේවාවන් ඉටුකිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන, විදේශීය ආධාර හා ණය මෙන්ම, ඒ ඒ ආයතනවල ස්වයං ප්‍රතිපාදන උත්පාදන භාවිතා කරමින් කටයුතු කරන ලදී.

රටේ වර්තමාන ආර්ථික අභියෝග ජයගැනීමට රජයේ ප්‍රතිපත්තිය වන **"පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්"** ජනතාවට ලබාදීම සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය ලෙස පැවරී ඇති කාර්යභාරය සුළුපටු නොවේ. රාජ්‍ය මූල්‍ය බාධා මධ්‍යයේ වුවද, තිරසාර නාගරික සංවර්ධනයක් ඇති කිරීමට වර්තමාන රජයේ බලාපොරොත්තුව වන අතර එහිදී අපගේ පුරවැසියන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා **"සුවපහසු නිවසක් සනීපාරක්ෂක ජීවිතයක්"** උදාකර දීමට සීමිත සම්පත් සමඟ වැඩි වටිනාකමක් ලබාදීමත්, ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහාත්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කාර්යභාරය නියාමනය, පිරිවැය අඩුකිරීම, ශිල්ප ක්‍රම භාවිතය තුළින් මෙම අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සැකසීමට කටයුතු යොදා ඇත.

මෙම අමාත්‍යාංශය යටතේ පවතින නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමුඛ කාර්යභාරය වන නාගරික සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම යටතේ නාගරික සංවර්ධන සැලසුම් ගැසට් කර ඇති අතර 2024 වර්ෂයේ සියක් නගර සංවර්ධන වැඩසටහන හා සමගාමීව නගර සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

අඩු හා මධ්‍ය අදායම් ලබන නාගරික මෙන්ම ග්‍රාමීය ජනතාවට නොමිලේ හෝ සාධාරණ මිලකට නිවසක් ලබාදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හා නිවාස සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති යටතේ නිවාස 5258 ක් නිම කිරීමට හැකිවී ඇත.

දේශීය හා විදේශීය අධාර ව්‍යාපෘති තුළින් අඩු අදායම්ලාභී නාගරික ජනතාවට නිවාස පහසුකම් සැපයීමේ අරමුණින් නාගරික පුනර්ජනන ව්‍යාපෘතියත්, නාගරික පැල්පත් හා මුඩුක්කු වල ජනතාව ගේ නිවාස ගැටළුව විසඳීම සඳහා චීන අධාර යටතේ ක්‍රියාත්මක පෑලියගොඩ, දෙමටගොඩ, මහරගම, මොරටුව හා කොට්ටාව ප්‍රදේශවල නිවාස සංකීර්ණවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපට

හැකිවිය. ග්‍රාමීය ජනතාව ඉලක්ක කරමින් ක්‍රියාත්මක වන ඉන්දියානු හා ශ්‍රී ලංකා නිවාස ව්‍යාපෘති යටතේ ඇතැම් ආදර්ශ ගම්මාන ජනතා අයිතියට පැවරීමට හැකිවීම අප අමාත්‍යාංශයේ ජයග්‍රහණයකි.

සියලු ජනතාවගේ පිරිසිදු ජල අවශ්‍යතාවය සහතික කරමින් තිරසාර ජලය සහ සනීපාරක්ෂක විසඳුම් ලබාදීම වෙනුවෙන් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව කරනු ලබන සේවය නාගරික මෙන්ම ග්‍රාමීය ජනතාව දක්වා විහිදී ඇත. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනයකිරීමේ සංස්ථාව විසින් කොළඹ හා තදාසන්න නගරවල තෙත්බිම් කළමනාකරණය, නාගරික ගංවතුර කළමනාකරණය හා වැසි ජලය අපවහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කරමින් ඇත.

එමෙන්ම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධනය, කොන්ත්‍රාත්කරුවන් නියාමනය කරමින් ගුණාත්මක සේවයක් රටවැසියන්ට ලබාදීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියත්, වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු නිර්මාණ සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවත්, යාන්ත්‍රික ඉංජිනේරු නිෂ්පාදන හා සේවා කටයුතු සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවත් රටේ තිරසාර සංවර්ධනය වෙනුවෙන් විශේෂ උත්සාහයක් ගෙන ඇත .

පොහොසත් රටක් හා ලස්සන ජීවිතයක් සඳහා අත්‍යවශ්‍ය සුවපහසු හා සනීපාරක්ෂක නිවසක් සෑම පුරවැසියකුටම ලබාදීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ඉදිරි වසර තුළ අප අමාත්‍යාංශයේ සියලු දෙනාම සාමූහිකව සහ වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු. එමෙන්ම විද්‍යාත්මකව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ගුණාත්මක හා වෘත්තිමය සේවා නියුක්තියක් ඇති කරලීමට අවශ්‍ය ප්‍රමිතීන් හඳුන්වාදීමටත් ඒවා නියාමනය කිරීමටත් එම ක්ෂේත්‍රයේ විනිවිදභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් අවශ්‍ය පියවර 2025 වසරේදී ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙමු. එමෙන්ම ඉදිරියේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පිරිවැය අඩුකිරීම, පාරිසරික බලපෑම අවමකිරීම, කාර්යක්ෂම තාක්ෂණයන් යොදා ගැනීම උදෙසා වැඩි අවධානයක් යොමුකරමින්, නාගරික සංවර්ධන අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ප්‍රජා සහභාගීත්වය මත විසඳුම් ලබාදීමට කටයුතු කරනු ඇත.

අභියෝග ජයගැනීමට සාමූහික උත්සාහයන් අවශ්‍යවන අතර මෙම අමාත්‍යාංශයේ සංවර්ධන හා ප්‍රජා සේවා සම්පාදනයට හවුල්කරුවන්ගේ සහ පාර්ශවකරුවන්ගේ සහයෝගය හා කැපවීම මෙන්ම දීර්ඝකාලීන දැක්ම ඉදිරියේදී වඩාත් අත්‍යාවශ්‍ය වනු ඇත.

අමාත්‍යාංශයේ මූලික අරමුණු උදාකරගැනීම සඳහා ගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමිය, නියෝජ්‍ය අමාත්‍යතුමා සහ ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලයට මෙන්ම සියලුම හවුල්කරුවන්ට ස්තූතිය පළ කරන අතර, මෙතෙක් ලබාදුන් සහයෝගය ඉදිරියට ද අපේක්ෂා කරමි.

අනුර කරුණාතිලක (පා .ම.)
අමාත්‍ය
නාගරික සංවර්ධන , ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

# ගරු නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලයක් තිස්සේ පැවති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග වෙනස් කරමින් නව දිශානතියකට මාතෘ භූමිය මෙහෙයවීමේ කාර්යය ආරම්භ කරමින් 2025 වසරේ අයවැය කාරක සභා අවස්ථාවට අප අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනය සඳහා පණිවුඩයක් ලබා දීමට අවස්ථාව ලැබීම මාගේ භාග්‍යයක් ලෙස සළකමි.

විවිධ කළමනාකරණ දූර්වලතා හේතුවෙන් රට දැඩි ආර්ථික අවපාතයකට පත්ව ඇති අවස්ථාවක නැවත නිවැරදි මාවතකට යොමු කිරීම සඳහා සමස්ත ශ්‍රී ලාංකික ජනතාව ගත් නිර්භීත ක්‍රියාමාර්ගය පිළිබඳව මාගේ ගෞරවය හා ප්‍රණාමය පුද කරමි.

අපගේ නව රජයේ ප්‍රතිපත්තිය වන **" පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් "** ජනතාවට ළඟා කරදීමේ පරම අභිප්‍රායෙන් **" සුව පහසු නිවසක්, සනීපාරක්ෂක ජීවිතයක් "** උදාකරලීමේ තිර අදිටනින් යුතුව නිවැරදි මාවතකට මෙහෙයවීමේ කාර්යේදී, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ නිවාස විෂයට සම්බන්ධ කාර්යයභාරය මා හට පැවරී ඇත.

නව රජයේ ප්‍රතිපත්ති මෙහෙයවීම සඳහා පහසුකම් සැපයීම පිණිස වත්මන් වැඩසටහන් තුළ කාර්යය සාධන මට්ටම ඉහළ නැංවීම සහ අරමුදල් සැපයීම යුක්තිසහගත කරන්නා වූ ක්‍රමවත්, නැවුම් වූ වැඩපිළිවෙළකට යටත්ව සියලු රාජ්‍ය ආයතනයන් හි ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකිරීමේදී රාජ්‍ය සේවකයා නිවැරදි පිළිවෙතක සිටිමින් වඩාත් කාර්යක්ෂම, ඵලදායී ක්‍රමවේදයක් අනුගමනය කිරීම මැනවි යැයි අපගේ විශ්වාසයයි.

නාගරීකරණයත් සමඟ ලංකාවේ සෑම ප්‍රධාන නගරයකම පාහේ විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටළුව ඉතා උග්‍රව පවතී. කොළඹ නගරය තුළ පමණක් පැල්පත් හා මුඩුක්කු නිවාස 65,000 ක පමණ ප්‍රමාණයක් අක්කර 1000 ක පමණ වපසරියක විසිරී ඇත.

මෙම නිවාසවල පදිංචි ජනතාව පැවති රජයන් විසින් නොසළකා හරින ලද අතර, අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් සහ පිරිසිදු වාතාශ්‍රය නොමැතිකමින් පීඩා විඳීමට සිදුවී ඇත. මීට අමතරව, තමා විසින්ම සාදාගත් නිවාස, මිලදී ගත් නිවාස සහ කුලී නිවාස වල ජීවත් වීම යනාදී ලෙස විවිධ අයුරින් ජීවත් වන ජනතාව නගරයේ දැකිය හැක. එහෙත් ජනතාවගේ ආදායම් තත්ත්වය අනුව නිවසක් ඉදිකිරීම, මිලදී ගැනීම හෝ කුලියට පදිංචිවීම ගැටළු සහගතය. විශේෂයෙන්ම සමහර රජයේ නිලධාරීන් කුලී පදනම මත පදිංචි වී සිටිය ද එම කුලිය ගෙවීමට තරම් ආදායමක් නොමැති වීම විශාල ගැටළුවකි. ග්‍රාමීය නිවාස පිළිබඳ වැඩි අවධානයක් රජය විසින් යොමු කරනු නොලැබුව ද, ග්‍රාමීය ප්‍රදේශ වල ද නිවාස ගැටළුව දක්නට ඇත. සමහර පවුල්වලට ඉඩමක් තිබුන ද

එම ඉඩම් වල අයිතිය පිළිබඳ ගැටළු, ස්ථානීය පිහිටීම, මාර්ග පහසුකම් නොමැති වීම, ගොඩනැඟිලි ද්‍රව්‍ය වල අධික මිල, ස්ථිර ආදායමක් නොමැති වීම හා ආදායම් ප්‍රමාණවත් නොවීම යනාදිය නිවසක් ඉදිකිරීමේදී ග්‍රාමීය ප්‍රදේශ වල ජනයා මුහුණ දෙන ප්‍රධාන ගැටළු වේ.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනගහනයෙන් 2% ක් පමණ වතු නිවාසවල ජීවත් වන අතර මෙය මධ්‍යම, ඌව, සබරගමුව හා දකුණු පළාත්වල බහුලව දැකිය හැකි වේ. මින් බොහෝමයක් වතු ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාව ඉතා කුඩා ප්‍රමාණයේ අඩු පහසුකම් සහිත පේළි නිවාසවල ජීවත් වීම දැකිය හැක. මෙම පවුල්වලට අනූ පවුල් එකතු වීමත් සමඟ විශාල සමාජ ගැටළු ද පැන නැගී ඇත. තවද ඉඩමක් ලබා දුන්න ද නිවසක් තනා ගැනීමට තරම් ආදායම් මට්ටමක ඔවුන් නොමැති බැවින් ඉතා අඩු පහසුකම් යටතේ ජීවිකාව පවත්වාගෙන යන බැවින් පවතින සීමිත ඉඩ පහසුකම් මනාව කළමනාකරණය කරමින් හා ජනතා අවශ්‍යතාවයන් සැළකිල්ලට ගනිමින් හැකි සෑම විටම මහල් නිවාස ඉදිකිරීම අප රජයේ අරමුණ වේ.

නව මානයන් කරා යන ගමන් මඟෙහි රජයේ ප්‍රතිපත්ති ඒ අයුරින්ම ක්‍රියාත්මක කරමින් ජනතාවට **" සුව පහසු නිවසක්, සනීපාරක්ෂක ජීවිතයක් "** ළඟා කරදීමේ අරමුණ සාක්ෂාත් කිරීමේ භාරදූර කාර්යය සඳහා මා සමඟ එක්ව සිටින අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ටී.බී.සරත් (පා .ම.)
නිවාස නියෝජ්‍ය අමාත්‍ය
නාගරික සංවර්ධන , ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ පණිවුඩය



2025 අයවැය කාරකසභා අවස්ථාවේදී, ඉදිරිපත් කිරීමට සකස් කරනු ලබන "2024 ප්‍රගති වාර්තාවට" සුභාශිංෂණ එක්කිරීමට අවස්ථාවක් සැලසීම ගැන අතිශය සතුටට පත්වෙමි. ජනතාවගේ මූලික අවශ්‍යතා සහ එදිනෙදා සේවා සපයන සහ ප්‍රධාන වගකීම් දරණ ආයතන බොහෝමයක් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය වෙත පැවරී ඇත. වර්තමානයේ පවතින නාගරීකරණ සංකීර්ණත්වය හමුවේ නාගරික ජනාවාසකරණයත් සමඟ පැනනැගී ඇති ගැටළු වලට ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නව තාක්ෂණය අනුව නව නාගරික සැලසුම් සකස් කිරීම ප්‍රධාන කර්තව්‍යක් වී ඇත.

"සුසැදි සුරැකි සොඳුරු නාගරීකරණයක්" සඳහා නාගරික බල ප්‍රදේශයන් තුළ ආර්ථික, සමාජීය, සංස්කෘතික, පාරිසරික සහ භෞතික වශයෙන් ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස් කරමින් හා එම සැලසුම් ක්‍රියාත්මක කරමින් විශේෂ සංවර්ධන වැඩසටහන් රාශියක් මෙම වර්ෂය තුළ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කර ඇත. ඒ අතුරින් සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහළ මට්ටමක මූල්‍ය ප්‍රගතියක් ළගා කරගැනීම අගය කරමි. එසේම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ජනතාවට සේවා සපයන පොදු ආයතන වල ක්‍රියාත්මක සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා ද විශාල පරිශ්‍රමයක් දරා ඇත.

අඩු හා මධ්‍යම ආදායම්ලාභීන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස ණය හා ආධාර ලබා දීම, නිවාස සංවර්ධනයට අවශ්‍ය ඉඩම් ලබාදීම තුළින් ජනතාවට ස්ථිර, සෞඛ්‍යාරක්ෂිත නිවසක් ලබාදීම යනාදි විශාල කාර්යභාරයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් කරනු ලැබේ. මෙම වර්ෂයට වෙන්වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අමතරව අභ්‍යන්තර උත්පාදන මෙන්ම සෙවණ ආධාර යටතේ ජනතාවට නිවාස ණය හා ආධාර ලබාදීම මඟින් ප්‍රතිලාභී පවුල් 3000 කට අධික ප්‍රමාණයකට නිවාස පහසුකම් ලබා දීමට හැකි වී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ වල ජීවත් වන ජනතාව වෙත පානීය ජල සම්පාදනය හා ජලාපවාහනය, සනීපාරක්ෂක කටයුතුද සපයමින් කැපවී කටයුතු කරන ආයතන වේ.

ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය නියාමන කටයුතු හා නව ශිල්පීන් පුහුණු කිරීම සඳහා පාඨමාලා ක්‍රියාත්මක කිරීම, දේශීය හා විදේශීය ශ්‍රම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම යනාදි, සුවිශාල කාර්යයභාරයක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරනු ලැබේ. ගොඩනැගිලි සැලසුම් කිරීම, ඉදිකිරීම් වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම යන කාර්යයන්හි නියැලෙන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඉදිකිරීම් ක්ෂේත්‍රයට කරන සේවය අගය කරමි. රජයේ

කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මඟින් පැස්සුම් හා වාත්තු සේවාවන් සපයමින්, යාන්ත්‍රික ඉංජිනේරුමය නව නිෂ්පාදන හඳුන්වා දෙමින්, ලබා දෙන දායකත්වය පැසසිය යුතුය.

මීට අමතරව, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම යන ආයතන වලින් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සංවර්ධනයෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් ලබා දෙන දායකත්වය ඉතා වැදගත් වේ.

කොළඹ හා නාගරික තදාසන්න ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා වැසිජලය අපවහනය, තෙත්බිම කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ නිපුනතාවයකින් හෙබි ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව 2024 වර්ෂය සඳහා අනුමත භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ඉහළ භෞතික හා මූල්‍ය ප්‍රගතියක් ළඟාකරගෙන ඇති අතර අභ්‍යන්තර ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරන ලද අක්වෙරළ වැලි ව්‍යාපෘතිය හා කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය පිළිබඳව අගය කරමි.

මෙම අමාත්‍යාංශයට මඟ පෙන්වීම හා නායකත්වය ලබා දෙන නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ගරු අමාත්‍යතුමාට, ගරු නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමාට සහ 2024 වර්ෂයේදී වෙන් වූ ප්‍රතිපාදන මත සාර්ථක ප්‍රගතියක් ළඟාකර ගැනීම පිළිබඳව අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම ආයතන වල කාර්යමණ්ඩලවලට ද මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

රංජිත් ආරියරත්න
ලේකම්
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

# පටුන


| | | |
|---|---|---|
| 01 | ආයතන පැතිකඩ | 1- 3 |
| 02 | නාගරික සංවර්ධන අධිකාරිය | 4-11 |
| 03 | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 12-19 |
| 04 | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | 20-24 |
| 05 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 25-27 |
| 06 | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව | 28-31 |
| 07 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 32-34 |
| 08 | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 35-38 |
| 09 | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | 39-41 |
| 10 | සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 42-43 |
| 11 | ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම | 44-45 |
| 12 | හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම | 46-47 |
| 13 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 48-50 |
| 14 | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව | 51-52 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 53-57 |
| 16 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 58-60 |
| 17 | කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් | 61-65 |

18 දේශීය හා විදේශීය අරමුදල් මත සිදුකරන ව්‍යාපෘති

18.1 අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 66-68

18.2 බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම, නැගෙනහිර පළාත් උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරිම සඳහා ප්‍රධාන සැලැස්ම හා හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය 69-70

18.3 කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය 71-76

18.4 නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීම සඳහා තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය 77-78

18.5 නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය 79-80

18.6 කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 81-82

18.7 වීනරජයේ ආධාරමත අඩුආදායම්ලාභී පුද්ගලයන් සඳහා නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය 83-84

19 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන් සහ ව්‍යාපෘති

19.1 ජල සම්පාදන අංශය හා ක්‍රියාත්මක ව්‍යාපෘති 85-85

19.1.1 ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) 86-87

19.1.2 ජල තාක්ෂණය සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානය(JRDC) 87-88

19.1.3 සංවර්ධන අංශය (ජල සම්පාදන) මඟින් ක්‍රියාත්මක වැඩසටහන් 88-89

19.2 අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ අංශය 90-90

19.2.1 බිම් බෙඩි නිසැක කිරීමේ ව්‍යාපෘතිය 90-92

19.3 කඳුකර දශකය - දශවිධ බහුකාර්ය සංවර්ධන වැඩසටහන 93-94

19.4 ඉන්දියානු ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 95-95

19.4.1 "මන්නාරම මඩු දේවස්ථාන පරිශ්‍රයේ සංක්‍රමණ නිවාස" ඉදිකිරීමේ ව්‍යාපෘතිය

19.4.2 පූජ්‍ය සෝභිත නාහිමිගම ආදර්ශ ගම්මානය

# 01 ආයතනික පැතිකඩ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023 ජනවාරි 19 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2315/34 හා 2023 මැයි 30 දිනැති අංක 2334/07 අතිවිශේෂ ගැසට් පත්‍රය, 2023 ජුනි 07 දිනැති අංක 23/1097/604/110 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අමාත්‍යාංශයේ විෂය පථය යටතේ දෙපාර්තමේන්තු 04ක් සහ ව්‍යවස්ථාපිත ආයතන 10ක් ඇතුළත්ව ආයතන 14ක් ලෙසට නාගරික සංවර්ධන හ නිවාස අමාත්‍යාංශය පිහිටුවන ලදී.

අනතුරුව 2024.11.18 දිනැති ප්‍රකාශිත අංක 999/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ලෙස පිහිටුවන ලද අතර වර්තමානයේ අමාත්‍යාංශයට අනුබද්ධව දෙපාර්තමේන්තු 04ක් සහ ව්‍යාවස්ථාපිත ආයතන 13ක් ඇතුළුව පවතින සමස්ථ ආයතන සංඛ්‍යාව 17ක් වේ.

2024.11.28 දිනැතිව ප්‍රකාශයට පත්කරන ලද 2024 අංක 999/10 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව නිවාස විෂය භාරව නියෝජ්‍ය අමාත්‍යවරයකු පත් කරන ලදී.

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ස්ථාපනය කරන ලද්දේ එම විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සඳහාය.

රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන, ඉදිකිරීම්, ජල සැපයුම් හා නිවාස යන විෂයන්ට අදාලව අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය වේ.

### දැක්ම

"ලස්සන නගරයක් සහ සුවපහසු ජීවිතයක්"

### මෙහෙවර

නාගරික සංවර්ධනය ක්‍රමවත් කිරීම, නිවාස සහ යටිතල පහසුකම් ලබාදීම, භෞතික සැලසුම්කරණය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවේශය තහවුරු කිරීම, ගංවතුර පාලනය සහ තෙත් බිම් කළමනාකරණය, ඉඩම් සංවර්ධනය සහ සභාධිපත්‍ය කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට ලස්සන නගර සහ සුවපහසු ජීවිත සඳහා ප්‍රවේශය සැලසීම.

### කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන, ඉදිකිරීම්, ජල සැපයුම් හා නිවාස සහ විෂයන්ට අදාළව අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්ට පැවරී ඇති විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
3. නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යයභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. මහනගර, උප නගර හා තදාසන්න නගර සැළසුම්කරණය හා සංවර්ධනය.
5. නාගරික ප්‍රදේශයන් තුළ දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශය උනන්දු කරවීම හා මෙම ප්‍රයත්නය සඳහා සුදුසු ඉඩම් ලබාදීම.

6. නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය හා වගකීම් රහිත කසල බැහැර කිරීම් වැළැක්වීමට පියවර ගැනීම.
7. ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලසුම් පිළියෙල කිරීම.
8. සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු.
9. නාගරික ප්‍රදේශ වල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම.
10. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම.
11. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කාණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූලාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. රජයේ ආයතන වලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.
13. අදාළ නීති රීති හා ප්‍රමිතීන් වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍ර කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.
14. ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම.
15. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබා දීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම.
16. ජල සම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව නව සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව.

## අමාත්‍යාංශයට අනුබද්ධ ව්‍යවස්ථාපිත ආයතන, ව්‍යාපෘති හා වැඩසටහන්

**දෙපාර්තමේන්තු**

1. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
3. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව
4. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

**ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා**

1. නාගරික සංවර්ධන අධිකාරිය
2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
3. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම
4. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
5. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
6. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
7. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
8. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
9. ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
10. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
11. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
12. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව
13. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්

**ව්‍යාපෘති හා වැඩසටහන්**

1. අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය
2. බස්නාහිර ප්‍රදේශ මහා නගර ප්‍රධාන සැලැස්ම, නැගෙනහිර පළාත් උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්ම හා හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය
3. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය
4. චීන රජයේ ආධාර මත අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය
5. කොළඹ අග නගර ආශ්‍රිත සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
6. නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීම සඳහා තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
7. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය
8. නැවත පදිංචි කිරීමේ අංශය සහ බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය

# 02 නාගරික සංවර්ධන අධිකාරිය

## 2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම්කරණය හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම ආයතනය නාගරික සංවර්ධන අධිකාරිය වන අතර එය රටේ නාගරික පරිසරවල තත්ත්වය කළමනාකරණය කිරීමේ වගකීම ද දරයි.

නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශවල ආර්ථික, සමාජීය හා භෞතික සංවර්ධනය උදෙසා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 1978 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මඟින් නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී. මූල්‍යාමය වශයෙන් ස්වාධීන හා ගෝලීය වශයෙන්, ඉහළ පිළිගැනීමක් සහිත නිර්මාණකරුවෙකු ලෙස අංග සම්පූර්ණ හා තිරසර නාගරික මධ්‍යස්ථාන ගොඩනැඟීම පිණිස සංවර්ධන සැලසුම් සකස් කිරීම, ප්‍රවර්ධනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමුඛ අරමුණු වේ.

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ අනුබද්ධිත සමාගම් තුනක් සහ ආශ්‍රිත සමාගම් දෙකක් පවතී.

**නාගරික සංවර්ධන අධිකාරියේ අනුබද්ධිත සමාගම්**

- **නාගරික ආයෝජන සහ සංවර්ධන පුද්ගලික සමාගම (UNIDEP)**

නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ණ හිමිකාරීත්වයක් ඇති අනුබද්ධිත ආයතනයක් ලෙස මෙම සමාගම 2006 අගෝස්තු මාසයේ දී ස්ථාපිත කරන ලදී. මෙම සමාගම පිහිටුවීමේ අරමුණ වන්නේ අධිකාරිය විසින් සෘජුවම සිදු කරනු ලබන නාගරික ප්‍රදේශවල ඕනෑම ආකාරයක සංවර්ධන ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම, ගොඩනැඟීම සහ ක්‍රියාත්මක කිරීමයි. වර්තමානයේ දී අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ සංවිධාන කිහිපයකට පහසුකම් සපයන සෙත්සිරිපාය II වන අදියර ගොඩනැගිල්ල සහ ඒ අවට ප්‍රදේශය මෙහෙයවීම සහ කළමනාකරණය පිළිබඳ වගකීම මෙම ආයතනය විසින් දරනු ලබයි. කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයෙන් දේපළ කළමනාකරණය කිරීම සඳහා ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන වෙනම ස්වාධීන ආයතනයක් ලෙස මෙම සමාගම ක්‍රියාත්මක වේ.

- **වෝටර්ස් එජ් පෞද්ගලික සමාගම**

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති දේපළ කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අධිකාරියේ පූර්ණ හිමිකාරීත්වයක් ඇති අනුබද්ධිත ආයතනයක් ලෙස වෝටර්ස් එජ් පෞද්ගලික සමාගම 2009 පෙබරවාරි මාසයේ දී සංස්ථාගත කරන ලදී. වර්තමානයේ දී මෙම සමාගම යටතේ හෝටලයක්, ආපන ශාලාවක් සහ විවේකය සහ විනෝදාශ්වාද පහසුකම් පවතී. එය තනිවම තම ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ ක්‍රියාවලියක නොයෙදෙන අතර රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් සමඟ සහයෝගයෙන් සිය ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

- **ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ්**

නාගරික සංවර්ධන අධිකාරියේ රෙස්ට් හවුස් ලිමිටඩ් 2006 ජුනි මාසයේ දී පිහිටුවන ලද අතර, පසුව 2010 නොවැම්බර් මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් මඟින් එහි නම "ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ්" ලෙස සංශෝධනය කරන ලදී. මෙම සමාගමේ ප්‍රධාන අරමුණ වන්නේ ආරක්ෂිත සහ සුවපහසු නවාතැන්, විශේෂයෙන් රජයේ සේවකයන්ට සහ සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිල ගණන්වලට ලබාදීමයි. ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් දිවයින පුරා උපාය මාර්ගික ස්ථානවල තානායම් 31ක් ස්ථානගත කර පාලනය කරයි. එම තානායම් අතරින් 29ක් ටෙන්ඩර් මඟින් තෝරා ගෙන ඇති තුන්වන පාර්ශවයන් විසින් පාලනය කරනු ලබයි. ඉතිරි තානායම් දෙක වන මහියංගන සහ බදුල්ල තානායම් ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් මඟින් සෘජුවම පාලනය කරනු ලැබේ.

**නාගරික සංවර්ධන අධිකාරියේ ආශ්‍රිත සමාගම්**

- **ඕෂන් වීව් සංවර්ධන පෞද්ගලික සමාගම** (Ocean View Development Company Pvt Ltd)

ඕෂන් වීව් සංවර්ධන පෞද්ගලික සමාගම ස්ථාපිත කරන ලද්දේ 1980 දශකයේදීය. මෙම ගොඩනැගිල්ලේ නිවාස ඒකක 44ක් සහ උඩුමහලේ සම්ප්‍රේෂණ කුළුණු 15ක් ඇත. මෙය 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත. පසුව එම සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. මෙම සමාගමේ කොටස් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරියට ඒකාබද්ධව අයත් වේ. නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් සංයුතිය සමාගමෙන් 43.39% කි.

- **ඔනලි හෝල්ඩින්ස් පෞද්ගලික සමාගම**

මෙම සමාගම ශ්‍රී ලංකාව පාදක කරගත් නිශ්චල දේපළ ආයෝජනයේ සහ දේපළ සංවර්ධනයේ නියැලී සිටින සමාගමක් වන අතර ආයෝජන දේපළ කුලියට දීම මගින් ක්‍රියාත්මක වේ. කොළඹ පිහිටි යුනිටි ප්ලාසා ගොඩනැගිල්ල මෙම සමාගමේ ආයෝජන දේපළකි. යුනිටි ප්ලාසා ගොඩනැගිල්ලේ කුලියට දිය හැකි ඉඩ ප්‍රමාණය (ලංකා බැංකු පරිශ්‍රය හැර) වර්ග අඩි 76,955ක් පමණ වේ. එය 1982 දී ආරම්භ කර එහි ප්‍රධාන කාර්යාලය කොළඹ පවත්වාගෙන යනු ලබයි. නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් සංයුතිය සමාගමේ 44.801% කි.

**දැක්ම**

සුසැදි, සුරැකි, සොඳුරු නාගරීකරණයක් කරා ...

**මෙහෙවර**

නාගරික සංවර්ධන බල ප්‍රදේශයන් සඳහා ආර්ථික, සමාජීය, පාරිසරික සහ භෞතික වශයෙන් ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

## 2.2 බලතල, කාර්යයන් හා කර්තව්‍යයන්

- ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශ තුළ ඒකාබද්ධ සැලසුම්කරණය සහ භෞතික සංවර්ධනය සිදු කිරීම, සංවර්ධන ක්‍රියාකාරකම් සහ සේවා සම්බන්ධ වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.
- අත්හැර දමා ඇති සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම.
- ප්‍රාග්ධන ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- පාරිසරික ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ පාරිසරික වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම
- නාගරික ප්‍රදේශ සංවර්ධනයට අදාළව ගොඩනැගිලි, ඉංජිනේරු සහ උපදේශන මෙහෙයුම් සිදු කිරීම.
- සංවර්ධන සැලසුම්වලට අනුකූලව ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- නිමකර නොමැති අනුමත සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම.
- රටේ නාගරික සංවර්ධනය සඳහා නිශ්චල හෝ චංචල දේපළ අත්පත් කර ගැනීම සහ බැහැර කිරීම.
- නිවාස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රකාශිත නාගරික ප්‍රදේශ තුළ අඩු ආදායම්ලාභී ජනාවාස ඉවත් කිරීම සහ එකී මුදාගත් ඉඩම් සංවර්ධනය කිරීම.
- රාජ්‍ය ආයතන සහ රජය නියෝජනය කරන ආයතන සඳහා සංවර්ධන සැලසුම් යෝජනා සහ ව්‍යාපෘති සකස් කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.
- අනෙකුත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතා සඳහා තාක්ෂණික සැලසුම් සේවාව සැපයීම.
- අධිකාරිය විසින් සපයනු ලබන යම් ගොඩනැගිල්ලක් සඳහා හෝ යම් සේවා සඳහා කුලී හෝ යම් ගාස්තු අය කිරීම.

## 2.3 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

➢ **"සියක් නගර" නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන**

| # | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි.) | ප්‍රතිපාදන - 2024 (රු.මි.) | 2024.12.31 දින දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
| 1 | නුවරඑළිය නානු ඔය ආශ්‍රිත පාරිසරික කොරිඩෝව සංවර්ධනය කිරීම | 127.70 | 5.00 | 776.68 | 100 |
| 2 | නින්දවූර් වෙරළ උද්‍යානය ඉදිකිරීම (අදියර I) | 26.60 | 26.60 | | 100 |
| 3 | මුලතිව් බස් නැවතුම්පොළ ඉදිකිරීම (අදියර II) | 128.30 | 60.00 | | 100 |
| 4 | විශ්වමඩු භාරතී මහා විද්‍යාලයේ යෝජිත පංති කාමර ගොඩනැගිල්ල | 21.28 | 2.00 | | 100 |
| 5 | කිළිනොච්චි කන්දවාලි මහා විද්‍යාලයේ යෝජිත පන්ති කාමර සහ පුස්තකාල ගොඩනැගිල්ල | 20.89 | 1.00 | | 100 |
| 6 | අලව්ව මහජන පොළ සංවර්ධනය (අදියර II) | 53.60 | 50.00 | | 100 |
| 7 | කුරුණෑගල රජපිහිල්ල නාගරික උද්‍යානය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | 204.21 | 10.00 | | 100 |
| 8 | වරකාපොල බස් නැවතුම්පොළ (අදියර II) | 50.00 | 40.00 | | 100 |
| 9 | හෝඑවාගොඩ පාරිසරික කෘෂි උද්‍යානය (අදියර I සහ II) | 450.56 | 22.00 | | 100 |
| 10 | අවිස්සාවේල්ල පොදු වෙළඳපොළ සංවර්ධනය | 167.60 | 30.00 | | 100 |
| 11 | ගම්පහ පොදු වෙළඳපොළ සංවර්ධනය (අදියර II) | 598.50 | 141.40 | | 68 |
| 12 | මිනුවන්ගොඩ පොදු වෙළඳපොළ (අදියර III) | 50.00 | 30.00 | | 100 |
| 13 | පානදුර වෙළඳපොළ සහ බහුකාර්යය ගොඩනැගිල්ල සංවර්ධනය | 539.20 | 140.00 | | 78 |
| 14 | යෝජිත හොරණ පොළ සැලසුම් කිරීම සහ ඉදිකිරීම (අදියර IV) | 20.00 | 12.00 | | 100 |
| 15 | උපදේශන සේවා සඳහා | - | 30.00 | | - |
| | **එකතුව** | **2,458.44** | **600.00** | **776.68** | |

- **රාජ්‍ය අරමුදල් යොදවා රාජ්‍ය ආයතන හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති**

| # | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි.) | ප්‍රතිපාදන - 2024 (රු.මි.) | 2024.12.31 දින දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
| 1 | අම්පාර සති පොළ සංවර්ධනය | 294.33 | 55.50 | 512.00 | 52 |
| 2 | කෑගල්ල බස් නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීම | 444.00 | 222.90 | | 97 |
| 3 | මාලිබොඩ වතුයායේ නිවාස ව්‍යාපෘතිය | 83.60 | 15.50 | | 35 |
| 4 | බද්දෙගම යෝජිත පදික මංතීරුව සංවර්ධනය | 10.00 | 10.00 | | - |
| 5 | ගාල්ල - කරාපිටිය කඩකාමර ඉදිකිරීම | 29.73 | 2.10 | | 100 |
| 6 | අලව්ව යෝජිත රථවාහන නැවතුම්පොළ සහ පදික පහසුකම් සංවර්ධනය කිරීම (අදියර II) | 78.00 | 74.00 | | 95 |
| 7 | උපදේශන සේවා සඳහා | - | 20.00 | | - |
| | **එකතුව** | **939.66** | **400.00** | **512.00** | |

- **යාපනය නගර ශාලාව ප්‍රතිස්ථාපනය කිරීම**

| # | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි.) | ප්‍රතිපාදන - 2024 (රු.මි.) | 2024.12.31 දින දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
| 1 | යාපනය නගර ශාලාව ප්‍රතිස්ථාපනය කිරීම | 2,568.47 | 380.00 | 183.49 | 85 |
| 2 | උපදේශන සේවා සඳහා | - | 20.00 | - | - |
| | **එකතුව** | **2,568.47** | **400.00** | **183.49** | |

- **හෝමාගම කලාපයේ මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (තාක්ෂණ නගරය)**

| # | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි.) | ප්‍රතිපාදන - 2024 (රු.මි.) | 2024.12.31 දින දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
| 1 | හෝමාගම කලාපයේ මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (තාක්ෂණ නගරය) | 942.00 | 480.00 | 349.52 | 98 |
| 2 | උපදේශන සේවා සඳහා | - | 20.00 | | - |
| | **එකතුව** | **942.00** | **500.00** | **349.52** | |

➢ **මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය**

මධ්‍යම ආදායම්ලාභීන්ට සුදුසු නිවාස ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ එවැනි ව්‍යාපෘති කළමනාකරණය කිරීම වැනි කාර්යයන් මෙම අංශය මගින් ඉටුකරනු ලබයි. මෙම ව්‍යාපෘති වාණිජ පරමාර්ථයන් මූලික කරගෙන සිදු කෙරේ.

| # | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මිලි.) | ප්‍රතිලාභීන් | ප්‍රතිපාදන - 2024 | 2024.12.31 දක්වා සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. | 2024.12.31 දක්වා සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | වියත්පුර නිවාස ව්‍යාපෘතිය | 6,444.50 | 500 | 413.36 | 6,072.81 | 98 |
| 2 | ග්‍රීන් ආකේඩ් නිවාස ව්‍යාපෘතිය | 4,858.69 | 300 | 791.79 | 1,575.30 | 80 |
| 3 | එළියට් රෙසිඩන්සීස් | 17,655.00 | 400 | 1,842.44 | 1,668.67 | 33 |
| 4 | මාලබේ | 4,809.48 | 256 | 1,170.00 | 1,795.99 | 55 |
| 5 | මාකුඹුර | 6,728.00 | 314 | 1,494.03 | 1,970.40 | 49 |
| 6 | බොරලැස්ගමුව | 3,225.22 | 120 | 835.72 | 405.99 | 18 |
| 7 | ඔරුගොඩවත්ත 1* | 9,428.84 | 440 | - | 1,887.70 | 22 |
| 8 | ඔරුගොඩවත්ත 2* | 9,213.01 | 432 | - | 1,603.20 | 20 |
| 9 | ස්ටේඩියම්ගම * | 4,920.49 | 210 | - | 825.00 | 23 |
| 10 | පැලියගොඩ 01* | 3,889.25 | 168 | - | 932.00 | 21 |
| 11 | පැලියගොඩ 02* | 8,957.06 | 384 | - | 1,628.00 | 18 |
| 12 | අනුරාධපුර* | 2,648.36 | 135 | - | 825.00 | 38 |

* තාවකාලිකව නවතා ඇත.

## 2.4 සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ප්‍රගතිය - 2024

| # | සංවර්ධන සැලැස්ම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 1 | මොණරාගල නගර සංවර්ධන සැලැස්ම | 100% |
| 2 | හැටන් නගර සංවර්ධන සැලැස්ම | |
| 3 | කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම | ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති අතර මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. (96%) |
| 4 | පොල්ගහවෙල නගර සංවර්ධන සැලැස්ම | |
| 5 | ගම්පහ නගර සංවර්ධන සැලැස්ම | |
| 6 | අම්පාර නගර සංවර්ධන සැලැස්ම | |
| 7 | කුණ්ඩසාලේ නගර සංවර්ධන සැලැස්ම | |
| 8 | නාවලපිටිය නගර සංවර්ධන සැලැස්ම | |
| 9 | බද්දේගම නගර සංවර්ධන සැලැස්ම | |
| 10 | හොරණ නගර සංවර්ධන සැලැස්ම | |
| 11 | මහ මාතර නගර සංවර්ධන සැලැස්ම | ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. (92%) |
| 12 | පානදුර නගර සංවර්ධන සැලැස්ම | |
| 13 | කටාන නගර සංවර්ධන සැලැස්ම | |
| 14 | එරාවූර් නගර සංවර්ධන සැලැස්ම | |
| 15 | ගම්පොල නගර සංවර්ධන සැලැස්ම | |
| 16 | සීතාවක නගර සංවර්ධන සැලැස්ම | |
| 17 | මඩකලපුව නගර සංවර්ධන සැලැස්ම | |
| 18 | හික්කඩුව නගර සංවර්ධන සැලැස්ම | |
| 19 | පුත්තලම නගර සංවර්ධන සැලැස්ම | මෙම අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 20 | කෑගල්ල නගර සංවර්ධන සැලැස්ම | |
| 21 | කොටිකාවත්ත - මුල්ලේරියාව නගර සංවර්ධන සැලැස්ම | ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |
| 22 | මහ යාපනය නගර සංවර්ධන සැලැස්ම | |

- 2024 වර්ෂයේ සංවර්ධන සැලසුම් 22ක් ප්‍රකාශයට පත්කිරීමට ඉලක්ක කොට තිබේ.
- තුන්වන කාර්තුව වන විට සංවර්ධන සැලසුම් 10ක් ප්‍රකාශයට පත් කර ඇත.

## 2.5 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ලබාගත් ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

### 2.5.1 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග

- **සංවර්ධන ව්‍යාපෘති**
  මහා භාණ්ඩාගාර අරමුදල් ඉලක්ක කළ පරිදි නොලැබීම හේතුවෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය ළඟා කර ගත නොහැකි විය.

- **යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය**
  2019.10.10 ආරම්භ වූ යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඒ ඒ වර්ෂයන් තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබීම හා ප්‍රතිපාදන වෙන් කිරීම වසර 04ක් තුළ බෙදී යන පරිදි අනුමත වී තිබූ නමුත්, ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වසර 02ක් තුළ නිම කරන ලෙස පවරා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය කිහිප වරක් දීර්ඝ කිරීමට සිදුවීම.

- **මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය**
  ඉහත ව්‍යාපෘති කිහිපයක්ම රජයේ අයවැය යෝජනාවන්ට අනුගත වෙමින් දැරිය හැකි මිලට නිවාස ව්‍යාපෘති ලෙස ආරම්භ කළ ද (නිවාස ඒකක 2,483) පසුගිය සමයේ ඇති වූ දැඩි ආර්ථික අර්බුදය හමුවේ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම හේතුවෙන් හා අලෙවිකරණ ගැටළු හේතුවෙන් මෙන්ම අඩු පොලී බැංකු ණය සහන යෝජනා ක්‍රමය රාජ්‍ය බැංකු මඟින් නතර කිරීම නිසා ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීමට සිදු විය. මේ වන විට එම ව්‍යාපෘති නැවත මධ්‍යම ආදායම් ව්‍යාපෘති ලෙස පරිවර්තනය කොට නිවාස අලෙවියෙන් ලැබෙන ආදායම් මඟින් ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන යාමට පියවර ගනිමින් ඇති අතර රාජ්‍ය හා පෞද්ගලික මැදිහත්වීමේ ක්‍රමවේදයන් යටතේ ඇතැම් ව්‍යාපෘති ආරම්භ කිරීමට අධ්‍යයනය කරමින් පවතී.

- **සංවර්ධන සැලසුම් ප්‍රකාශයට පත් කිරීම**
  හිගුරක්ගොඩ, සීතාවක, මාවනැල්ල, කොටිකාවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල සංවර්ධන සැලසුම් ප්‍රකාශයට පත්කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතන මඟින් එකඟතාවය නොලැබීම හේතුවෙන් අපේක්ෂිත දිනට ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වී ඇත.




මුලතිව් බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (අදියර II)




**අලව්ව යෝජිත වාහන නැවතුම්පොළ සහ පදික පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර II)**

## 2.6 ක්‍රියාකාරී සැලැස්ම - 2025

| # | ව්‍යාපෘතිය/ වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මිලි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය (%) |
|---|---|---|---|---|
| 1 | යාපනය නගර ශාලාව ඉදිකිරීම (අදියර II) | 400.00 | මහා භාණ්ඩාගාර අරමුදල් | 100 |
| 2 | මුලතිව් බස් නැවතුම්පොළ සංවර්ධනය (අදියර III) | 70.00 | | 100 |
| 3 | වලපනේ යෝජිත සති පොළ සහ බහුකාර්යය ගොඩනැගිල්ල (අදියර III) | 145.00 | | 100 |
| 4 | මලව වැව, කැකිරාව භූමි අලංකරණ ව්‍යාපෘතිය (අදියර II) | 26.00 | | 100 |
| 5 | හබරණ, අනුරාධපුරයේ සනීපාරක්ෂක පහසුකම් සහ භූ දර්ශන වැඩිදියුණු කිරීම (අදියර II) | 27.00 | | 100 |
| 6 | පොළොන්නරුව නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීම (අදියර II) | 788.50 | | 100 |
| 7 | ග්‍රෙගරි වැව, නුවරඑළිය යෝජිත රථගාල | 70.00 | | 100 |
| 8 | අලව්ව පදික කොටස (අදියර III) | 50.00 | | 100 |
| 9 | තලාතුඔය රථගාල සංවර්ධන (අදියර II) | 27.00 | | 100 |
| 10 | දවුලගල සති පොළ සහ රථගාල සංවර්ධන (අදියර II) | 32.00 | | 100 |
| 11 | කුරුණෑගල යෝජිත කාර්යාල ගොඩනැගිල්ල | 150.00 | | 70 |
| 12 | කුඹුක්කුලම ආරක්ෂක වැට සහ වහල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 10.00 | | 100 |
| 13 | නුවරඑළියේ නානුඔය ඔස්සේ යෝජිත පදික සක්මන් මළුව | 3.20 | | 100 |
| 14 | මුලතිව් බස් නැවතුම්පොළ සංවර්ධනය (අදියර II) – අවසන් බිල්පත් පියවීම | 25.00 | | 100 |
| 15 | ගම්පහ පොදු වෙළඳපොළ සංවර්ධනය (අදියර II) | 355.35 | | 100 |
| 16 | පානදුර වෙළඳපොළ සහ බහුකාර්යය ගොඩනැගිල්ල සංවර්ධනය | 150.00 | | 100 |
| 17 | දෙයියන්දර බස් නැවතුම්පොළ සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම (අදියර I) | 11.00 | මහා භාණ්ඩාගාර අරමුදල | 100 |
| 18 | බද්දේගම බස් නැවතුම්පොළ සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I) | 0.35 | | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | කුරුණෑගල රජපිහිල්ල නාගරික උද්‍යානය යෝජිත සංවර්ධනය - අවසන් බිල්පත් පියවීම | 6.80 | | 100 |
| 20 | කෑගල්ල බස් ඩිපෝව ප්‍රතිස්ථාපනය කිරීම (බස් ඩිපෝවේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ අනෙකුත් ශේෂ කටයුතු (අදියර III ) | 5.00 | | 100 |
| 21 | අලව්ව යෝජිත වාහන නැවැත්වීමේ සහ පදික පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර II) - අවසන් බිල්පත් පියවීම | 5.00 | | 100 |
| 22 | අම්පාර පොළ ඉදිකිරීම (අදියර II) | 5.00 | | 100 |
| 23 | තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය - බිල්පත් පියවීම සහ වන්දි | 500.00 | | 98 |
| | **එකතුව** | **2,862.20** | | |

**මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය**

| ප්‍රධාන විෂය ක්ෂෙත්‍රය | ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | ප්‍රභවය | භෞතික ඉලක්කය (%) |
|---|---|---|---|---|
| මධ්‍යම ආදායම් නිවාස | වියත්පුර | 405.40 | පෙර විකුණුම් / නා.සං.අධි. | 100 |
| මධ්‍යම ආදායම් නිවාස | ග්‍රීන් ආකේඩ් | 1177.16 | | 100 |
| මධ්‍යම ආදායම් නිවාස | එළියට් රෙසිඩන්සීස් | 6552.80 | | 58 |
| මධ්‍යම ආදායම් නිවාස | මාලබේ | 2113.77 | | 62 |
| මධ්‍යම ආදායම් නිවාස | මාකුඹුර | 1742.96 | | 52 |
| මධ්‍යම ආදායම් නිවාස | බොරලැස්ගමුව | 1711.46 | | 30 |
| මධ්‍යම ආදායම් නිවාස | ඔරුගොඩවත්ත 1 | 13.91 | නා.සං.අධි. | 30 |
| මධ්‍යම ආදායම් නිවාස | ඔරුගොඩවත්ත 2 | 67.00 | | 30 |
| මධ්‍යම ආදායම් නිවාස | ස්ටේඩියම්ගම | 67.00 | | 30 |
| මධ්‍යම ආදායම් නිවාස | පැලියගොඩ 01 | 18.70 | | 30 |
| මධ්‍යම ආදායම් නිවාස | පැලියගොඩ 02 | 35.00 | | 30 |
| මධ්‍යම ආදායම් නිවාස | අනුරාධපුර | 32.00 | | 50 |

**නගර සංවර්ධන සැලසුම් සකස් කිරීම**

- 2025 වර්ෂය සඳහා නගර සංවර්ධන සැලසුම් 28ක් ප්‍රකාශයට පත්කිරීමට ඉලක්ක කොට තිබේ.

# 03 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

## 3.1 හැඳින්වීම

“1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979.04.01 දින ස්ථාපිත කර ඇති අතර පහත සංශෝධන පනත් මඟින් සංශෝධනයන් සිදුකර ඇත.

- 1982 අංක 05
- 1988 අංක 20
- 1999 අංක 30
- 2002 අංක 23
- 2003 අංක 32
- 2008 අංක 37 විශේෂ විධිවිධාන පනත

### අධ්‍යක්ෂ මණ්ඩලය

- විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 06 දෙනෙකු හා මුදල් අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන එක් (01) නියෝජිතයෙකු සමඟ සමස්ත සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විතය.

### ආයතනික ව්‍යූහය

සාමාන්‍යාධිකාරි ප්‍රධාන විධායක නිළධාරි වන අතර, කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශ 07 ක්, සහකාර සාමාන්‍යාධිකාරි කොට්ඨාශ 01ක් හා ප්‍රධාන අභ්‍යන්තර විගණක කොට්ඨාශයකින්, සහ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල 25ක්, නගර කාර්යාල 03ක් හා කලාප/ උප කාර්යාල 08කින් සමන්විත වේ.

### දැක්ම

“ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුවපහසු - සෞඛ්‍යාරක්ෂිත නිවසක්"

### මෙහෙවර

පවත්නා සීමිත සම්පත් ඵලදායී කළමණාකරණය තුළින්, නිවසක් ඇවැසි සෑම පවුලකටම සෞඛ්‍යාරක්ෂිත, ස්ථිර නිවසක ජීවත්වීම තහවුරු කිරීම සඳහා මැදිහත්වීම.

## 3.2 කාර්යයන්

- මහල් නිවාස, නිවාස හෝ වෙනත් වාසස්ථාන / ගොඩනැගිලි ඉදිකිරීම.
- නිවාස හිඟය අඩුකිරීමට නිවාස සංවර්ධන යෝජනා සැකසීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනයට අනුබල දීම.
- ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනය සඳහා ඉඩම් ලබාදී අරමුණු සාක්ෂාත් කර ගැනීමට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයට අදාළ වන ක්‍රියාකාරකම්වල නිරතවීම, ඒවාට අනුබලදීම හා ඒ සම්බන්ධීකරණය කිරීම.
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ නිරත විය වියහැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## 3.3 2024 වැඩසටහන

“සැමට නිවහන“ තේමාව යටතේ  නිවාස ණය වැඩසටහන්, ආධාර වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා භාණ්ඩාගාර, අභ්‍යන්තර අයකිරීම් හා සෙවණ අරමුදල මඟින් අරමුදල් සම්පාදනය කර ගනු ලැබේ.  ඉන්දියානු රජයේ විශේෂ ආධාර ප්‍රතිපාදන යටතේ ආධාර වැඩසටහනක් ද ක්‍රියාත්මක වේ.

එසේම මධ්‍ය ආදායම් ලාභීන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාත්මන වන අතර, නිවාස ආශ්‍රිත සහාය සේවා සැපයීම යටතේ  ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති වල ජීවත්වන ජනතාවගේ සුරක්ෂාව වෙනුවෙන් මේ වන විට කළ යුතු අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සිදුකිරීම වෙනුවෙන් “පැරණි නිවාස ක්‍රම නවීකරණය“ , ඉඩම් කට්ටි ලබාදීම, නිවසක හිමිකම සාක්ෂාත් කර දීම සඳහා හිමිකම් ඔප්පු ලබාදීම ද සිදුකරනු ලබයි.  මෙයට අමතරව ආයතනය මඟින් ප්‍රතිලාභීන් වෙත ලබා දුන් ණය නැවත අයකරගැනීම සඳහා අයකිරීම් වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි.  අයකිරීම් මඟින් උපයාගනු ලබන අරමුදල් ආයතනයේ පුනරාවර්තන වියදම් පියවා ගැනීම හා නව ණය ලබාදීම සඳහා ආයෝජනය කරනු ලබයි.

## 3.4 නිවාස වැඩසටහනේ ප්‍රගතිය (2024.12.31 දිනට)

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්ත. පිරි. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2024 (රු මි) | මූල්‍ය ප්‍රගතිය | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. මි | % | |
| | <u>**නිවාස වැඩසටහන්**</u> | | | | | | |
| | <u>***භාණ්ඩාගාර අරමුදල්***</u> | | | | | | |
| 01 | **සැමට නිවහන් - ණය** | 2000.0 | 2000 | 2000.0 | 2041.1 | 102% | 140% |
| | <u>***සෙවණ අරමුදල***</u> | | | | | | |
| 02 | **සෙවණ ආධාර** | | | | | | |
| | නව වැඩසටහන | 213.5 | 350 | 213.5 | 24.95 | 11% | 12% |
| | අවිච්ඡේද<br>(සීමා කිරීම් 14) | 12.4 | 90 | 12.4 | 12.40 | 100% | 100% |
| | <u>***අභ්‍යන්තර උත්පාදන අරමුදල්***</u> | | | | | | |
| 03 | **අඩු හා පහළ මධ්‍ය ආදායම් නිවාස** | | | | | | |
| | සැමට නිවහන් - ණය | 1000.0 | 1500 | 1000.0 | 1066.300 | 106% | 100% |
| | සේවාඅභිමානි - ණය | 500.0 | 500 | 500.0 | 350.270 | 71% | 92% |
| | <u>***ඉන්දියන් අරමුදල්***</u> | | | | | | |
| 04 | **1. ග්‍රාමශක්ති ආධාර** | | | | | | |
| | දිවයින පුරා 2017 | 4.40 | 114 | 4.40 | 1.355 | 30% | 89% |
| | දකුණු පළාත් 2017 | 90.2 | 482 | 90.2 | 3.835 | 04% | 75% |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්ත. පිරි. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2024 (රු මි) | මූල්‍ය ප්‍රගතිය | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. මි | % | |
| | උතුරු පළාත් 2019 | 124.8 | 475 | 124.8 | 7.40 | 06% | 45% |
| | දකුණු පළාත් 2019 | 174.3 | 100 | 174.3 | 9.95 | 06% | 48% |
| | **ඉන්දියන් ග්‍රාමශක්ති ආධාර** *(අවිච්ඡේද වැසටහන) භාණ්ඩාගාර* | 1200.0 | - | 41.1 | - | - | - |
| | **2. ග්‍රාමීය හා වතු** | 2926.0 | 1045 | - | - | - | - |
| | **නිවාස ආශ්‍රිත සහාය සේවා** | | | | | | |
| 06 | පැරණි නිවාස ක්‍රම නවීකරණය (පොම්පාගාර අලුත්වැඩියා) | 20.0 | - | 20.0 | 20.000 | 100% | - |
| 07 | ඉඩම් වන්දි (ඉඩම් 07) | 10.0 | - | 10.0 | 10.000 | 100% | - |
| 08 | මධ්‍ය පාන්තික නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය | 10.0 | - | - | - | - | - |
| 09 | ඔප්පු නිකුත් කිරීම | -- | 2000 | -- | -- | -- | 70% |
| 10 | **මධ්‍යම පාන්තික නිවාස (පෙර විකුණුම්)** | | | | | | |
| | සොයිසාපුර | 201.0 | 30 | | 169.525 | 84% | 100% |
| | තංගල්ල | 103.0 | 30 | | 100.413 | 97% | 100% |
| | රණ්පොකුණුගම (A&B ගොඩනැගිලි පමණි) | 259.0 | 72 | | 96.735 | 37% | 20% |
| 11 | **මධ්‍යම පාන්තික නිවාස (රාජ්‍ය / පෞද්ගලික සහභාගීත්ව)** | | | | | | |
| | මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය | USD 56,143,400 | 560 | | | | |
| | සියනෑ නේචර් පාර්ක් | 230.0 | 43 | | | | 100% |
| | රීජන්සි පාර්ක් | 240.0 | 21 | | | | 96% |
| | වාද්දුව, සී බ්‍රීස් | | 196 | | | | 66% |
| | ලාවන්‍යා හයිට් - රාගම | | 124 | | | | 55% |

## 3.5 මූල්‍ය ප්‍රගතිය හා අයකිරීම්







**ණය/ කුලී අයකිරීම් හා දේපල ආදායම**

- වාර්ෂික ඉලක්කය - රු.මි. 4,801.996
- ප්‍රගතිය 2024.12.31 දිනට - රු.මි. 3,717.459 (77%)




**දේපල බැහැර කිරීම, දේපල බදු දීම හා ඉඩම් පවරා ගැනීම (2024.12.31 දිනට)**

| දේපල බැහැර කිරීම | |
|---|---|
| හිස් ඉඩම් කැබලි | 93 |
| යාබද ඉඩම් කැබලි | 7 |
| අනවසර ඉඩම් කැබලි | 11 |
| නිවාස විකුණුම් (පැරණි ව්‍යාපෘති) | 3 |
| නව නිවාස විකුණුම් (සොයිසාපුර) | 18 |

| දේපල බදු දීම | |
|---|---|
| කඩසාප්පු | 6 |
| ගොඩනැඟිලි | 7 |
| ඉඩම් | 19 |
| **ඉඩම් පවරා ගැනීම** | |
| 2024 වර්ෂයේදී අධිකාරිය වෙත පවරා ගෙන ඇති ඉඩම් | 4 |

## 3.6 2024 වර්ෂයේ ලබා ගත් ජයග්‍රහණ

- 2023.10.17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග සියල්ලටම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
- 2015 – 2019 "සැමට සෙවණ" අවිච්ඡේද වැඩසටහන නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉදිරි වසර 03 තුළදී වෙන් කර දීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.
- 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර වෙන් වූ රාජ්‍ය භාණ්ඩාගාර අරමුදල් හා අභ්‍යන්තර අරමුදල් සම්පූර්ණයෙන්ම සැලසුම් කළ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන ලදි.
- අභ්‍යන්තර අරමුදලින් සියලුම පුනරාවර්තන වියදම් දැරීමෙන් අනතුරුව සංවර්ධන වැඩසටහන් සඳහා රු.මි.1528ක් ආයෝජනය කිරීමට හැකිවිය.
- ආරම්භ කරන ලද ව්‍යාපෘති හා නිවාස ඒකක වර්ෂය තුළ සැලසුම් කළ පරිදි අවසන් කිරීමට හැකිවීම.

## 3.7 2024 වර්ෂයේ මුහුණ දුන් අභියෝග

- ඉඩම් තක්සේරු ලබා ගැනීම, පැවරුම් කටයුතු හා අදාළ අනුමැතීන් ලබාගැනීම සඳහා ගතවන කාලය දීර්ඝ වීම හා අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීම.
- කාලයක් තිස්සේ නොවිසඳී ඇති වැටුප් විෂමතා හා උසස් වීම් ගැටළු.
- ජාතික අයවැය චක්‍රලේඛ 02/2022 අනුව ඉදිකිරීම් ආරම්භ කළ ව්‍යාපෘති තාවකාලිකව අත් හිටුවීම.
- අනවසර නියමානුකූල කිරීම සඳහා 2014 කැබිනට් තීන්දුවෙන් පසු ප්‍රතිපාදන (Provision) ලැබී නොමැති වීම.
- එකතු කළ අගය මත බද්ද නිසා නිවාස මිල ඉහළ යාම.
- ඉදිකිරීම් පිරිවැය ඉහළයාම හේතුවෙන් අඩු ආදායම්ලාභීන් වෙත ලබාදෙනු ලබන මුදල ප්‍රමාණවත් නොවීම.
- මහල් නිවාස ඉදිකිරීම් පිරිවැය විශාල වශයෙන් ඉහළ යාම හේතුවෙන් මධ්‍යම පාන්තික ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ ගැටළු.
- අනවසරකරුවන් නියමානුකූල කිරීම.
- බද්ධ නිවාස පනත සංශෝධනය කිරීම.

## 3.8 2025 යෝජිත සැලසුම්

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය / වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු මිලි) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය නිවාස ගණන |
|---|---|---|---|---|
| නිවාස පහසුකම් | ඉන්දියානු ආධාර වැඩසටහන (අඩු ආදායම්ලාභීන් සඳහා) - අවිච්ඡේද) | 70.0<br>380.8 | භාණ්ඩාගාර අරමුදල්<br>ඉන්දියානු අරමුදල් | 1320 |

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය / වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු මිලි) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය නිවාස ගණන |
|---|---|---|---|---|
| නිවාස පහසුකම් | සැමට සෙවණ (2015-2019 අවි.)<br>- ණය | 2150.0<br>300.0 | භාණ්ඩාගාර අරමුදල්<br>අභ්‍යන්තර උත්පාදන | 8500 |
| | - ආධාර | 2208.0 | භාණ්ඩාගාර අරමුදල් | 5500 |
| | "සැමට නිවහන" අඩු ආදායම්ලාභී නව නිවාස - ආධාර | 5000.0<br>500.0 | භාණ්ඩාගාර අරමුදල්<br>සෙවණ අරමුදල් | 5000<br>500 |
| | "සැමට නිවහන" අඩු හා මධ්‍ය ආදායම්ලාභී නව නිවාස - ණය | 3750.0<br>750.0 | භාණ්ඩාගාර අරමුදල්<br>අභ්‍යන්තර උත්පාදන | 2500<br>500 |
| | නිවාස වැඩිදියුණු කිරීම් - ණය | 5000.0<br>800.0 | භාණ්ඩාගාර අරමුදල්<br>අභ්‍යන්තර උත්පාදන | 5000<br>800 |
| | සේවාභිමානී නිවාස ණය | 500.0 | අභ්‍යන්තර උත්පාදන | 500 |
| | තරුණ විවාහකයින් සඳහා නව නිවාස - ණය | 1250.0 | භාණ්ඩාගාර අරමුදල් | 500 |
| | කුලී නිවාස - රාජ්‍ය සේවකයන් (මාලිගාවත්ත නිවාස ව්‍යාපෘති) | 375.0 | භාණ්ඩාගාර අරමුදල් | 30 |
| | අඩු ආදායම්ලාභී කුලී සින්න නිවාස | 1440.0 | භාණ්ඩාගාර අරමුදල් | 144<br>(ව්‍යාපෘති 03) |
| | මධ්‍ය පාන්තික නිවාස ව්‍යාපෘති සඳහා විදුලිය හා ජලය (ලාවන්‍යා හයිට්ස් , සී බ්‍රීස් ව්‍යාපෘති) | 32.0 | භාණ්ඩාගාර අරමුදල්<br>සංවර්ධක අරමුදල් | --<br>320 |
| | **පෙර විකුණුම් නිවාස** | | | |
| | (i)රන්පොකුණුගම<br>- TEC - රු.මි.86.0 | | ප්‍රතිලාභී අරමුදල් / අභ්‍යන්තර අරමුදල් | 24 |
| | (ii) වැවේගොඩැල්ල, ගම්පහ<br>TEC - රු.මි.86.0 | | ප්‍රතිලාභී අරමුදල් / අභ්‍යන්තර අරමුදල් | 40 |

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය / වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු මිලි) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය නිවාස ගණන |
|---|---|---|---|---|
| | (iii) කැකිරිබොක්ක මිශ්‍ර සංවර්ධන, ගාල්ල (මහල් 11) | | ප්‍රතිලාභී අරමුදල් / අභ්‍යන්තර අරමුදල් | වාණිජ ගොඩනැගිලි 18, රෙස්ටුරන්ට් 01, වාහන නැවතුම් ස්ථාන, සහ ජා.නි.සං.අ. දිස්ත්‍රික් කාර්යාලය |
| නිවාස පහසුකම් | රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස | | | |
| | (iv) කුරුණෑගල, ඩෙනෝවර්වත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | | සංවර්ධක අරමුදල් | 600 |
| | (v) ඇන්ඩර්සන් | | සංවර්ධක අරමුදල් | 90 |
| | (vi) යක්කල, වැරැල්ලවත්ත - | | ප්‍රතිලාභී අරමුදල් / සංවර්ධක අරමුදල් | 924 |
| | (vii) මිහිදුපුර - TEC - USD. 56,143,399.9 | | සංවර්ධක අරමුදල් | 560 |
| සහායක සේවා | ඉඩම් වන්දි ගෙවීම | 167.79 | භාණ්ඩාගාර අරමුදල් | ඉඩම් 13 |
| | පැරණි නිවාස ක්‍රම නවීකරණය (නගමු පුරවර) | 454.25 | භාණ්ඩාගාර අරමුදල් | 1169<br>ව්‍යාපෘති 26 |
| | සනීපාරක්ෂක පහසුකම් සැපයීම (වැසිකිළි) | 2175.0 | භාණ්ඩාගාර අරමුදල් | 29000 |
| | හිමිකම් ඔප්පු නිකුත් කිරීම | -- | | 2000 |

## 3.9 2025 යෝජිත ව්‍යාපෘති

- **තරුණ විවාහක පිරිස් සඳහා නිවාස**

  තරුණ විවාහක පවුල් සඳහා නව නිවාස ඉදිකර ගැනීමට හෝ නිවසක් මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍ය සහයක් ලෙස දිගුකාලීනව ආපසු ගෙවීමේ සහන කොන්දේසි යටතේ සහනදායී පොලියක් යටතේ ණය මුදලක් ලබා දීම තුළින් සහය වීම මෙම වැඩසටහනේ අරමුණ වේ. සෑම දිස්ත්‍රික්කයකින්ම තරුණ විවාහක පවුල් 50 බැගින් තෝරා ගෙන උපරිමය රු. මිලියන 2.5 දක්වා ණය මුදලක් ලබා දී ඉදිරි වසර 03 තුළ නිවාස 1250ක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. එහිදි 2025 වර්ෂයේදී පවුල් 500ක් සඳහා ප්‍රතිලාභ සලසා දීමට රු. මිලි. 1250ක් ඇස්තමේන්තු කර ඇත.

- **මධ්‍යම පාන්තිකයන් සඳහා පෙර විකුණුම් නිවාස ව්‍යාපෘති**
    - ගාල්ල - කැකිරිබොක්ක මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
    - රංපොකුණගම, ගම්පහ
    - ගම්පහ, වැවේගොඩැල්ල
- **රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස ව්‍යාපෘති**
    - කොළඹ 5 - ඇන්ඩර්සන් පාර
    - යක්කල, වැරැල්ලවත්ත
    - මාවතගම, ඩෙනෝවර් වත්ත
    - කිරුලපන, මිහිඳුපුර
- **රාජ්‍ය සේවකයින් සඳහා කුලී නිවාස ව්‍යාපෘති**

ස්ථිර නිවසක් ඇති, නමුත් එදිනෙදා රාජකාරි සඳහා තම සේවා ස්ථානයට ආසන්නයේ නවාතැන් පහසුකම් නොමැති රාජ්‍යය සේවකයන් සඳහා කුලී නිවසක් ලබා දීම තුළින් ඍකියාවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීම මෙම වැඩසටහන මඟින් අපේක්ෂා කෙරේ. 2025 වර්ෂයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු මාළිගාවත්ත ජේෂකර්ම ඉඩම නිවාස 30කින් යුත් මහල් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 375ක් ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතිය වර්ෂ 2ක් තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර තරඟකාරි මිළ ගණන් කැඳවීම මඟින් කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ. 2025 වර්ෂය සඳහා භාණ්ඩාගාර අරමුදලින් රුපියල් මිලියන 250ක් ඇස්තමේන්තු කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | නිවාස ඒකක | ඇස්තමේන්තුව රු.මි. |
|---|---|---|---|---|
| 1 | ගාල්ල | වරාගස්විලවත්ත-ගොනාපීනුවල | 48 | 480.00 |
| 2 | කුරුණෑගල | කනදුල්ල -කුලියාපිටිය | 48 | 480.00 |
| 3 | පොලොන්නරුව | හිගුරක්ගොඩ | 48 | 480.00 |
| **එකතුව** | | | **144** | **1440.00** |



**කොළඹ 5 – ඇන්ඩර්සන් පාර**



**ගාල්ල - කැකිරිබොක්ක ඉඩම**



**මාලිගාවත්ත-**
**පෙහෙකම්හල ඉඩම**



**කුරුණෑගල,මාවතගම**
**ඩෙනෝවර් වත්ත**

# 04 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

## 4.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මුලින් පිහිටුවන ලද්දේ 1968 අංක 15 දරණ කොළඹ දිස්ත්‍රික් (පහත් බිම්) ගොඩකිරීමේ සහ සංවර්ධන මණ්ඩල පනත යටතේ නීත්‍යානුකූල ආයතනයක් ලෙස වන අතර පසුව 1976 අංක 27, 1982 අංක 52, 2006 අංක 35, 2019 අංක 11, සහ 2021 අංක 13 දරණ පනත් මඟින් සංශෝධනය කරන ලදී. ආරම්භයේ සිටම මෙම සංස්ථාව රටේ සංවර්ධනයේ, විශේෂයෙන්ම නාගරික වැසි ජල කළමනාකරණයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලද අතර කාලයාගේ ඇවෑමෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සිය මෙහෙයුම් නව ව්‍යාපාරවලට විවිධාංගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මුලින් පිහිටුවන ලද්දේ පහත් බිම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා වන අතර කෙසේ වෙතත්, කාලයත් සමඟ නවීකරණය වන අවස්ථා සහ සේවා සැපයීම් වලට අනුවර්තනය වීම සඳහා සංශෝධන වලට භාජනය විය.

වර්තමානයේදී, සංස්ථාවෙහි 1,400 කට අධික සේවක සංඛ්‍යාවක් සේවයෙහි නිරත අතර, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සංචිතයක් ඇතුළුව රුපියල් බිලියන 18ක පමණ මුළු වත්කම් ප්‍රමාණයක් ද පවතී. තවද, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, මෙහෙයුම් අංශ අටක් සහ සේවා අංශ හයකින් සමන්විත වන අතර, විවිධ ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම සඳහා නිරන්තරයෙන් ඇප කැප වේ.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ සහ ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලයේ සාමාජිකත්වය ලබා ඇති අතර ISO 9001:2015, ISO 14001:2015 සහ ISO 45001:2018 යන තත්ත්ව සහතිකයන්ගෙන් ද පිදුම් ලැබ ඇත.

### දැක්ම

ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසර හිතකාමී තිරසාර පරිසරයක් නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම.

### මෙහෙවර

ඉහළ නිපුණතාවයක් සහ අභිප්‍රේරිත ශ්‍රම බලකායක් හරහා ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා වැසි ජල අපවහන, තෙත්බිම් කළමනාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ඉංජිනේරු සේවා සැපයීම.

## 4.2 අනුබද්ධිත ආයතන

ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම සහ LRDC සේවා පුද්ගලික සමාගම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අනුබද්ධිත සමාගම් වේ.

### 4.2.1 ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම

2007 අංක 17 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ මෙම සමාගමේ මූලික අරමුණ වන්නේ උසස් තත්ත්වයේ සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීම සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ඉදිකිරීම්, ඉඩම් සංවර්ධනය, වාරිමාර්ග, පොදු සේවා සහ අනෙකුත් සේවාවන් සඳහා සහාය වීමයි.

දැක්ම

සමස්ත පාරිභෝගික තෘප්තිය සඳහා උසස් තත්ත්වයේ නිෂ්පාදන සහ සේවාවන් සැපයීමෙන් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා හොඳම රජයේ සිමෙන්ති නිෂ්පාදන, නිෂ්පාදකයා/සැපයුම්කරු වීම.

මෙහෙවර

අපගේ උසස් තත්ත්වයේ නිෂ්පාදන සහ සේවාවන් හරහා අපගේ පාරිභෝගිකයින්ට ඔවුන්ගේ ඉදිකිරීම් කර්මාන්තයේ ඉහළ ප්‍රමිතීන් ළඟා කර ගැනීමට අපි උදව් කරමු.

### 4.2.2 LRDC සේවා පුද්ගලික සමාගම

මෙම ආයතනය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සපයමින් පසුගිය වසර 20 පුරා ක්‍රියාත්මක වේ. වර්තමානයේ එය රාජ්‍ය, පෞද්ගලික සහ ගෘහස්ත අංශයේ ආයතන සහ පුද්ගලයන් සඳහා දිවයින පුරා ආරක්ෂාව සහ නිරීක්ෂණ විසඳුම් සපයන ප්‍රමුඛතම රාජ්‍ය සංවිධානයකි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බෙහි රාජ්‍යය සහ ජනතාව සඳහා ප්‍රමුඛතම සමාජ ආරක්ෂකයා වීම.

මෙහෙවර

තිරසාර රාජ්‍ය ව්‍යවසායයක් ලෙස සිය වරම ක්‍රියාත්මක කිරීමට කැපවී සිටින තෘප්තිමත් සහ ප්‍රතිලාභ ලබන ශ්‍රම බලකායක් විසින් සපයනු ලබන විශ්වාසදායක, වෘත්තීය සේවාවක් හරහා අපගේ සේවාදායකයාගේ නිශ්චිත සහ අභිරුචිකරණය කරන ලද ආරක්ෂාව, නිරීක්ෂණ, බුද්ධිය සහ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි දැක්මට අනුව "ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසර හිතකාමී තිරසාර පරිසරයක් නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම", සඳහා ක්‍රියාත්මක කරන ලද වැසි ජල අවම කිරීමේ ව්‍යාපෘති පහත පරිදි වර්ග කළ හැක.

1. ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම
2. දිගුකාලීන තිරසාරභාවය සඳහා වැසි ජල අවම කිරීමේ ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

## 4.3 ප්‍රධාන විෂය ක්ෂේත්‍ර

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 4ක් යටතේ වාර්ෂික ව්‍යාපෘති 32ක් ක්‍රියාත්මක කරනු ලබයි.

1. ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම
2. වැසි ජල පාලනය
3. තෙත් බිම් සහ පහත් බිම් සංවර්ධනය
4. නිර්මාණ කටයුතු, සිතියම්කරණය සහ ශක්‍යතා අධ්‍යයනය

## 4.4 ප්‍රගතිය - 2024

➢ **භාණ්ඩාගාර අරමුදල් වලින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්හි ප්‍රගතිය – 2024**

| # | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මිලි.) | ප්‍රතිපාදන 2024 (රු.මිලි.) | 2024.12.31 දින දක්වා | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය | | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
| | | | | (රු.මිලි.) | (%) | |
| 1 | රාජ්‍ය ආයතන (වාර්ෂික නඩත්තු) | වාර්ෂික | 600.00 | 306.36 | 51 | 100 |
| 2 | වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 11,050.00 | 800.00 | 488.95 | 61 | 100 |
| 3 | කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 8,300.00 | 300.00 | 201.43 | 67 | 14.17 |
| 4 | ඔලියමුල්ල වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 3,000.00 | 450.00 | 293.49 | 65 | 90 |
| 5 | බේරේ වැවේ ජලයේ ගුණාත්මකභාවය ප්‍රතිස්ථාපනය කිරීම | වාර්ෂික | 40.00 | 22.95 | 57 | 99.07 |
| | **එකතුව** | | **2,190.00** | **1,313.18** | | |

➢ **සේවාදායක අරමුදල් සහිත ව්‍යාපෘති - 2024**

| # | ව්‍යාපෘතියේ නම | සේවාදායකයා | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | (රු. මි.) | % |
| 1 | බබාවා වැව ප්‍රතිසංස්කරණය කිරීම - තිස්සමහාරාමය | කෘෂිකර්ම අමාත්‍යාංශය | 78.89 | 73.55 | 93 |
| 2 | තබරව වැව ප්‍රතිසංස්කරණය කිරීම - තිස්සමහාරාමය | | 87.18 | 83.26 | 96 |
| 3 | මොරටුව බැටරිවත්ත ප්‍රදේශයේ වැසි ජල අපවහන කළමනාකරණ යෝජනාව සහ ගොඩකිරීම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම | නාගරික සංවර්ධන අධිකාරිය | 227.00 | 183.81 | 81 |
| 4 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය තුළ වගුරු බිම් ප්‍රදේශයේ ඇවිදීමේ මාර්ගය ඉදිකිරීම (SLIIT) | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 33.56 | 22.38 | 67 |

- **ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අරමුදල් සහිත ව්‍යාපෘති - 2024**

    i. දේශීය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අක්වෙරළ වැලි අලෙවි කිරීම ආදායම ( 31.12.2024) – රු.මිලි. 798.26

    ii. අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය – කෙරවලපිටිය

    - හිතකර කාලගුණික තත්ත්වයන් යටතේ දෛනික කොම්පෝස්ට් නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් 30කි.



ඔලියමුල්ල වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - පෑලියගොඩ



වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

- **කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

නඩත්තු කිරීමට පෙර



වර්තමාන තත්ත්වය



දහම්වෙල ඇළ- තුප්පවෙල වැව නිර්මාණය



සැළලිහිණි මාවත ඇළ ඉදි කිරීම



දහම්වෙල ඇළ - වෙන්නවත්ත පාර බෝක්කුව ඉදිකිරීම

## 4.5 වාර්ෂික සැලසුම 2025

| ප්‍රධාන විෂය ක්ෂේත්‍ර | ව්‍යාපෘතිය/ වැඩසටහන් | මූල්‍ය ඉලක්කය (රු.මි.ලි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය(%) |
|---|---|---|---|---|
| වැසි ජලය නිසා ඇතිවන ගංවතුර, අවම කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම | 1.1 පවතින ඇළ මාර්ග, වැව්, තෙත් බිම් සහ ඇවිදීමේ මාර්ග නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම | 1,081.50 | භාණ්ඩාගාර අරමුදල් | 100 |
| | 1.2 ජලාපවහන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පරිසර ආරක්ෂණය | 215.00 | | 100 |
| | 1.3 වැසි ජල ආපදා සඳහා කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල වැසි ජල පොම්පාගාර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම | 198.50 | | 100 |
| | 1.4 වැසි ජල ආපදා සඳහා සූදානම සහ හදිසි ප්‍රතිචාර දැක්වීම | 482.10 | | 100 |
| | 2. වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 440.00 | | 100 |
| වැසි ජලය නිසා ඇතිවන ගංවතුර, අවම කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම | 3. ඔලියමුල්ල වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම) | 800.00 | භාණ්ඩාගාර අරමුදල් | 100 |
| | 4.කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම හා නඩත්තු කිරීම) | 1,498.00 | | 100 |
| | 5. ජල ගැලීම් අවම කිරීම සඳහා කළු පාලම Gate Mounted Pumps ස්ථාපනය කිරීම | 600.00 | | 100 |

## 4.6 අභියෝග

- යෝජිත සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පවතින ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීමට සහ වැසි ජල පොම්පාගාර ක්‍රියාත්මක කිරීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- වඩා හොඳ වරප්‍රසාද සඳහා සුදුසුකම් ලත් සහ පළපුරුදු වෘත්තීය කාර්යමණ්ඩලය සංස්ථාව හැර යාම.
- වැසි ජල පොම්පාගාර වැනි වැසි ජල අවම කිරීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය නොමැති වීම.
- ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු.

# 05 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

## 5.1 හැඳින්වීම

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය ඇති උපදේශක ආයතනය වෙයි. ඉදිකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ලබා දීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනභිභවනීය කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි. ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකතනය කරයි.

### දැක්ම

ජනතාවට විශිෂ්ට සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද , තිරසාර හා විශිෂ්ට ලෙස නිමවූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශ ආයතන වලට ලබා දෙමින් ගොඩනැගිලි තාක්ෂණයේ පුමුඛයා බවට පත් වීම.

### මෙහෙවර

තාක්ෂණික වගකීම, ගුණාත්මකභාවය, පිරිමැසුම්දායක බව, අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි නිපුණ, එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ට සේවාවක් සැපයීම.

## 5.2 අධිකාරිය සහ වගකීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත සේවා සපයයි.

- ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම් සඳහා උපදේශන සේවා.
- ව්‍යාපෘති කළමනාකරණ සේවා.
- තත්ත්ව වාර්තා නිකුත් කිරීම.
- ගොඩනැගිලි ගාස්තු උපලේඛනය ප්‍රසිද්ධ කිරීම.
- ඉංජිනේරුවන් හා තාක්ෂණ සේවා ශිෂ්‍යයින් පුහුණු කිරීම.
- ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා සහභාගී වෙමින් අනෙකුත් ආයතන සඳහා සේවා ලබා දීම.
- අධිකරණ නියෝග අනුව ගොඩනැගිලි තත්ත්ව වාර්තා ලබාදීම හා අධිකරණයේ පෙනී සිටීම.

- සභාධිපත්‍ය දේපළ සඳහා තත්ත්ව වාර්තා ලබා දීමට කටයුතු කිරීම.
- ජනාධිපති, අගමැති, කථානායක, විපක්ෂ නායක සහභාගී වන රැස්වීම් සඳහා ඉදිකරනු ලබන වේදිකාවන් සඳහා අනුමැතිය ලබා දීම.

අපගේ බැඳියාවන් සමග වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මගින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

## 5.3 2024 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල සාරාංශය (2024.12.31දිනට)

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන -2024 (රු.මිලි) | 2024 වාර්ෂික ඉලක්කය (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කලාප - 01 බටහිර දකුණ | 2,907.16 | අසීමිතයි | 1,131.89 | 821.38 | 648.53 | 79 | 40 - 100 |
| 2 | කලාප - 01 බටහිර උතුර | 978.46 | | 447.03 | 269.70 | 132.92 | 49 | 90 - 100 |
| 3 | කලාප අංක - 02 | 839.21 | | 451.72 | 313.50 | 117.64 | 38 | 30 - 100 |
| 4 | කලාප අංක - 03 | 686.27 | | 669.69 | 283.72 | 207.76 | 73 | 35 - 100 |
| 5 | කලාප අංක - 04 | 1,083.42 | | 863.90 | 716.91 | 608.85 | 85 | 53 - 100 |
| 6 | කලාප අංක - 05 | 1,038.95 | | 396.56 | 369.65 | 369.65 | 100 | 100 |
| 7 | කලාප අංක - 06 | 6,052.66 | | 1,846.58 | 604.23 | 607.59 | 101 | 60 - 100 |
| | එකතුව | **13,586.13** | | **5,807.35** | **3,379.09** | **2,692.94** | **80** | |

## 5.4 2024 වසර තුළ නිම කරන ලද ව්‍යාපෘති කිහිපයක්



හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
මුළු පිරිවැය ඇස්තමේන්තුව - රු. මිලි. **360**



තෙල්දෙණිය උසාවි සංකීර්ණය ඉදිකිරීම
මුළු පිරිවැය ඇස්තමේන්තුව - රු. මිලි. **599**



මහනුවර පෞරාණික රජවාසල කෞතුකාගාර පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම
මුළු පිරිවැය ඇස්තමේන්තුව - රු. මිලි. **84.5**

## 5.5 2024 වර්ෂය තුළදී සිදු කළ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන්

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල (රු. මිලි) | 2024.12.31 ප්‍රගතිය මූල්‍යමය (රු. මිලියන) |
|---|---|---|
| දැනට පවතින ගරාජය හා රියදුරු නවාතැන වැඩිදියුණු කිරීම - ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 06) | 0.10 | 0.09 |
| තිරයිමදු ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ (කලාප 04) කුඩා සම්මන්ත්‍රණ ශාලාව සඳහා ඇලුමිනියම් කොටස් සැපයීම සහ සවි කිරීම | 0.45 | 0.40 |

## 5.6 ගැටළු හා බාධක

- රජයේ නව මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය සීමා පැනවීය. විශාල මූල්‍ය අර්බුදයෙන් පසුව පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමට හා අලුත්වැඩියා කිරීමට වැඩිපුර ප්‍රතිපාදන ලැබී ඇත.
- කාර්ය මණ්ඩලයේ හිඟකම (ඉංජිනේරුවන්, කාර්මික නිලධාරීන්, සැලසුම් ශිල්පීන්, තාක්ෂණ සහායකයින්, රියදුරන්)
- වැඩ බිම් වෙත යාම සඳහා වාහන හිඟකම.
- සංචාරක බංගලා නඩත්තුව/නඟාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම.
- නීති නිලධාරියෙක් නොමැති වීම.

## 5.7 බාධක ජය ගැනීමට යොදන ලද උපක්‍රම

- කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය අනුමැතිය සඳහා අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- පවතින කාර්යමණ්ඩලයෙන් රාජකාරි ආවරණ හා වැඩ බැලීම් පදනම යටතේ රාජකාරී කටයුතු කරගෙන යාම.

## 5.8 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය |
|---|---|---|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම | | | | |
| 309-2001 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 195.31 | ඒකාබද්ධ අරමුදල | 100% |
| 309-2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2.38 | ඒකාබද්ධ අරමුදල | 100% |
| 309-2003 | වාහන | 4.40 | ඒකාබද්ධ අරමුදල | 100% |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | |
| 309-2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3.13 | ඒකාබද්ධ අරමුදල | 100% |
| 309-2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 13.47 | ඒකාබද්ධ අරමුදල | 100% |
| 309-2105 | ඉඩම් හා ඉඩම්වල වැඩිදියුණු කිරීම | 9.85 | ඒකාබද්ධ අරමුදල | 100% |
| | එකතුව | **228.54** | | |

# 06 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

## 6.1 හැඳින්වීම

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගැස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසුකාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ ඛණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරිමාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.

1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව එමගින් ඉටු කළ මහාමාර්ග තැනීම, නඩත්තුව සහ ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහාමාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.

### දැක්ම

තිරසාර සංවර්ධනය තුලින්, ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

### මෙහෙවර

"රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත, යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, සේවා සහ උපදේශන සේවා සැපයීම. තාක්ෂණික ඉංජිනේරු ආධුනිකයින්, වෘත්තීය ඉංජිනේරුවරුන් වෙත, යාන්ත්‍රික වැඩ හා සේවා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම."

## 6.2 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

### (අ) නිෂ්පාදන ක්ෂේත්‍රය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සඳහා ලෝහමය, දැවමය භාණ්ඩ නිර්මාණය හා නිෂ්පාදනය

- වාරිමාර්ග ජල කළමනාකරණ දිය දොරටු හා උපකරණ, ආරෝග්‍යශාලා උපකරණ.
- දැව ගෘහ භාණ්ඩ දැව භාණ්ඩ.
- චීනච්චට්ටි හා නිෆෙරස් වාත්තු.
- පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිල පටි, තරු, අංක තහඩු නිෂ්පාදනය කිරීම.
- තැපැල් දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා දින මුද්‍රා හා ඒ සඳහා අවශ්‍ය වන කැට නිෂ්පාදනය.
- නාම පුවරු.

### (ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැඩ්දුම්)

- වාරිමාර්ග ජලාශ සඳහා විවිධ වර්ග වල ජල පාලන දිය දොරටු නිර්මාණය, නිෂ්පාදනය සහ සවි කිරීම.
- පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂිත වහල ඉදිකිරීම.

- යකඩ සැකිළි මත ඉදි වූ ගොඩනැගිලි සෑදීම.
- ගොඩනැගිලිවල දැව සහ ලෝහමය වහල ඉදිකිරීම.
- රාජ්‍ය උත්සව, දේශිය හා විදේශිය රාජ්‍ය නායකයින්, විශේෂ ආරාධිත අමුත්තන් පිළිගන්නා උත්සව සඳහා හිරු ආවරණ, වේදිකා, කුටි ඉදිකිරීම.
- යකඩ පාලම් ඉදිකිරීම.
- ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය හා සවිකිරීම.

### (ඇ) අලුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය

- ආරෝග්‍යශාලා, ආයුර්වේද, රෝහල්, බන්ධනාගාර, ලුහු කර්මාන්ත ආදී ආයතනවල යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව.
- වාරිමාර්ග හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවල හා අනෙකුත් ආයතනවල ජල කළමනාකරණ දිය දොරටු සහ උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව.
- කාර්යාල වල දැව භාණ්ඩ නඩත්තුව හා අලුත්වැඩියාව.
- යතුරු ලියන හා වායු සමීකරණ යන්ත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව.
- රාජ්‍ය ආයතනවල වාහන සේවා කිරීම.

### (ඇ) යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා

- පශ්චාත් ඉංජිනේරු හා ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා ආයතනික ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
- රාජ්‍ය ආයතනවල අලුත්වැඩියා කළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා තත්ත්ව වාර්තා ලබා දීම.
- රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටු, අපහරණ කමිටු හා තක්සේරු කමිටු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදනය හා සේවා සහ උපදේශක සේවා සැපයිම.



තොන්ඩමනාරු බරාජයේ ජල පාලන දිය



දැදුරු ඔය ව්‍යාපෘතියේ ගේට්ටු එසවුම්



මාලිගාවිල බුදු පිළිමයට වහල



හපුගල ජල පිරිපහදු ඒකකය

## 6.3 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2024.12.31) - කළ වැඩ අත්තිකාරම්

| | ව්‍යාපෘති විස්තර | ඉලක්කය 2024 | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුව (රු.මි.) | භෞතික (%) | පිරිවැය (රු.මි.) | භෞතික (%) |
| 1 | ඌව කුඩාඔය ජලාශයේ ජලපාලක දොරටු අංක 01ක් සහ ස්ථාවර රෝද ගේට්ටුවක් සකස් කිරීම සහ ස්ථාපනය කිරීම හා වාන් දොරටු 02ක් සඳහා හයිඩ්‍රොලික් එසවුම් පද්ධතියක් සවි කිරීම | 145 | 100 | 4.29 | 3 |
| 2 | 2024 ජාතික නිදහස් දිනය (සඳහා VVIP, VIP වේදිකා සැකසීම, ස්ථාපනය කිරීම සහ ප්‍රවාහනය කිරීම. | 48 | 100 | 39.42 | 100 |
| 3 | ඇල්ලේවැව වාත්තු යකඩ සොරොව් දොරටු හදිසි ගේට්ටුව සැකසීම, සැපයීම සහ ස්ථාපනය කිරීම. | 30 | 100 | 3.56 | 12 |
| 4 | විදුලි, යාන්ත්‍රික යාන්ත්‍රණ, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තු ඒකකය මඟින් ඉටු කරන කාර්යයන් | 10 | 100 | 4.45 | 45 |
| 5 | බර පිරිසැකසුම් ඒකකය මඟින් ඉටු කරන අනෙකුත් කාර්යයන්. | 20 | 100 | 68.31 | 100 |
| 6 | යාන්ත්‍රික දැව ඉරීම සහ දැව භාණ්ඩ සෑදීමේ ඒකකය මඟින් ඉටුකරන කාර්යයන්. | 20 | 100 | 18.09 | 100 |
| 7 | සැහැල්ලු පිරිසැකසුම් ඒකකය මඟින් ඉටු කරන කාර්යයන්. | 20 | 100 | 28.20 | 100 |
| 8 | වාත්තු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන් | 30 | 100 | 41.68 | 100 |
| 9 | සැහැල්ලු ඉංජිනේරු වැඩ ඒකකය මඟින් ඉටු කරන කාර්යයන්. | 18 | 100 | 26.50 | 100 |
| 10 | වාහන අලුත්වැඩියා ඒකකය මඟින් සිදු කරනු ලබන කාර්යයන්. | 02 | 100 | 2.64 | 100 |
| 11 | නඩත්තු අංශය | 03 | 100 | 9.14 | 100 |
| | මුළු එකතුව | **346** | | **246.28** | |

## 6.4 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් ජයග්‍රහණ හා මුහුණු දුන් අභියෝග

**විශේෂ ජයග්‍රහණ**

- 2024 වර්ෂය තුළදී ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය යාවත්කාලීන කරන ලදී. ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EMI (Heavy Steel Fabrication) 2024 වර්ෂයේදී අලුත් කරන ලදි. EMF (Elevators, Escalators & Revelators) 2024 වර්ෂයේදී අලුත් කරන ලදි. SP2 Capentry & Joinery) 2024 වර්ෂයේදී අලුත් කරන ලදි.
- පුද්ගලික ආයතන සමඟ තරඟකර ජල පාලන දොරටු අවම මිළ ගණන් යටතේ සාදා සවිකිරීමට හැකිවීම.
- ආනයනික ජල පිරිපහදු ටැංකි පද්ධතියක් වෙනුවට දේශීයව සුදුයකඩ භාවිතා කර අවම පිරිවැයකින් ජල පිරිපහදු ටැංකි පද්ධතියක් නිර්මාණය කර තනා සවිකිරීමට හැකිවීම .
- පාරම්පරික නිශ්පාදන යන්ත්‍ර වෙනුවට නවීන තාක්ෂණය සහිත යන්ත්‍ර සූත්‍ර මිලදීගෙන කාර්යක්ෂම හා උසස් ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය සැකසීමට කටයුතු කිරීම.

**අභියෝග**

- තාක්ෂණික හා කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දිගින් දිගටම පැවතීම හා කලට වේලාවට පිරවීමේ යාන්ත්‍රණයක් නොතිබීම.

  උදා- රියදුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුව සතු ලොරි රථ, ක්‍රේන් ආදිය ක්‍රියාත්මක කිරීමට රියදුරන් නොමැති වීමෙන් බාහිර පාර්ශවයෙන් කුලී පදනම මත එම වාහන ලබා ගැනීමට සිදුවීම. මේ හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමටද සිදුවන අතර අදාළ ව්‍යාපෘති කාලය දීර්ඝවීමටද මෙය හේතුවක් වේ.

- යාන්ත්‍රික ඉංජිනේරු ඉදිකිරීම් සේවා සහ නිෂ්පාදන සඳහා වෙළඳපොල ප්‍රමිතියක් නොමැති වීම හා මේ පිළිබඳව සොයා බැලීමට නියාමන ආයතන නොමැති වීම.
- සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබීමට නියමිත මුදල් නියමිත කාලවකවානු තුළ නොලැබීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතව කටයුතු සිදුකිරීමට සිදුවීම මත පුද්ගලික ආයතන සමග තරඟකාරී ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාම දුෂ්කර වීම.
- කාර්යසාධන බැඳුම්කර, ලංසු බැඳුම්කර හා වෙනත් බැඳුම්කර ඉදිරිපත් කිරීමට නොහැකි විම.
- 2013 වර්ෂයේ සිට PL කාණ්ඩයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනිම් සිදු කිරීමට අවස්ථාව සැලසී නොමැති බැවින් PL කාණ්ඩයේ පුරප්පාඩු පිරවීම ගැටලු සහගත වි ඇත.

## 6.5 ක්‍රියාකාරී සැලැස්ම -2025

| | උප ව්‍යාපෘතිය / උප ක්‍රියාකාරකම් | TEC (රු.මි) | 2025 වසර සඳහා ක්‍රියාකාරකම් සැලැස්ම (රු. මි) |
|---|---|---|---|
| 1.1 | ඌව කුඩාඔය - උමා ඔය ව්‍යාපෘතිය (2112) හි රේඩියල් ගේට්ටු අංක 02 සඳහා හයිඩ්‍රොලික් එසවීමේ යාන්ත්‍රණය සැකසීම සහ ස්ථාපනය කිරීම. | 125 | 105 |
| 1.2 | 2025 ජාතික නිදහස් දිනය වෙනුවෙන් VVIP, VIP වේදිකා සැකසීම, ස්ථාපනය කිරීම, විසුරුවා හැරීම සහ ප්‍රවාහනය කිරීම | 25 | 25 |
| 1.3 | ඇල්ලේවැව (2144) ප්‍රදේශයේ වාත්තු යකඩ සොරොව් දොරටු හදිසි ගේට්ටුව සැකසීම, සැපයීම සහ ස්ථාපනය කිරීම. | 21 | 15 |
| 1.4 | හපුගල ජල පවිත්‍රාගාරය පැකේජ ආකාරයේ ජල පිරිපහදුවක් ඉදිකිරීම | 143 | 80 |
| 1.5 | තිස්සමහාරාමයේ ජල පවිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීම | 28 | 28 |
| 1.6 | හීන් ඇල, අඹතලේ ජල කළමනාකරණ ගේට්ටුව ඉදිකිරීම | 27 | 27 |
| 1.7 | අම්පාර පල්ලන්ඔය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 30 | 30 |
| 2. | යන්ත්‍රෝපකරණ ඒකකය (වැඩහල් 01) - යන්ත්‍රෝපකරණ, පුද්ගලික සහ රාජ්‍ය අංශයේ වැඩ | 6 | 6 |
| 3. | HEAY FABRICATION UNIT (වැඩහල් 02) -වෙනත් වැඩ | 10 | 10 |
| 4. | වඩු කාර්මික ඒකකය (වැඩහල් 03) (රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා ලී ගෘහ භාණ්ඩ නිෂ්පාදනය) | 15 | 15 |
| 5. | සැහැල්ලු නිෂ්පාදන ඒකකය- (වැඩහල් 04) රෝහල් ගෘහභාණ්ඩ නිෂ්පාදනය සහ නඩත්තු කිරීම | 15 | 15 |
| 6. | වාත්තු ඒකකය - (වැඩහල් 06) රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා යකඩ සහ යකඩ නොවන අයිතම වාත්තු කිරීම | 25 | 25 |
| 7. | සැහැල්ලු ඉංජිනේරු ඒකකය - (වැඩහල් 07) රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා සැහැල්ලු ඉංජිනේරු කටයුතු | 15 | 15 |
| 8. | නඩත්තු අංශය (වැඩහල් 14,16) | 04 | 04 |
| | **එකතුව** | **489** | **400** |

# 07 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

## 7.1 හැඳින්වීම

1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතු වූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින් 2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්ම සැකසීමෙන් අනතුරුව ඊට අනුගත වන ලෙස ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා වෙන වෙනම ඒ ඒ පළාතේ ගැටළු හඳුනා ගනිමින් ද පවතින සම්පත් උපරිමව උපයෝගී කරගනිමින් ද, තිරසාර සංවර්ධනයක් උදෙසා මාර්ගෝපදේශයක් ලබා දීමට කලාපීය භෞතික සැලසුම් සකස් කිරීමටත්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් නොකරන ලද ප්‍රදේශයන්හී පළාත් පාලන ආයතනවල ඉල්ලීම මත ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමත් සිදු කෙරේ.

### දැක්ම

"සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු"

### මෙහෙවර

- ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ ඉඩම්වල ආර්ථික, සාමාජීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම් කිරීම ප්‍රවර්ධනය සහ නියාමනය අරමුණු කරගෙන ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම.
- කලාපීය සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් මඟින් එම ජාතික භෞතික සැලසුම් ප්‍රත්පත්තිය සහ ජාතික සැලැසුම ක්‍රියාවට නැංවීම.
- කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික සැලසුම් බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් නියමු උපදෙස් සකස් කිරීම.
- ස්වාභාවික පහසුකම් ආරක්ෂා කිරීම, ස්වභාවික පරිසරය, ගෘහ නිර්මාණමය සහ ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි සහ ස්වභාවික ලෙස විසිතුරු ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

### ප්‍රධාන කාර්යයන්

- ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සකස් කිරීම
- ජාතික භෞතික සැලැස්මක් පිළියෙල කිරීම
- කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික නිර්මාණ නියමු උපදෙස් සකස් කිරීම.
- කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයාට යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ එවැනි සැලැස්මක් පිළියෙල කරන ලෙස ඒ බලධරයා විසින් ඉල්ලා සිටි විට එවැනි යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීම.

- කලාපීය භෞතික සැලසුම් පිළියෙල කිරීමේ දී සහ සංවර්ධනය කිරීමේ දී පළාත් සභාවලට සහාය වීම.
- ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස, ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූලව අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය, ජාතික භෞතික සැලැස්ම සහ ක්‍රියාත්මකව පවතිමින් තිබෙන ජාතික භෞතික සැලසුම් ක්‍රමෝපාය වරින් වර සමාලෝචනය කිරීම සහ පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වූ අවස්ථාවක, ඒ ප්‍රතිපත්තියක්, සැලැස්මේ ක්‍රමෝපාය වල වෙනස්කම් සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ කිරීම.
- ජාතික භෞතික නිර්මාණ සභාව විසින් අනුමැතිය දී ඇති ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක වීම නියාමනය කිරීම.
- ජාතික භෞතික නිර්මාණ සභාව සහ අන්තර් අමාත්‍යාංශය සම්බන්ධීකරණ කමිටුව විසින්, ඉටුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ලේකම් කාර්යාලයක කර්තව්‍ය ඉටුකිරීම ද ඇතුළුව, සභාවේ සහ සම්බන්ධීකරණ කමිටුවේ සියලු ක්‍රියාකාරකම් වලදී සභාවට සහ සම්බන්ධීකරණ කමිටුවට සහාය වීම.

## 7.2 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිපාදන 2024 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය 2024-12-31 | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය රු.මි. | % | % |
| 1 | ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම සකස් කිරීම (ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්ම වැඩිදියුණු කිරීම) | 10 | 10 | 0.43 | 4.3 | 98 |
| 2 | ප්‍රාදේශීය හෝ කලාපීය භෞතික සැලසුම් අධිකාරීන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් මාර්ගෝපදේශ සකස් කිරීම. | | | | | 10 |
| 3 | නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 2035 සකස් කිරීම | | | | | 95 |
| 4 | මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම 2035 සකස් කිරීම | | | | | 60 |
| 5 | මධ්‍යම පාරිසරික අධිසංවේදී කලාපය තුළ සැලසුම් කටයුතු සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම | | | | | 15 |
| 6 | ප්‍රාදේශීය සහා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම | | | | | 90 |
| 7 | අනුරාධපුර ලෝලුගස්වැව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය - නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා උපදේශක ආයතනයක් නැවත තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු | 1450 | 20 | 0.16 | 0.8 | 5 |
| 8 | පූජාභූමි ගැසට් මඟින් 1043ක් ප්‍රකාශයට පත් කිරීම | | | | | 36.2 |
| 9 | පූජාභූමි සැලසුම් යෝජනා ක්‍රම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම | | | | | 100 |
| 10 | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | 4.76 | 4.76 | 4.56 | 96 | 100 |

## 7.3 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟා කර ගැනීමේදී, මානව සම්පත් හිඟකම මුහුණ පෑමට සිදු වූ ප්‍රධාන අභියෝගයක්ය. දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ යෙදී සිටිනුයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 65% කටත් වඩා අඩු ප්‍රමාණයකි. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සැලසුම්කරණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආයතනය වුවද, මෙහි සැලසුම්කරණය සම්බන්ධ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02ක්, විධායක මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 04ම සහ අධ්‍යක්ෂ තනතුරු 30ම පුරප්පාඩුව පවතී. දැනට සැලසුම්කරණයේ යෙදී සිටින්නේ ද්විතීයික මට්ටමේ අනුමත තනතුරු 34න් 28කගෙන් සමන්විත වෘත්තිකයින් සංඛ්‍යාවක් පමණි.

## 7.4 2025 වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් පිළිබඳ විස්තර

| ප්‍රධාන විෂයය ක්ෂේත්‍රය | වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය |
|---|---|---|---|---|
| සැලසුම් | ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම සකස් කිරීම (ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්ම වැඩිදියුණු කිරීම) | 10 | වාර්ෂික අයවැය | ජාතික භෞතික සැලැස්ම සකස් කිරීම |
| | ප්‍රාදේශීය හෝ කලාපීය භෞතික සැලසුම් අධිකාරීන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් මාර්ගෝපදේශ සකස් කිරීම. | | | මාර්ගෝපදේශ සකස් කිරීම |
| | නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 2035 සකස් කිරීම | | | සැලැස්ම සකස් කිරීම |
| | මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම 2035 සකස් කිරීම | | | සැලැස්ම සකස් කිරීම |
| | මධ්‍යම පාරිසරික අධිසංවේදී කලාපයතුල සැලසුම් කටයුතු සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම | | | මාර්ගෝපදේශ සකස් කිරීම |
| | පට්ටිපොල සේවා මධ්‍යස්ථානය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීම | | | සැලැස්ම සකස් කිරීම |
| | කටුකැලියාව සේවා මධ්‍යස්ථානය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීම | | | සැලැස්ම සකස් කිරීම |
| | අනුරාධපුර ලෝලුගස්වැව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 25 | | නේවාසිකයින් නැවත පදිංචි කිරීම |
| | පූජාභූමි 83ක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සහ ජාතික වශයෙන් වැදගත් පූජාභූමි සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම | | | පූජාභූමි ගැසට් කිරීම සහ සැලැසුම් සකස් කිරීම |
| සංවර්ධන | පූජාභූමි සැලසුම් යෝජනා ක්‍රම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම | | | තාක්ෂණික සහයෝගය ලබාදීම |
| | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | 7 | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |

# 08 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## 8.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවීමේ අරමුණින් 1981 දී ලෝක බැංකු ආධාර යටතේ **ඉදිකිරීම් කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය** (CITP- Construction Industry Training Project) පිහිටුවන ලද අතර එය 1986 දී නිමා කරන ලද්දේ එහි ප්‍රධාන කාර්යාලය ලෙස **ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය** (ICTAD-Institute for Construction Training and Development) 1957 දරණ රාජ්‍ය කර්මාන්ත සහ සංස්ථා පනත යටතේ පිහිටුවමිනි.

ඉන් අනතුරුව ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන ආයතනය හා ICTAD හි නෛතික ආයතනය ලෙස 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ ප්‍රතිපදාන යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

### දැක්ම

ගෝලීය ප්‍රමිතීන් හා සමාන්තරව දිවෙන විශ්වාසනීය හා යෝග්‍ය වූ ඉදිකිරීම් කර්මාන්තයක් ශ්‍රී ලංකාවේ බිහි කිරිම.

### මෙහෙවර

ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය හරහා රෙගුලාසි පැනවීම, ශක්‍යතා වර්ධනය සහ නැංවීම මඟින් තිරසාර ජාතික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ගෝලීය හා දේශිය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය තුළින් ශක්තිමත් මෙන්ම වෘත්තීය තත්ත්වයෙන් යුතු කර්මාන්තයන් සහතික වීම තුළින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපායශීලි නායකත්වයක් ලබා දීම.

## 8.2 ප්‍රධාන කාර්යයන්

- ඉදිකිරීම් කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම.
- කොන්ත්‍රාත්කරුවන් ඇතුළුව පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තය සඳහා සම්මත ලංසු ලේඛන හා පිරිවිතර සකස් කිරිම.
- ඉදිකිරීම් කර්මාන්තයේ ශිල්පීන් පුහුණු කිරීම හා ලියාපදිංචි කිරිම.
- ඉදිකිරීම් කර්මාන්තයේ ආරවුල් සහ ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම සහ අවශ්‍ය පහසුකම් සැපයීම.

## 8.3 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන - 2024 (රු.මි) | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | (රු.මි) | (%) | |
| 1 | හඳුනාගත් ඉදිකිරීම් කටයුතු සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | 160 | 2100 | - | 123.19 | 77 | 118 |
| 2 | මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘතිය | 10 | - | 10 (භාණ්ඩාගාර අරමුදල) | 6.8 | 68 | 32 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | ඉදිකිරීම් කර්මාන්තයට ආරවුල් විසඳීමේ සේවා සැපයීම | 2 | 22 | - | 2.124 | 106.2 | 140.9 |
| 4 | ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන සේවා සැපයීම. | - | 800 | - | 0.542 | | 25.8 |
| 5 | ඉදිකිරීම් කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම | 1 | 500 | - | 1.57 | 157 | 76.2 |
| 6 | RPL වැඩසටහන හරහා ඉදිකිරීම් ශිල්පීන් සඳහා NVQ සහතිකය නිකුත් කිරීම | 10.35 | 750 | - | 5.687 | 55 | 55.8 |
| 7 | CETRAC - ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පී පාඨමාලා NVQ 04 – CEM (වසර 02) | 16 | | | 16 | 100 | 100 |
| 8 | CETRAC - ඉදිකිරීම් උපකරණ නඩත්තුව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව NVQ 05/06 (වසර 02 ½) | 6 | | | 1.86 | 31 | 46.6 |
| 9 | OTC - ඒකාබද්ධ අරමුදල් මඟින් පුනරුත්ථාපනය කරන්නන් 100 දෙනෙකු බැකෝ ලෝඩර් ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම | 3.50 | 100 | 0.7 (භාණ්ඩාගාර අරමුදල) | 0.7 | 20 | 20 |
| 10 | OTC - ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (මාස 3) | 34.96 | 300 | - | 19.55 | 55.9 | 303.3 |
| 11 | CHPB - 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන | 29.975 | 73 | - | 29.975 | 100 | 100 |
| 12 | CHPB - සම්මන්ත්‍රණ සහ වැඩමුළු | 4.8 | 1200 | - | 3.932 | 81.9 | 69.6 |

## 8.4 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබා ගත් ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

- **ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණිගත කිරීම් හා අධීක්ෂණය කිරීම**

මේ වන විට ගොඩනැගිලි හා සිවිල් අංශයෙන්, විදුලි හා යාන්ත්‍රික අංශයෙන් සහ විශේෂිත අංශයෙන් යන ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් යටතේ ලියාපදිංචිය ලබාගත් මුළු කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 4000 ක් වේ.

- **ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තිකයින් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීමට කටයුතු කිරීම**

පෙදරේරු, වඩු කාර්මික, කම්බි නැවුම්කරු, ජලනල කාර්මික හා පිහන් ගඩොල් ඇතුරුම්කරු යන ක්ෂේත්‍ර යටතේ ඉදිකිරීම් ශිල්පීන් 418 කට පමණ NVQ සුදුසුකම් ලබාදී රැකියා අවස්ථා ලබාදීමට කටයුතු කර ඇත.

- **ඉදිකිරීම් ශිල්පී හැඳුණුම්පත් නිකුත් කිරීම**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශිල්ප කාණ්ඩ 26ක් යටතේ NVQ සුදුසුකම් නිපුණ ශිල්පීන් සඳහා හැඳුණුම්පත් ලබාදීමේ වැඩසටහන ආරම්භ කොට ක්‍රියාත්මක වෙමින් පවතියි. මේ වන විට 278ක් හැඳුනුම්පත් ලබාදී ඇත.

- **13 වසර අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන**

13 වසර අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ පහත ක්ෂේත්‍ර වල පුහුණුව ලබාදී පුහුණුවන්නන් රැකියා සඳහා යොමුකර ඇත.

ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ මෙහෙයුම් ශිල්පී - 87
ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මික ශිල්පී - 54
අභ්‍යන්තර අලංකරණ ශිල්පී/ භූ දර්ශන සංවර්ධන සහකාර/
ඉදිකිරීම් වැඩබිම් සුපරීක්ෂක - 73

- **ඉදිකිරීම් කර්මාන්තයේ යන්ත්‍රෝපකරණ මෙහෙයුම් ශිල්පී / කාර්මික ශිල්පී වෘත්තිකයින් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීමට කටයුතු කිරීම**

ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරුවන් (මෙහෙයුම් ශිල්පීන්) 406කට අධික ප්‍රමාණයක් දැනට පුහුණු කර ඇත. NVQ 4 රාමුව යටතේ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ තාක්ෂණ ශිල්පීන් 120දෙනෙකු ක්ෂේත්‍ර ගත කර ඇත.

## 8.5 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය/වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය |
|---|---|---|---|---|
| කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | හඳුනාගත් ඉදිකිරීම් කටයුතු සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | 210 | | 4000 (කොන්ත්‍රාත්කරුවන් ගණන) |
| ජාතික ඉදිකිරීම් සම්මාන (2022/2023) | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ඉදිකිරීම් සම්මාන පිරිනැමීම | 2.2 | | 43 (සම්මාන ගණන) |
| සංවර්ධන වැඩසටහන් | මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘතිය | 20 | භාණ්ඩාගාර අරමුදල් | 100% |
| ආරවුල් විසඳීමේ සේවාව | ඉදිකිරීම් කර්මාන්තයට ආරවුල් විසඳීමේ සේවා සැපයීම | 2 | | 22 (ආරවුල් සංඛ්‍යාව) |
| උපදේශන සේවා | ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන සේවා සැපයීම. | 0.5 | - | 300 (උපදේශන සංඛ්‍යාව) |
| ශිල්පීන් ලියාපදිංචිය සහ බලපත්‍ර ලබා දීම | ඉදිකිරීම් කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම | 3 | | 1000 (බලපත්‍ර සංඛ්‍යාව) |
| ඉදිකිරීම් ශිල්පී පුහුණුව හා නිපුණතා සහතික නිකුත් කිරීම | RPL වැඩසටහන හරහා ඉදිකිරීම් ශිල්පීන් සඳහා NVQ සහතිකය නිකුත් කිරීම | 11.7 | | 850 (සහතික පත් ගණන) |
| ඉදිකිරීම් ශිල්පී පුහුණුව හා නිපුණතා සහතික නිකුත් කිරීම | CETRAC - ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පී පාඨමාලා (CEM) NVQ 04 (වසර 02) | 4.5 | භාණ්ඩාගාර අරමුදල් | 60 (සහතික පත් ගණන) |
| ඉදිකිරීම් ශිල්පී පුහුණුව හා නිපුණතා සහතික නිකුත් කිරීම | CETRAC - ඉදිකිරීම් උපකරණ නඩත්තුව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව NVQ 05/06 (වසර 02 ½) | 6 | | 30 (සහතික පත් ගණන) |
| ඉදිකිරීම් ශිල්පී පුහුණුව | OTC - ඒකාබද්ධ අරමුදල් මඟින් පුනරුත්ථාපනය කරන්නන් 100 දෙනෙකු බැකෝ ලෝඩර් ක්‍රියාකරුවන් ලෙස පුහුණු කිරීම | 1 | භාණ්ඩාගාර අරමුදල් | 33 (පුහුණුලාභින් සංඛ්‍යාව) |
| ඉදිකිරීම් ශිල්පී පුහුණුව | OTC - ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (මාස 3) | 20.96 | | 500 (පුහුණුලාභින් සංඛ්‍යාව) |

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යාපන වැඩසටහන | CHPB - 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන | 4.80 | | 60 (පුහුණුලාභීන් සංඛ්‍යාව) |
| ඉදිකිරීම් ක්ෂේත්‍රයට හා වෙනත් ක්ෂේත්‍රයන්ට අදාළ වැඩසටහන් | CHPB - සම්මන්ත්‍රණ සහ වැඩමුළු | 7 | | 1400 (පුහුණුලාභීන් සංඛ්‍යාව) |

## 8.6 වෙනත් කරුණු

- ඉදිකිරීම් කර්මාන්ත ශිල්පීන් පුහුණු කිරීමේ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීම
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම
- ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ ජාතික උපදේශක සභාව පිහිටුවීම
- ඉදිකිරීම් කර්මාන්තය මුහුණු පාන ගැටළු සම්බන්ධයෙන් පිළියෙල කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය හා අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් කමිටුව පත් කිරීම
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ඉදිරියටත් සව්සිරිපාය ගොඩනැගිල්ල තුළ පවත්වාගෙන යාම සම්බන්ධව වර්තමාන තත්ත්වය
- කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට එරෙහිව ක්‍රියාත්මක වන නීතිමය කටයුතු වලට නීතිපතිවරයාගේ සහය ලබාගැනීමට අවශ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම

# 09 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## 9.1 හැඳින්වීම

2008 අංක 36 දරණ පනත ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇත. මෙම අධිකාරිය විසින් භෞතික සංවර්ධන හා සමාජ සංවර්ධන ලෙස දෙවැදෑරුම් ප්‍රවේශයන් ඔස්සේ නිවාස ව්‍යාපෘතින් හා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

### දැක්ම

"සාඩම්බර ජීවිතයක් උදෙසා තිරසර නාගරික ජනාවාස ගොඩනැගීම"

### මෙහෙවර

"සුසැදි, සංයුක්ත හා සුරැකි බව රැඳුණු නාගරික ජනාවාස ගොඩනැගීම සහ භෞතික, සාමාජීය සහ ආර්ථික වශයෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම"

### භෞතික සංවර්ධන වැඩසටහන

භෞතික සංවර්ධන වැඩසටහන යටතේ නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාවන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය නිවාස හා අනෙකුත් යටිතල පහසුකම් සැපයීම, ප්‍රමිතියෙන් තොර නිවාස ඒකක වැඩිදියුණු කිරීම සඳහා ඉඩම් හිමි නමුත් විධිමත් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකි පුද්ගලයන්ට මූල්‍ය පහසුකම් සහ ඉදිකිරීම් උපදෙස් ලබාදීම සඳහා ව්‍යාපෘති සිදු කෙරේ. තවද, නැවත ප්‍රතිලාභීන් ස්ථානගත කිරීමේ දී නිදහස් කර ගන්නා ලද ඉඩම් නැවත ආයෝජනය කිරීමට අවස්ථාව ලබාදෙමින් රජයට ආදායම් උපදවන ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට ද අපේක්ෂා කෙරේ.

එසේම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ප්‍රවේශය යටතේ දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කෙරේ.

### සමාජ සංවර්ධන වැඩසටහන

සමාජ සංවර්ධන වැඩසටහන යටතේ නාගරික අඩු පහසුකම් ප්‍රජාවගේ සාමාජීය, ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතිකමය වශයෙන් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔවුන් තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ඔවුන්ව ස්වශක්තියෙන් යුතුව ඔසවා තැබීමට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කෙරේ.

## 9.2 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය 2024.12.31 දිනට

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන - 2024 (රු.මි.) | ප්‍රගතිය | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | (%) | |
| **භෞතික සංවර්ධන වැඩසටහන** | | | | | | | |
| 1 | නිම කරන ලද ව්‍යාපෘතිවල අතිරේක වැඩ කොටස් | 227.66 | 1,713 | 227.66 | 9.00 | 3.95 | 31 |
| **මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති (මූලික අනුමැතීන්/ නිශ්කාෂන ලබා ගැනීම හා ඉඩම් පවරා ගැනීම)** | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | වත්තල, වැලිසර නිවාස ව්‍යාපෘතිය | 8,342.00 | නිවාස ඒකක - 408 | 54.65 | 2.40 | 4.39 | 2 |
| 3 | නිට්ටඹුව, ඔර්වර්ඩ් වත්ත නිවාස ව්‍යාපෘතිය | 2,412.00 | නිවාස ඒකක - 130 | 46.45 | 0.421 | 1 | 15 |
| 4 | ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය | 8,278.00 | නිවාස ඒකක - 168 | 7.10 | 0.12 | 2 | - |
| 5 | හික්කඩුව, තුඩුවේගොඩ නිවාස ව්‍යාපෘතිය | 5,884.45 | නිවාස ඒකක - 200 | 12.90 | - | - | 1 |
| 6 | කඩුවෙල මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය | 4,020.00 | නිවාස ඒකක - 108 | 7.71 | - | - | - |
| 7 | අතුරුගිරිය නිවාස ව්‍යාපෘතිය | 4,205.00 | නිවාස ඒකක - 112 | 62.07 | - | - | 0.01 |
| 8 | නව ඉඩම් හඳුනා ගැනීම | 1.00 | - | 1.00 | - | - | - |
| **සමාජ සංවර්ධන වැඩසටහන** | | | | | | | |
| 9 | සමාජ සංවර්ධන වැඩසටහන (ප්‍රජා සවිබලකරණ වැඩසටහන, අධ්‍යාපන වැඩසටහන, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, සමාජ සංස්කෘතික වැඩසටහන) | 20.36 | 11,397 | 20.36 | 6.04 | 30 | 68 |
| **වෙනත් වැඩසටහන්** | | | | | | | |
| 10 | ලෝක ජනාවාස දිනය | 5.00 | - | 5.00 | 4.07 | 81 | 81 |
| 11 | නා.ජ.සං.අ. විසින් පවත්වනු ලබන ව්‍යාපෘතිවල සංකල්පය සමාජගත කිරීම | 5.00 | - | 5.00 | 0.029 | 1 | 0.1 |

## 9.3 2024 වර්ෂයේ දී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ලබා ගත් ජයග්‍රහණ

- ලුනාව නිවාස ව්‍යාපෘතිය සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපළක් ලෙස ප්‍රකාශ කිරීමේ අවසන් සහතිකය ලබා ගන්නා ලදී.
- මෙම අධිකාරිය විසින් ජනතා අයිතියට පත්කරන ලද නිවාස ව්‍යාපෘතින්හි හිමිකම් ඔප්පු මෙම වසරේ දී ප්‍රතිලාභීන් හට ප්‍රදානය කරන ලදී.
- සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන පාරිසරික වැඩසටහන මගින් ජනාවාස 17ක දරු දැරියන් 1,000 දෙනෙකුගේ සහභාගීත්වයෙන් රුක් රෝපණ සහ ශ්‍රමදාන වැඩසටහන් ජනාවාස මට්ටමින් ප්‍රජා සමිති හා ළමා සමිති සම්බන්ධ කරගනිමින් සිදුකරන ලදී.







- එසේම, 38 වන ලෝක ජනාවාස දිනය මෙවරත් "තුරුණු ජවයෙන් සපිරි නගරයක්" යන තේමාව යටතේ පවත්වන ලදී.





## 9.4 මුහුණ දුන් අභියෝග

- භෞතික හා සමාජ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අධිකාරියේ මෙහෙයුම් ජාලය පුළුල් කළ යුතු වීම.
- නාගරික ඉලක්කගත ප්‍රතිලාභීන් හට දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා පවතින අභියෝග, නාගරික බල ප්‍රදේශවල පවතින ඉඩම් සීමිත වීම හා හඳුනා ගෙන ඇති ඉඩම් සංවර්ධනය කිරීමේ දී මුහුණපෑමට සිදුවන ගැටළු.
- ඉහළ ගොස් ඇති මූල්‍යමය වියදම (Finance Cost) හමුවේ සංවර්ධනකරුවන්ගේ සහභාගීත්වය අවම වීම.
- මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ ස්වයං උත්පාදිත ක්‍රමවේදයකට එළැඹීම සඳහා සකසන ලද "ව්‍යාපාර සැලසුම" ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටළු.

## 9.5 2025 වසරේ ක්‍රියාකාරී සැලසුම

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සබැඳි ප්‍රතිපත්තියට අනුකූලව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් භෞතික සංවර්ධන වැඩසටහන් හා සමාජ සංවර්ධන වැඩසටහන් 2025 වසරේ දී පහත පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය/ වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය (%) |
|---|---|---|---|---|
| නිමකරන ලද ව්‍යාපෘති | නිමකරන ලද ව්‍යාපෘතිවල අතිරේක වැඩ කොටස් | 74.81 | අභ්‍යන්තර ඉපැයීම් උපයෝජනය කෙරේ. | 100 |
| යෝජිත මධ්‍යම ආදායම් ව්‍යාපෘති (මූලික අනුමැතීන්/ නිශ්කාෂන ලබා ගැනීම හා ඉඩම් පවරා ගැනීම) | වත්තල, වැලිසර නිවාස ව්‍යාපෘතිය | 106.42 | අභ්‍යන්තර ඉපැයීම් උපයෝජනය කෙරේ. | 1.28 |
| | නිට්ටඹුව, ඔර්වර්ඩ්වත්ත නිවාස ව්‍යාපෘතිය | 120.30 | | 8.13 |
| | ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය | 137.07 | | 1.66 |
| | හික්කඩුව, තුඩුවේගොඩ නිවාස ව්‍යාපෘතිය | 116.10 | | 1.97 |
| | කඩුවෙල මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය | 29.13 | | 0.72 |
| | අතුරුගිරිය නිවාස ව්‍යාපෘතිය | 55.15 | | 0.25 |
| | නව ඉඩම් හඳුනා ගැනීම | 0.40 | | 100 |
| සමාජ සංවර්ධන වැඩසටහන | ප්‍රජා සංවර්ධන වැඩසටහන | 50.98 | ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන අපේක්ෂා කරයි. | 100 |
| | අධ්‍යාපනික වැඩසටහන | 11.85 | | |
| | ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 25.90 | | |
| | සමාජ සංස්කෘතික වැඩසටහන | 4.50 | | |
| | ලෝක ජනාවාස දින වැඩසටහන | 15.50 | | |
| වෙනත් වැඩසටහන් | නාගරික හා ජනාවාස ප්‍රතිපත්තිය | 10.00 | අභ්‍යන්තර ඉපැයීම් උපයෝජනය කෙරේ. | 100 |
| | නා.ජ.සං.අ. විසින් පවත්වනු ලබන ව්‍යාපෘතිවල සංකල්පය සමාජගත කිරීම | 20.00 | | |

# 10 සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

## 10.1 හැඳින්වීම

සහාධිපත්‍ය දේපළ වල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පාර්ශවකරුවන් ප්‍රමාණවත් පරිදි සපයා ඇති බවට සහතික කිරීම හා පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම, පාලනය හා පරිපාලනය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවීම, අධිකාරියේ ලියාපදිංචි කිරීම සහ සක්‍රියව ක්‍රියාත්මක කරවීමේ කටයුතු ඉටුකිරීම මෙම අධිකාරියේ කාර්යභාරයයි.

### දැක්ම

රටේ නිවාස අවශ්‍යතාව සඳහා විසඳුමක් ලෙස සහාධිපත්‍ය ජනාවාස.

### මෙහෙවර

සහාධිපත්‍ය දේපළ පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුබසාධනයට ගැලපෙන පරිදි ඉදිකිරීම සහ එම දේපළ ක්‍රමවත්ව පාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවා දේපළ නඩත්තු කරවීම සහ කාර්යයන් නියාමනය කිරීම.

## 10.2 ප්‍රගතිය 2024

- 2024.12.31 දිනට රු.මි. 281.55ක වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව රු.මිලි. 272.034ක මුදලක් එකතු කරගැනීමට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හැකි වූ අතර එය ඉලක්කගත ප්‍රගතියෙන් 97%ක කාර්යසාධනයකි.
- 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය සඳහා ශුද්ධ ලාභ ආන්තිකය 41%ක් සහ මෙහෙයුම් වියදම් 68%ක් ලෙස වාර්තා විය.
- සහාධිපත්‍ය දේපළවල පොදු අංගෝපාංග හා පොදු උපාංග සම්බන්ධයෙන් අධිකාරිය වෙත 2024 වසරේ දී පැමිණිලි 2,612ක් ලැබී ඇති අතර 2024 දෙසැම්බර් 31 දිනට ඉන් 2,423ක් සම්පූර්ණයෙන්ම විසඳන ලදී.
- මහල් නිවාස අයිතිය පිළිබඳ පනත සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත සඳහා යෝජිත සංශෝධන අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සහ සකස් කිරීම පිණිස නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

| # | ක්‍රියාකාරකම | ඇස්තමේන්තුගත | | | 2024.12.31 දිනට ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | සහතික ගණන | නිවාස ඒකක ගණන | ආදායම (රු.මිලි.) | සහතික ගණන | නිවාස ඒකක ගණන | ආදායම (රු.මිලි.) | ආදායම (%) |
| **1** | **සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම** | | | | | | | |
| i | තාවකාලික | 01 | 75 | 4.78 | 04 | 36 | 0.141 | 3 |
| ii | අර්ධ | 02 | 225 | 5.36 | 01 | 96 | - | - |
| iii | අවසන් | 50 | 2,000 | 144.72 | 75 | 7,032 | 142.45 | 98 |
| iv | මූලික සැලසුම් නිෂ්කාශන සහතික (25%) | 52 | 4,000 | 24.36 | 75 | 1,665 | 52.19 | 214 |
| v | අලුත් කිරීමේ ගාස්තු | 120 | - | 0.05 | 02 | 32 | 0.15 | 300 |
| | **එකතුව** | **225** | **6,300** | **179.27** | **157** | **8,861** | **194.93** | |

| # | ක්‍රියාකාරකම | ඇස්තමේන්තුගත | | | 2024.12.31 දිනට ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | කළමනාකරණ සංස්ථා ගණන | නිවාස ඒකක ගණන | ආදායම (රු.මි.) | කළමනාකරණ සංස්ථා ගණන | නිවාස ඒකක ගණන | ආදායම (රු.මි.) | ආදායම (%) |
| **2.1** | **කළමනාකරණ සංස්ථා/ කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීම** | | | | | | | |
| i | රාජ්‍ය අංශය | 09 | 800 | 0.032 | 04 | 168 | 0.005 | 16 |
| ii | පෞද්ගලික අංශය | 58 | 1,750 | 0.64 | 39 | 1,805 | 0.468 | 73 |
| **2.2** | **කළමනාකරණ සංස්ථා/ කළමනාකරණ කමිටු අලුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම** | | | | | | | |
| iii | රජ්‍ය අංශය | 200 | 6,000 | 0.744 | 177 | 2,933 | 0.341 | 46 |
| iv | පෞද්ගලික අංශය | 400 | 12,500 | 4.708 | 439 | 16,998 | 7.659 | 163 |
| | එකතුව | **667** | **21,050** | **6.124** | **659** | **21,904** | **8.473** | |

## 10.3 අභියෝග

- සහාධිපත්‍ය දේපළ කර්මාන්තය රටේ නිවාස අවශ්‍යතාවය කෙරෙහි නිසි ලෙස ඉලක්කගත නොවීම.
- අධිකාරියේ අරමුණ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විවිධ අරමුණු සඳහා පිහිටුවන ලද ආයතන විශාල ගණනක් සමඟ කටයුතු කිරීමට සිදු වීම.
- පෞද්ගලික අංශය මගින් ඉදි කරනු ලැබූ සහාධිපත්‍ය දේපළ ගැනුම්කරුවන්ගේ මිල දී ගැනීමේ ප්‍රවණතාවය අඩු වීම.
- සහාධිපත්‍ය දේපළ නඩත්තුව සඳහා ප්‍රජා සහාය අතිශය අවම මට්ටමක පැවතීම.
- ඉදිකිරීම් පිරිවැය අධිකවීම හේතුවෙන් මධ්‍යම පාන්තිකයින්ට සහ අඩු ආදායම්ලාභීන්ට එම නිවාස මිල දී ගැනීමට ඇති අපහසුතාවය.
- සහාධිපත්‍ය දේපළ නඩත්තු හා සේවා සපයන්නන්ගේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු.

## 10.4 ඉදිරි ඉලක්ක

- සහාධිපත්‍ය දේපල වල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග වලට අදාලව Clean Sri Lanka ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- සහාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තුව, පාලනය, පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට මග පෙන්වීම සහ නියාමනය.
- ඉදිකරමින් පවතින සහාධිපත්‍ය දේපළවල ප්‍රගතිය නියාමනය.
- නැවත සංවර්ධනය කළ යුතු දේපළ හඳුනාගැනීම සහ ඊට අදාල ප්‍රතිසංවර්ධන සැළසුම් රජයට ඉදිරිපත් කිරීම.
- හඳුනාගත් සහාධිපත්‍ය දේපළ ප්‍රතිසංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය ලබා ගැනීම හා එම දේපළවල අදාළ කාර්යයන් පෙළගැස්වීමට අදාළව යම් ප්‍රතිශතමය මුදලක් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලබා ගැනීම.
- සහාධිපත්‍ය ගැටළුවලට කාලෝචිත විසඳුම් ලබාදීම හා සහාධිපත්‍ය දේපළ නීතිය හා රෙගුලාසි යාවත්කාලීන කිරීම.
- සහාධිපත්‍ය දේපල හා එහි නීතිය සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

# 11 ඕෂන් වීව් සංවර්ධන (පුද්ගලික) සාමාගම

## 11.1 හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හා නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් හිමිකාරිත්වයෙන්, 1982 අංක 17 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පුද්ගලික සාමාගමක් ලෙස 1994 ජූලි මස 13 වන දින ලියාපදිංචි කර ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම පිහිටුවා ඇති අතර, එය පසුව 2007 අංක 07 සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ 2010 ජනවාරි මස 25 වන දින නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත.

### දැක්ම

දේපල සංවර්ධන වෙළඳපල තුල ප්‍රමුඛ දේපල සංවර්ධන සමාගමක් බවට පත්වීම.

### මෙහෙවර

ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මත පදනම්ව තරඟකාරී මිල ගණන් යටතේ සියළු පහසුකම් වලින් සමන්විත තනි නිවාස ඒකක මෙන්ම සහාධිපත්‍ය නිවාස පහසු මිලකට සපයා දෙමින් සෑම පවුලකටම සුව පහසු නිවාසයක් ලබා දීමේ ජාතික මෙහෙවරට දායකත්වය ලබා දීම

## 11.2 ප්‍රධාන කාර්යන්

- දේපළ සංවර්ධනය කිරීම හා විකිණීම.
- 'ඕෂන් ටවර්' ගොඩනැගිල්ල කළමනාකරණය කිරීම සහ එහි නිවාස ඒකක කුලී පදනම මත ලබා දීම.
- ප්‍රාග්ධන කොටස්කරුවන් වෙත ලාභාංශ ලබාදීම.

## 11.3 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් සමාගම මහ භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන නොලබන අතර අභ්‍යන්තර ඉපයීම් මගින් ආයතනයේ පුනරාවර්තන වියදම් ව්‍යාපෘති සහ සංවර්ධන කටයුතු සිදු කරගෙන යන ආයතනයකි.

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | (%) | |
| 01 | ඕෂන් ටවර් ගොඩනැගිල්ලට යාබද තෙමහල් ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම. | අභ්‍යන්තර ඉපයීම් (ඕ.වී.ඩී.සී) 20 + ආයෝජන 62 } 82 | 6.2 | 31 | 82 |
| 02 | ඕෂන් ටවර් ගොඩනැගිල්ලෙහි නිවාස ඒකක, විදුලි සෝපාන සහ අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම | 24.5 | 21.5 | 87.7 | 95 |
| 03 | ඕෂන් ටවර් ගොඩනැගිල්ලෙහි ව්‍යුහාත්මක අළුත්වැඩියාවන් සිදු කිරීම. | 33 | 1.4 | 4.2 | 45 |

## 11.4 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

**ලබාගත් ජයග්‍රහණ**

- "ඕෂන් ටවර්" ගොඩනැගිල්ලෙහි සියළුම නිවාස ඒකක කුලියට ලබාදීම.
- "ඕෂන් ටවර්" ගොඩනැගිල්ලේ පෝඩියම් කොටසේ සියළුම වාණිජ පරිශ්‍රයන් කුලියට ලබා දීම.

**අභියෝග**

- නිවාස ඒකක/ ඉඩම් විකිණීමේදී පුද්ගලික අංශය අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට නොහැකි වීම. (වට්ටම් ලබාදීම/ තැරැව්කරුවන් මාර්ගයෙන් විකිණුම් කටයුතු සිදු කිරීම.
- ගොඩනැගිලි ද්‍රව්‍ය මිල උච්චාවචනය වීම.

## 11.5 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය/වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය(%) |
|---|---|---|---|---|
| "ඕෂන් ටවර්" ගොඩනැගිල්ල කළමණාකරණය කිරීම | 1. ව්‍යුහාත්මක අලුත්වැඩියාවන් (ටවර් සහ පෝඩියම් ගොඩනැගිලි) | 53 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 2. ටවර් ගොඩනැගිල්ලේ නිවාස ඒකක වැඩිදියුණු කිරීම | 16 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 3. තොරතුරු තාක්ෂණ ආශ්‍රිත වැඩිදියුණු කිරීම් | 0.6 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 4. වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම | 0.8 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 5. නිල වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම | 0.6 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 6. විදුලි උත්පාදන යන්ත්‍ර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම | 1.5 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 7. ගිනි අනාවරණ සහ ආරක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම | 2 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 8. ටවර් සහ පෝඩියම් ගොඩනැගිලි තෙත් නිවාරණය කිරීම | 2 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | | | | 100 |
| කහතුඩුව නිවාස ව්‍යාපෘතිය අදියර II | 1. ඉදිකිරීම් (නිවාස ඒකක) | 176.50 | අභ්‍යන්තර ඉපයීම් | 100 |
| | 2. පොදු පහසුකම් වැඩිදියුණු කිරීම | 3.94 | අභ්‍යන්තර ඉපයීම් | 100 |

# 12 හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම

## 12.1 හැඳින්වීම

හිල්ටන් හොටෙල් කළඹුබු හෝටලයේ හිමිකාරීත්වය දරණ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් (HDL) 2011 අංක 43 දරණ ඌණ ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌණ උපයෝජිත වත්කම් පුනර්ජීවනය කිරීමේ පනත ප්‍රකාරව රාජ්‍ය භාණ්ඩාගාරය විසින් 100%ක කොටස් අයිතිය හිමි රජය සතු ව්‍යවසායක් වේ. කළමනාකරණ ගිවිසුමක් යටතේ හිල්ටන් ඉන්ටනැෂනල් කෝපරේෂන් (හිල්ටන් වර්ල්ඩ්වයිඩ්) මගින් හිල්ටන් කළඹුබු කළමනාකරණය කරනු ලබයි.

1987 වර්ෂයේ දී කළමනාකරණ ගිවිසුම ක්‍රියාත්මක කරමින් අන්තර්ජාතික හෝටල් ක්‍රියාකාරීන් වන හිල්ටන් මැනේජ්මන්ට් කෝපරේෂන් (හිල්ටන් වර්ල්ඩ්වයිඩ්) විසින් සමාගමේ මෙහෙයුම් කටයුතුවල භාරකාරීත්වය දරනු ලබයි. 2012 වර්ෂයේ දී ගිවිසුම නැවත සාකච්ඡාවට ලක්කරන ලද අතර 2012 ඔක්තෝබර් 18 දින සිට 2019 වර්ෂය දක්වා නව කළමනාකරණ ගිවිසුමක් ක්‍රියාත්මක කරනු ලැබිණි. පසුව ආයෝජන ඉවත් කරගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් කෙටි කාල සීමාවන්වලට දීර්ඝ කර ඇති අතර වර්තමානයේ දී මෙම ගිවිසුම 2026 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර ඇත.

### දැක්ම

ආගන්තුක සත්කාරක ව්‍යාපාරයේ තිරසර විශිෂ්ටත්වය සමග ශ්‍රේෂ්ඨව නැගීසිටීම

### මෙහෙවර

ලොව අංක එකේ හෝටල් ක්‍රියාකරු ලෙස සමාගමට ස්ථාවර වටිනාකමක් නිර්මාණය කරමින් කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ ඉහළ නංවමින් සහ කලාපයේ නැගී එන සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම මගින් කොටස් හිමියන්ගේ ධනය උපරිම කිරීම

## 12.2 උපාය මාර්ගික අරමුණු

### කෙටිකාලීන

- කෙටිකාලීන කළමනාකරණ ගිවිසුම නැවත සාකච්ඡාවට ලක්කිරීම සහ අළුත් කිරීම ද (2025 දෙසැම්බර් මස තුළ කාලය අවසන් වීම)
- මූල්‍ය වියදම් අඩු කිරීම සහ මුදල් ප්‍රවාහයන් වර්ධනය කිරීම සඳහා ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම: පොලී වියදම අඩු කිරීම සඳහා රු.බිලි. 3ක් වූ මහජන බැංකු ණය කොටසක් නැවත මූල්‍යණය කිරීම
- MICE මෙහෙයුම් කටයුතු වර්ධනය කිරීම සඳහා පවතින මා(ර්)කී (marquee) ප්‍රතිසංස්කරණය කිරීම (රු.මිලි. 100)
- ආහාර පිරිවැය සම්බන්ධ වටිනාකම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක් හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම (ඉලක්කය සියයට 34කි)

### මධ්‍යකාලීන

- ශ්‍රී ලාංකීය අවන්හල ඉදිකිරීම
- ඉතිරි විධායක ගණයේ මහල් 5හි ප්‍රතිසංස්කරණය අවසන් කිරීම
- ප්‍රධාන උත්සව ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම
- නව ෆියුෂන් ජපන් අවන්හලක් විවෘත කිරීම

**දිගුකාලීන**

- මහල් 19කින් යුතු තුන්වන කුළුන ඉදිකිරීම
- හිල්ටන් ස්පෝර්ට්ස් සෙන්ටර් ඉඩමේ ඉදිකිරීමට නියමිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධනය රැස් කිරීම

## 12.3 මූල්‍යමය ප්‍රගතිය

| රු.මිලි. | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 5,241 | 4,228 | 2,887 | 1,178 | 1,081 | 2,879 | 2,911 | 3,015 |
| වෙනත් ආදායම් | 55 | 31 | 225 | 42 | 36 | 32 | 70 | 55 |
| මුළු මෙහෙයුම් වියදම | (4,453) | (4,078) | (2,984) | (1,676) | (1,574) | (2,596) | (2,565) | (2,426) |
| මෙහෙයුම් ලාභය / (අලාභය) | 843 | 181 | 128 | (455) | (456) | 314 | 415 | 644 |

## 12.4 2024 වර්ෂයේදී විශේෂ ජයග්‍රහණයන්

- 2024 නොවැම්බර් අවසන් වන විට අමුත්තන්ගේ කාමර 264ක් සාර්ථකව ප්‍රතිසංස්කරණය සිදුකර අවසන් කිරීම
- ස්පෝර්ට් සෙන්ටර්හි ග්‍රෑන්ඩ් මා(ර්)කි (Grand Marquee) හඳුන්වා දීම
- නව විවෘත සංකල්පයක් ලෙස “ලොටස් ලවන්” ( “Lotus Lawan”) නමින් රැස්වීම් අවකාශයක් හඳුන්වා දීම.
- ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතික කිරීම්
    - ISO 22000 : 2018 ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති
    - HACCP
- වැඩ කිරීම සඳහා සුදුසුම ස්ථානය සම්මාන - 2023
- SLIM Kanter සම්මාන - 2023

## 12.5 2025 වර්ෂය සඳහා සැලසුම්

- සමාගමේ ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ සැලසුම - රජයේ නව ප්‍රතිපත්තිමය තීරණය ලැබෙන තෙක් බලා සිටීම
- ප්‍රාග්ධනය අඩු කිරීම - 2025 වර්ෂයේ සිට ඉදිරියට භාණ්ඩාගාරය වෙත ලාභාංශ ගෙවීම සඳහා පහසුකම් සැලසීමට ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සම්බන්ධයෙන් සමාගමට හැකියාව ලැබීම සඳහා
- කළමනාකරණ ගිවිසුම - භාණ්ඩාගාර ලේකම්ගේ අභිලාෂය සමග 2026 දෙසැම්බර් 31 දින දක්වා ගිවිසුම දීර්ඝ කිරීම සිදුකර ඇත.
- ස්පෝර්ට් සෙන්ටර් කල්බදු ගිවිසුම - දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් හිමිකාරීත්වය ලබා ගෙන තිබුණු අතර කල්බදු ගිවිසුම අත්සන් කිරීම සිදු කිරීමට නියමිතව ඇත. ආයෝජන ඉවත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් රු.බිලි. 4.4ක වාරිකය ගෙවීම කැබිනට් අනුමැතියකින් විලම්භනය කර ඇත.
- උත්සව අවස්ථාවන්/ සිදුවීම් සහ MICE (රැස්වීම්/ දිරිගැන්වීම්/ සම්මන්ත්‍රණ සහ සිදුවීම්) සඳහා පහසුකම් පුළුල් කිරීමට - උත්සව අවස්ථාවන් සහ MICE මෙහෙයුම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා සහ ලාභදායීත්වය උපරිම කිරීමට නවතම ප්‍රතිසංස්කරණ කරන ලද අමුත්තන්ගේ කාමර හරස් විකුණුම් ක්‍රමයට අලෙවි කිරීම.

# 13 රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

## 13.1 හැඳින්වීම

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1962 දී පිහිටුවන ලද අතර, CIDA හි CS1 වර්ගීකරණය සහිත රාජ්‍ය අංශයේ ඉංජිනේරු සංවිධානයක් වේ. අප ආයතනය විසින් පුද්ගලික අංශයේ කොන්ත්‍රාත්තු මෙන්ම රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි වැනි රජයේ කොන්ත්‍රාත්තු ද ක්‍රියාත්මක කරනු ලබයි.

අප ආයතනය ගොඩනැගිලි ඉදිකිරීම් සිවිල් ඉංජිනේරුමය හා වාස්තු විද්‍යාත්මක කටයුතු, උපදේශන සේවා සැපයීම, යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු සේවා සැපයීම, මාර්ග හා පාලම් ඉදිකිරීම සඳහා ISO 9001:2008 සහතිකය ද ලබාගෙන ඇත.

### දැක්ම

''ඉංජිනේරු ව්‍යාපාරයේ ප්‍රමුඛයා බවට පත්වීම''

### මෙහෙවර

"සමෘද්ධිමත් ව්‍යාපාරයක් තුල සේවාදායක සංතෘෂ්ඨිය පවත්වා ගනිමින් තරගකාරී සහ උද්යෝගිමත් ශ්‍රම බලකායක සහභාගීත්වයෙන් යුතුව පර්යේෂණ සහ සංවර්ධනය තුලින් සහාය වනු ලබන අතිවිශිෂ්ට උපදේශක සේවා, ඉදිකිරීම්, නිෂ්පාදන සහ ව්‍යාපෘති කළමණාකරණ සේවා තුලින් නිර්මාණශීලී සහ ඒකාබද්ධ ඉංජිනේරුමය විසුඳුම් සම්පාදනය කර ජාතික සංවර්ධනයට දායකත්වය සැලසීම"

## 13.2 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ හෝ එතෙර ඕනෑම පාර්ශවයකට අයත් ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු සහ වෙනත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය කිරීම, සැලසුම් කිරීම සහ ඉදිකිරීම, ස්වාධීනව හෝ ඕනෑම දේශීය හෝ විදේශීය සමාගමක් සමඟ සහයෝගයෙන් සහ එවැනි ඕනෑම සමාගමක කොටස් අත්පත් කර ගැනීම සහ තබා ගැනීම.
- ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සියලුම ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාව, ස්වාධීනව හෝ ඕනෑම දේශීය හෝ විදේශීය සමාගමක් සමඟ සහයෝගයෙන් ඕනෑම පාර්ශවයකට ලබා දීම සහ එවැනි ඕනෑම සමාගමක කොටස් අත්පත් කර ගැනීම සහ තබා ගැනීම.
- ස්වාධීනව හෝ ඕනෑම දේශීය හෝ විදේශීය සමාගමක් සමඟ සහයෝගයෙන් දේපල සංවර්ධනය කිරීම සහ එවැනි ඕනෑම සමාගමක කොටස් අත්පත් කර ගැනීම සහ තබා ගැනීම.
- පෙරනිමි මිශ්‍ර කොන්ක්‍රීට්, ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් සහ පූර්ව ආතති කොන්ක්‍රීට් නිෂ්පාදන ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි නිෂ්පාදනය කර විකිණීම.
- ඉංජිනේරු ව්‍යාපෘති/ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නිෂ්පාදනය, විකිණීම, ආනයනය සහ අපනයනය.
- ඉහත ඡේදවල සඳහන් කර ඇති අරමුණු සඳහා අවශ්‍ය ඉංජිනේරු සහ තාක්ෂණික පිරිස් පුහුණු කිරීම.
- ඉහත පළමු ඡේද 4 හි සඳහන් අරමුණු සඳහා භාවිතා කරන ඉදිකිරීම් ද්‍රව්‍ය, ක්‍රම සහ ශිල්පීය ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.

## 13.3 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

| අ. අ | ව්‍යාපෘතියේ නම | මුලු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 (මිල උච්ඡාවචනය සමග) | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | % |
| 1 | පහසුකම් කළමණාකරණය, යාන්ත්‍රික හා විදුලි, විශේෂ ව්‍යාපෘති | 1,700.37 | 1,011.88 | 59 |
| 2 | උපදේශන | 244.50 | 220.00 | 89 |
| 3 | ඉදිකිරීම් හා උපාංග | 1,265.70 | 498.49 | 40 |
| | මුලු එකතුව | **3,210.57** | **1,730.37** | **53** |

## 13.4 ජයග්‍රහණ සහ මුහුණ දුන් අභියෝග

2024 වර්ෂයේදී අප ආයතනය විසින් පයාගල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, තෙල්දෙණිය උසාවි සංකීර්ණය, නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය (SCURP) කොළඹ 15 සහ ෆර්ගියුසන් පාර නිවාස ඒකක 750ඇතුළු වැදගත් ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව නිම කරන ලදී.



පයාගල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය



තෙල්දෙණිය උසාවි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

නමුත් 2024 වසර තුළ මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ රටේ පැවති ආර්ථික අර්බුදය තුළ ආනයන සීමා කිරීම්, ඩොලරයේ අගය උච්චාවචනය වීම වැනි තත්වයන් යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති බොහෝමයක් නතර වී හෝ අභියෝග රැසක් සමග ව්‍යාපෘතීන් පවත්වාගෙන යාමට සිදු වීම.
එම තත්වයන් යටතේ ව්‍යාපෘති බොහොමයක් තාවකාලිකව වසා දැමීම හේතුවෙන් ස්වයංපෝෂිත අර්ධ රාජ්‍ය සංවිධානයක් ලෙස, මෙම පෙර නොවූ විරූ තත්වයන්ට අනුවර්තනය වීම සඳහා අපගේ මූලික ව්‍යාපාර සැලැස්මෙන් ඔබ්බට ගොස් ව්‍යාපාරික මෙහෙයුම් විවිධාංගීකරණය කිරීමට උත්සාහ කළෙමු.
ස්වේච්ඡා විශ්‍රාම වන්දි ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් ආයතනයේ සේවක සංඛ්‍යාව 550 දක්වා සහ වැටුප් වියදම රු.මි 59 දක්වා අඩු කරගෙන ඇත.

## 13.4 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම

| අ.අ. | ව්‍යාපෘතිය/වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි) | භෞතික ඉලක්කය |
|---|---|---|---|
| 1 | පහසුකම් කළමණාකරණය, යාන්ත්‍රික හා විදුලි, විශේෂ ව්‍යාපෘති | 792.40 | 100% |
| 2 | උපදේශන | 456.00 | 100% |
| 3 | ඉදිකිරීම් හා උපාංග | 1309.00 | 100% |
| | මුලු එකතුව | **2557.40** | |

| අ.අ | ව්‍යාපෘතිය/වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි) | භෞතික ඉලක්කය |
|---|---|---|---|
| 1 | කළුතර හෙද පුහුණු පාසල සඳහා අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 100.00 | 100% |
| 2 | ශ්‍රී ජයවර්ධනපුර හෙද පුහුණු පාසලේ යෝජිත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම | 85.00 | 100% |
| 3 | පූගොඩ උසාවි සංකීර්ණය ඉදිකිරීම | 230.00 | 100% |
| 4 | ගාල්ල උසාවි සංකීර්ණය ඉදිකිරීම | 145.00 | 100% |
| 5 | පුත්තලම, නොරොච්චෝලේ, ඉංජිනේරුවන් සඳහා පවුල් නිවාස අංක 10ක් සහ ඒකක හතරක නිවාස සංකීර්ණ අංක 2ක් ඉදිකිරීම | 28.00 | 100% |
| 6 | පල්ලෙකැලේ නව බන්ධනාගාර සංකීර්ණයේ නිල නිවාස සහ මූලික කටයුතු ඉදිකිරීම් වැඩබිම | 70.00 | 100% |
| 7 | ඇලුමිනියම් අංශය | 48.00 | 100% |
| 8 | සුගතදාස ක්‍රීඩාංගණය නඩත්තු කටයුතු | 16.80 | 100% |
| 9 | රේගු දෙපාර්තමේන්තුවේ නඩත්තු කටයුතු | 36.00 | 100% |
| 10 | භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව නඩත්තු කටයුතු | 21.60 | 100% |
| 11 | බර එසවුම් යන්ත්‍ර පරීක්ෂා කිරීම | 12.00 | 100% |
| 12 | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය (SCURP) කොළඹගේ මාවත නිවාස ඒකක 624 | 12.00 | 100% |
| 13 | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය (SCURP) ඇපල් වත්ත නිවාස ඒකක 700 | 28.80 | 100% |
| 14 | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය (SCURP) කොළඹ 15, ෆර්ගියුසන් පාර නිවාස ඒකක 750 | 28.80 | 100% |
| 15 | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය (SCURP) මාදම්පිටිය නිවාස ඒකක 700ක් | 28.80 | 100% |
| 16 | මාලබේ නිවාස ඒකක 256 | 12.00 | 100% |
| 17 | මාකුඹුර (කොට්ටාව) හි නිවාස ඒකක 314 | 12.00 | 100% |
| 18 | බොරලැස්ගමුවේ නිවාස ඒකක 120ක් සැලසුම් කිරීම | 12.00 | 100% |
| 19 | රුහුණු විශ්වවිද්‍යාලයේ දැනට පවතින ප්‍රධාන ගොඩනැගිල්ලේ I අදියරෙහි යෝජිත ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු | 0.9 | 100% |
| 20 | කොළඹ 06, බෙස්ලයින් පාරේ යෝජිත මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය | 15.95 | 100% |
| 21 | ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ වතුකරයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා නිවාස 10,000ක් ඉදිකිරීම සඳහා ඉන්දියානු රජයට උපදේශන සේවා සපයීමේ ව්‍යාපෘතිය | 12.00 | 100% |
| 22 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 2.00 | 100% |
| 23 | ශ්‍රී ලංකා පොලිසිය | 5.00 | 100% |
| 24 | ඒකල පෙරසවි අංගන වැඩබිම | 572.00 | 100% |
| 25 | රත්මලාන පෙරසවි අංගන වැඩබිම | 343.00 | 100% |
| 26 | දෙමටගොඩ සිල්පර නිෂ්පාදන වැඩබිම | 360.00 | 100% |
| 27 | දංකොටුව ගඩොල් නිෂ්පාදන වැඩබිම | 12.00 | 100% |
| 28 | මාතලේ ඩොලමයිට් නිෂ්පාදන වැඩබිම | 22.00 | 100% |

# 14 ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

## 14.1 හැඳින්වීම

2017 අංක 04 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) ස්ථාපනය කර ඇත.

**මෙම පනත මගින්,**

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්වය හා චර්යාව පවත්වාගෙන යාම සහ මෙහෙයවීමේ වගකීමටද,
- ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමටද,
- ඒ හා සම්බන්ධ කාරණා හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමටද , ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලබයි.

### දැක්ම

ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සහ රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකයෙකු වීම.

### මෙහෙවර

ජාත්‍යන්තරව පිළිගත්, දේශීය වශයෙන් අදාළ ප්‍රමිති, නිපුණතාවය සහ රටේ සංවර්ධනය උදෙසා වෘත්තීමය කැපවීම පවත්වාගෙන යාම හා නීත්‍යානුකූලව පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් විවිධ කාණ්ඩවල ලියාපදිංචි කිරීම.

## 14.2 ක්‍රියාකාරකම්

- **ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම**

2024 ඔක්තෝම්බර් 31 දින වන විට ලියාපදිංචි කර තිබෙන මුළු ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගණන 16,365 කි.

- **විදුලි කාර්මිකයින් ලියාපදිංචි කිරීම**

ශ්‍රී ලංකාවේ සියළුම විදුලි කාර්මිකයින් ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත. සුදුසුකම්ලත් විදුලි කාර්මිකයින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මික කාණ්ඩයේ ලියාපදිංචි කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිසම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි සමාගම සමඟ එක්ව අංක 2374/28 හා 2024 මාර්තු 7 දින දරණ ගැසට් නිවේදනය නිකුත් කර කරන ලදී. ඒ අනුව,

i. 2026 ජනවාරි 01 දින සිට 2029 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විදුලි කාර්මිකයෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැළීමට ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 3 මට්ටම (NVQ Level III) අවම සුදුසුකම ලෙස තිබීම අනිවාර්ය වේ.

ii. 2030 ජනවාරි 01 දිනෙන් පසුව, විදුලි කාර්මික ලෙස ඊට අදාළ කටයුතුවල නියැළීමට අවම වශයෙන් ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 4 මට්ටම (NVQ Level 4) සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

ශ්‍රී ලංකාවේ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ විදුලි කාර්මික ශිල්පයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම, ප්‍රවේසම සහතික කිරීම සහ ඉහළම වෘත්තීය මට්ටම පවත්වා ගෙන යැම සඳහා එම වෙනස්කම් සිදු කිරීමට තීරණය කරන ලදී.

විදුලි කාර්මිකයින්හට ජාතික වෘත්තීය නිපුණතා III වන හා IV වන මට්ටම ළඟා කර ගැනීමට රුකුලක් වනු පිණිස මහජන උපයෝගිතා කොමිසම, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග එක්වී නොමිලේ පාඨමාලා සහ ඇගයීම් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එයට අමතරව අනෙකුත් ක්ෂේත්‍රවල ඉංජිනේරු කාර්මිකයන් ලියාපදිංචි කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට විශේෂ කමිටුවක්ද පත් කර ඇත.

- **ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව, මහජන උපයෝගීතා කොමිෂන් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම**

ඉංජිනේරු කාර්මිකයන්ගේ (විදුලි, වැද්දුම් හා වායු සමීකරණ) තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුමක් ඇති කරගන්නා ලදී. එම සහයෝගිතා වැඩපිළිවෙලට, ඉංජිනේරු කාර්මිකයන්ගේ ගුණාත්මකභාවය හා වෘත්තිමය තත්වය වැඩි දියුණු කිරීම, ඔවුන්ගේ දායකත්වයට සමාජයේ පිළිගැනීමක් ඇති කිරීම, අඛණ්ඩ වෘත්තීමය වැඩිදියුණුව සඳහා අවස්ථා සලසා දීම සහ ඉංජිනේරු කාර්මිකයන්හට ව්‍යාපාරිකයන් වීමට ආධාර කිරීම යන කරුණු ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ.

- **ශ්‍රී ලංකාවේ සිටින විදේශ ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම**

විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් සැමවිටම අදාළ රාජ්‍ය නීති රෙගුලාසි හා ප්‍රමිතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු බවටත් ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය කිසි ලෙසකින්වත් එයින් නිදහස් කිරීමක් නොවන බවටත් දක්වන උපදෙස් ලියාපදිංචි සහතිකයේ ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී.

- **වරලත් ඉංජිනේරුවරුන් සඳහා පිරික්සුම් ලැයිස්තුවක් සකස් කිරීම**

උසස් තත්ත්වයේ සේවාවක් සහතික කිරීම පිණිස වරලත් ඉංජිනේරුවරුන්ගේ භාවිතය සඳහා සවිස්තරාත්මක පිරික්සුම් ලැයිස්තුවක් සකස් කිරීමට ඉංජිනේරු සභාව කටයුතු කරමින් පවතී.

- **ඉංජිනේරුවන් සඳහා විනය පරීක්ෂණ ක්‍රියාවලිය**

ඉංජිනේරුවන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සලකා බැලීම සඳහා ක්‍රියාවලියක් සකස් කර තිබේ. මෙම ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර සකස් කරමින් පවතී.

## 14.3 2025 වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන වැඩසටහන්

- ලියාපදිංචි කරන ඉංජිනේරු වෘත්තිකයන් සංඛ්‍යාව වැඩිකිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉංජිනේරු කාර්මිකයන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුළ සේවයේ යෙදී සිටින විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- දැනට ඉංජිනේරු ක්ෂේත්‍රයේ සේවය කරන ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේදී පැනනැගී ඇති ගැටළු IESL හා IIESL ආයතන සමඟ තවදුරටත් සාකච්ඡා කර හැකිතාක් දුරට විසඳා ගැනීම.

මෙම වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඉංජිනේරු සභාවේ අරමුදල් වලින් සපයා ගැනීමට සැලසුම් කර තිබේ.

# 15 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## 15.1 හැඳින්වීම

පානීය ජලය සැපයීමේ වගකීම මුල් වකවානුවේදී පොදු වැඩ දෙපාර්තමේන්තුවට (PWD) පැවරී තිබූ අතර 1965 දී එය ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය විය.
ඉන් අනතුරුව 1975 දී පාර්ලිමේන්තු පනතින් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය පිහිටුවන ලදී. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය දැනට ක්‍රියාත්මක වන්නේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය යටතේය.

### දැක්ම

තාක්‍ෂණික සහ සේවා විශිෂ්ටත්වය තුළින් ශ්‍රී ලංකාවේ වඩාත්ම කීර්තිමත් උපයෝගිතා සංවිධානය වීම.

### මෙහෙවර

සියලුම පාරිභෝගිකයින්ගේ තෘප්තිය සහතික කරමින් තිරසාර ජලය සහ සනීපාරක්ෂක විසඳුම් ලබා දීමෙන් ජාතියට සේවය කිරීම.

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යයන්

- දේශීය අරමුදල් සහ පරිත්‍යාගශීලීන්ගේ සහාය ඇතිව ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති සැලසුම් කිරීම, සහ ඉදිකිරීම.
- පාරිභෝගිකයින්ට සතුටුදායක සේවාවන් සැපයීම සඳහා ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
- දැරිය හැකි ගාස්තු සැකසීම හරහා බිල් කිරීම සහ එකතු කිරීම.
- ප්‍රජා මූල සංවිධාන (CBOs), පළාත් පාලන ආයතන, රාජ්‍ය ආයතන සහ පුද්ගලික/රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

## 15.2 මූල්‍ය ප්‍රගතියේ සාරාංශය (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය)-2024

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති සංඛ්‍යාව | උප ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන වෙන්කිරීම 2024 (රු. මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | වියදම (රු. මි.) | අතැති බිල්පත් (රු. මි.) | අතැති බිල්පත් සහිත වියදම (රු. මි.) |
| මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති | 10 | - | 45,610.25 | 12,979.30 | 12001.73 | 24,981.03 |
| මලාපවහන ව්‍යාපෘති | 03 | - | 3,360.00 | 677.66 | 144.00 | 821.66 |
| වෙනත් | - | - | 165.00 | 61.23 | 6.7 | 67.93 |
| ධාරිතාව වැඩි දියුණු කිරීමේ හා බෙදා හැරීම පුළුල් කිරීමේ ව්‍යාපෘති (CEDE) | 01 | 111 | 6,968.61 | 4,497.88 | 15.58 | 4,513.46 |
| උපයෝගිතා මාරු කිරීම | 01 | 10 | 100.00 | 40.68 | 0.56 | 41.24 |
| ඉඩම් අත්පත් කර ගැනීම | 01 | 26 | 200.00 | 151.44 | | 151.44 |
| **උප එකතුව** | **16** | **147** | **56,403.86** | **18,408.19** | **12,168.57** | **30,576.76** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මණ්ඩල අරමුදල් ව්‍යාපෘති | 05 | 05 | 16,130.87 | 13,301.74 | 6,434.41 | 19,736.15 |
| දේශීය බැංකු අරමුදල් සපයන ජල සම්පාදන ව්‍යාපෘති (LBF) | 08 | 08 | 10,348.00 | 652.00 | 198.50 | 850.50 |
| **උප එකතුව** | **13** | **13** | **26,494.00** | **13,953.74** | **6,632.91** | **20,586.65** |
| **එකතුව** | **29** | **160** | **82,897.86** | **32,361.93** | **18,801.48** | **51,163.41** |

## 15.3 ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය- 2024

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභී සංඛ්‍යාව (පවුල්) | 2024 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | | භෞතික (%) |
| | | | | | (රු. මි.) | % | |
| 1 | යාපනය - කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 35,881.49 | 60,000 | 9,208.25 | 5115.06 | 55.55 | 90.40 |
| 2 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර I | 11,515.00 | 25,000 | 1,272.95 | 255.52 | 20.07 | 99.10 |
| 3 | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - II | 13,917.00 | N/A | 5,122.80 | 8.58 | 0.16 | 99.00 |
| 4 | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - III | 7,232.00 | N/A | 5944.50 | 3649.02 | 61.38 | - |
| 5 | අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා ආයෝජන වැඩසටහන | 13,000.00 | N/A | 5,031.34 | 1387.59 | 27.58 | 91.45 |
| 6 | ආණමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 8,625.17 | 16,350 | | 15.80 | - | 78.80 |
| 7 | රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 6,291.00 | 6,500 | 2,505.00 | 251.62 | 10.04 | 70.70 |
| 8 | මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 51,324.25 | 72,000 | 14766.70 | 2000.96 | 13.55 | 88.75 |
| 9 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර II | 31,598.18 | 62,222 | 808.72 | 0.83 | 0.10 | 13.14 |
| 10 | කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය - පුළුල් කිරීම I | 55,338.00 | 500,994 | 700.00 | 279.71 | 39.96 | 5.44 |
| 11 | යාපනය ජල සම්පාදන ව්‍යාපෘතිය (පාලි ආරු) | 250.00 | | 250.00 | 30.41 | 12.38 | - |
| **එකතුව** | | | | **45,610.25** | **12,995.10** | | |

## 15.3.1. ක්‍රියාත්මක වෙමින් පවතින මහා පරිමාණ අපජල ව්‍යාපෘති -2024 (භාණ්ඩාගාර ප්‍රතිපාදන)

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභී සංඛ්‍යාව (පවුල්) | 2024 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | | භෞතික (%) |
| | | | | | (රු. මි.) | (%) | |
| 1 | මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 22,588.00 | 55,000 + 150,000 (floating) | 2,250.00 | 189.74 | 8.43 | 93.93 |
| 2 | නිරිතදිග ශ්‍රී ලංකාවේ නගර සඳහා සනීපාරක්ෂක සහ සනීපාරක්ෂක මුලපිරීම (SHIFT). | 17,664.95 | 153,000 | 100.00 | 0 | 0 | 12.31 |
| 3 | රත්මලාන/මොරටුව අපජලය I අදියර II අදියර | 16,073.00 | 45,500 | 1010.00 | 487.92 | 48.31 | 25 |
| එකතුව | | **56,325.95** | | **3,360.00** | **677.66** | | |

## 15.3.2. ධාරිතාව වැඩි දියුණුකිරීමේ හා බෙදාහැරීම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (CEDE ව්‍යාපෘති)

**( භාණ්ඩාගාර ප්‍රතිපාදන)**

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභී සංඛ්‍යාව (පවුල්) | 2024 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | | භෞතික (%) |
| | | | | | (රු. මි.) | % | |
| 1 | ධාරිතාව වැඩි දියුණු කිරීම සහ බෙදා හැරීමේ ව්‍යාපෘතිය / CEDE වැඩසටහන | 388,777.78 | 1,500,000 | 6,968.61 | 4,497.88 | 64.54 | 27.5 |

## 15.3.3. වෙනත් ව්‍යාපෘති ( භාණ්ඩාගාර ප්‍රතිපාදන)

| වැඩසටහන | ප්‍රතිපාදන වෙන් කිරීම - 2024 (රු. මි.) | 2024.12.31 වන දිනට වියදම (රු.මි.) |
|---|---|---|
| උපයෝගිතා මාරු කිරීමේ අරමුදල් | 100 | 40.69 |
| ඉඩම් අත්පත් කර ගැනීම | 200 | 151.44 |
| **එකතුව** | **300** | **192.13** |

## 15.3.4. ක්‍රියාත්මක මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති (මණ්ඩල අරමුදල්)

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභී සංඛ්‍යාව (පවුල්) | 2024 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | | භෞතික ප්‍රගතිය (%) |
| | | | | | (රු. මි.) | % | |
| 1 | ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 33,060.00 | 88,000 | 3059.73 | 1772.24 | 57.92 | 97.11 |
| 2 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | 15,840.67 | 25,000 | 7471.14 | 7432.52 | 99.5 | 86.81 |
| 3 | පොල්ගහවෙල, පොතුහර සහ අලව්ව ඒකාබද්ධ හා ජල සම්පාදන ව්‍යාපෘතිය | 20,207.80 | 38,000 | 1000.00 | 1015.42 | 101.5 | 94.56 |
| 4 | අළුත්ගම, මතුගම, අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 32,278.00 | 60,000 | 2500.00 | 1040.04 | 41.6 | 96.05 |
| 5. | මාතර අදියර 04 ජල සම්පාදන ව්‍යාපෘතිය | 18,208.07 | 60,000 | 2,100.00 | 2041.52 | 97.2 | 93.10 |
| එකතුව | | **119,595.00** | **271,000** | **16,130.87** | **13,301.74** | | |

## 15.3.5 ක්‍රියාත්මක දේශීය බැංකු අරමුදල් සපයන ජල සම්පාදන ව්‍යාපෘති (LBF)

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභී සංඛ්‍යාව (පවුල්) | 2024 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | | භෞතික (%) |
| | | | | | (රු.මි.) | % | |
| 1 | කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 | 5,170 | | 523 | - | - | 100 |
| 2 | කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - 2 | 4,823 | 91,000 | 1,928 | 121.00 | 6.3 | 98.6 |
| 3 | කොළඹ නැගෙනහිර නගර (පැකේජ් 3) ජල සම්පාදන ව්‍යාපෘතිය | 10,049 | | 2,606 | | - | 100 |
| 4 | ගාල්ල කලාප ජල සම්පාදන ව්‍යාපෘතිය | 1,755 | 11,395 | 1,075 | 75.00 | 7.0 | 100 |
| 5 | විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | 1,530 | 7,000 | 930 | - | - | 61 |
| 6 | විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය | 3,580.00 | 7,500 | 1,862 | 60 | 3.2 | 71.9 |
| 7 | ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය | 4,496 | 6,800 | 1,110 | 396 | 35.7 | 88.7 |
| 8 | ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය | 513 | 5,000 | 314 | - | - | 54.4 |
| එකතුව | | **31,916** | **128,695** | **10,348** | **652** | | |

## 15.4 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ක්‍රියාකාරී සැලැස්ම 2025

| අංකය | ප්‍රධාන විෂයය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය / වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රභවය |
|---|---|---|---|---|
| 1 | ජලය හා සනීපාරක්ෂාව | දැනට ක්‍රියාත්මක ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති | 80,738.24 | දේශීය අරමුදල් |
| 2 | ජලය හා සනීපාරක්ෂාව | ධාරිතාව වැඩි දියුණු කිරීම සහ බෙදා හැරීමේ වැඩසටහන (CEDE) | 11,000.00 | දේශීය අරමුදල් |
| 3 | ජලය හා සනීපාරක්ෂාව | කඩිනම් ප්‍රාදේශීය සහා මාර්ග සංවර්ධන වැඩසටහන හේතුවෙන් උපයෝගිතා මාරු කිරීම/ ප්‍රතිස්ථාපනය කිරීම | 110.00 | දේශීය අරමුදල් |
| 4 | ජලය හා සනීපාරක්ෂාව | ඉඩම් අත්පත් කර ගැනීම | 2,295.80 | දේශීය අරමුදල් |
| එකතුව | | | **94,144.04** | |

# 16 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

## 16.1 හැඳින්වීම

ජලය මූලික මිනිස් අයිතිවාසිකමකි. එම දැක්ම ඇතිව නිසි ප්‍රමිතියෙන් යුත් පානීය ජලය ලබාගැනීමට අපහසු ග්‍රාමීය ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා ප්‍රජා මූලික ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් රැසක් දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක වූ අතර, එසේ ආරම්භ කරන ලද ව්‍යාපෘති රාශියක් විවිධ ගැටළු හේතුවෙන් 2010 දශකය වන විට අක්‍රිය වීමේ අවදානමකට මුහුණ දී තිබුණි. එවක රජය මේ කාරණය හොඳින් අවබෝධ කරගෙන ප්‍රජා ජල ව්‍යාපෘතිවල තිරසාර බව තහවුරු කිරීමේ අරමුණින් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

2014 සැප්තැම්බර් මස 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරම්භ කරන ලද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූයේ ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය කිරීම සහ ඒවායේ තිරසාර බව සහතික කිරීමයි.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පානීය ජල සැපයුමෙන් 11% ක් ප්‍රජා ජල ව්‍යාපෘති මගින් ලබා දෙනු ලබන අතර, සපුරා ගන්නා අතර සමස්ත පවුල් සංඛ්‍යාව 650,183 කි.

### දැක්ම

තිරසාර ප්‍රජා ජල ව්‍යාපෘති මගින් සුරක්ෂිත පානීය ජලය ලබා දීම.

### මෙහෙවර

සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම, ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සනීපාරක්ෂාව සංවර්ධනය කිරීම, ප්‍රජා ජල සංවිධාන සවිබල ගැන්වීම සහ නියාමනය කිරීම, ජල මූලාශ්‍ර සහ පරිසරය සංවර්ධනය කිරීම සහ දෙපාර්තමේන්තුවේ ධාරිතාවයන් ගොඩ නැගීම යන භාරදූර කර්තව්‍යයේ ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස සියලුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය සම්පන්න සහභාගීත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුතුව ශ්‍රී ලාංකීය ජනගහනයේ ජලය සහ සනීපාරක්ෂක අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ හැකියාවන් ගොඩනැගීම.

## 16.2 ප්‍රධාන කාර්යයන්

- පානීය ජල සම්පාදනය හා සනීපාරක්ෂාව සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමට හා යාවත්කාලීන කිරීමට සහය ලබා දීම.
- අවශ්‍යතාවය ඇති ප්‍රදේශ සඳහා ප්‍රජා මූලික ජල ව්‍යාපෘති හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- අවශ්‍ය අවස්ථාවලදී ප්‍රජා මූලික ජල ව්‍යාපෘති වල ඉදිකිරීම්, කළමනාකරණ කටයුතු සහ ජල පිරිපහදුව සඳහා අවශ්‍ය මූල්‍ය, සහ තාක්ෂණික සහයෝගය ලබා දීම.
- ප්‍රජා මූලික ජල ව්‍යාපෘති වල තිරසාර බව තහවුරු කිරීම සඳහා සහභාගිත්ව ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම.
- ජල පෝෂක ප්‍රදේශ වැඩි දියුණු කිරීම සහ සංරක්ෂණය කිරීම හා ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම
- ප්‍රජා මූල සංවිධාන වල ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හදුනා නොගත් වකුගඩු රෝගය පැතිරී යන සහ පැතිර පවතින ප්‍රදේශ සඳහා ජල පිරිපහදු පද්ධති ඉදි කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- වැසි ජල එක්රැස් කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය භාවිතා කිරීම සහ භූගත ජලය පුණරාරෝපණය වැනි නව හඳුන්වා දීම් මගින් ප්‍රජා මූලික ජල ව්‍යාපෘති වල තිරසාරත්වය තහවුරු කිරීම.
- ජල සාම්පල පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙනත් රාජ්‍ය නොවන හා රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය සිදු කිරීම මගින් ප්‍රජා මූලික ජල ව්‍යාපෘති වල තිරසාරත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීම.

## 16.3 2024 වසරේදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු මි) | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2024 (රු මි) | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය (රු මි) | % | භෞතික ප්‍රගතිය % |
| 1 | ප්‍රජා ජල අභිමාණී වැඩසටහන යටතේ නව ජල ව්‍යාපෘති 179ක වැඩ අවසන් කිරීම | 7,645.96 | 47,667 | 1231 | 663 | 54 | 61% |
| 2 | පවතින ප්‍රජා මූල ජල ව්‍යාපෘති පුරුත්තාපනය කිරීම අවිච්ඡේද වැඩසටහන යටතේ ව්යාපෘති 74 ක් ක්‍රියාත්මක කිරීම | 427.33 | 20,178 | 213.29 | 255 | 51% | 85.0% |
| 3 | සනීපාරක්ෂක පහසුකම් සැපයීම අවිච්ඡේද වැඩසටහන යටතේ ව්‍යාපෘති 294 ක් ක්‍රියාත්මක කිරීම | 14.7 | 294 | 4.5 | | | 85.0% |
| 4 | පොදු සනීපාරක්ෂක පහසුකම් සැපයීම අවිච්ඡේද වැඩසටහන යටතේ ව්‍යාපෘති 8 ක් ක්‍රියාත්මක කිරීම | 25.06 | 5,000 | 7 | | | 95.0% |
| 5 | නැනෝ පිරිපහදු පද්ධති ස්ථාපනය කිරීම අවිච්ඡේද වැඩසටහන යටතේ ව්‍යාපෘති 30 ක් ක්‍රියාත්මක කිරීම | 85.49 | 7,277 | 35.35 | | | 82.0% |
| 6 | පවතින ප්‍රජා මූල ජල ව්‍යාපෘති පුරුත්තාපනය යටතේ ව්‍යාපෘති 68 ක් ක්‍රියාත්මක කිරීම | 218.49 | 13,662 | 218.49 | | | 34.0% |
| 7 | දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජල දිනය සැමරීම සඳහා වන වැඩසටහන් යටතේ ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කිරීම | 1 | 500 | 1 | | | 100.0% |
| 8 | ප්‍රජා මූල සංවිධානවල ධාරිතා සංවර්ධනය කිරීම යටතේ ව්‍යාපෘති 50ක් ක්‍රියාත්මක කිරීම | 5 | 5,250 | 5 | | | 100.0% |
| 9 | ආපදා අවස්ථාවලදී සහ අනෙකුත් හදිසි අවස්ථා වලදී ප්‍රජා මූල ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | 22 | 500 | 15.36 | | | 90.0% |
| 10 | භූගත ජලය පුනරාරෝපණය හා ජල ආරක්ෂණ සැලසුම් සකස් කිරීම සහ විගණනය කිරීම යටතේ ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කිරීම | 3 | 6,600 | 3 | 3 | 100 | 100% |
| 11 | වැසි ජල ටැංකි ස්ථාපනය කිරීම යටතේ ව්‍යාපෘති 5 ක්‍රියාත්මක කිරීම | 11.187 | 161 | 11.20 | 8.82 | 79 | 100% |
| 12 | ග්‍රාමීය ජල සම්පාදන වැඩසටහන යටතේ කෑගල්ල මැණික්කඩවර ජල ව්‍යාපෘතියේ පුනරුත්තාපන කටයුතු සිදු කිරීම | 54.33 | 800 | 50.00 | 24.25 | 70 | 70% |
| 13 | ග්‍රාමීය ජල සම්පාදන වැඩසටහන යටතේ කෑගල්ල මානින්ගලවත්ත ජල ව්‍යාපෘතියේ පුනරුත්තාපන කටයුතු සිදු කිරීම | 2.11 | 35 | 2.11 | | 100 | 100% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 14 | ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමේ වැඩසටහන | 3.6 | 1000 | 3.60 | 0.62 | 35 | 90% |
| 15 | වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ EDR යන්ත්‍රයක් ස්ථාපිත කිරීම | 29.53 | 1500 | 29.53 | 24.25 | 86.25 | 98% |
| 16 | යුනිසෙෆ් වැඩසටහන යටතේ කුරුණෑගල ගනේතැන්න ජල ව්‍යාපෘතිය සඳහා සූර්ය බල පද්ධතියක් ස්ථාපිත කිරීම | 5.66 | 1343 | 5.66 | 0.26 | 74.52 | 90% |
| | | **8,553** | **111767** | **1835** | **990** | **54%** | **87%** |

## 16.4 ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම

| අංකය | | ප්‍රධාන විෂයය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය (රුමි) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| **1** | | නව ජල ව්‍යාපෘති | ප්‍රජා ජල අභිමානී වැඩසටහන | 12,125.65 | ශ්‍රී ලංකා රජය | **100%** |
| **2** | i | පවතින ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම | පවතින ප්‍රජා ජල ව්‍යාපෘති 100ක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 600.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| | ii | | පවතින ප්‍රජා ජල ව්‍යාපෘතිවල ජලයේ ගුණාත්මය වැඩිදියුණු කිරීම | 200.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| | iii | | ජල මූලාශ්‍ර සුරැකීම සඳහා සනීපාරක්ෂක වැසිකිළි 200ක් ඉදිකිරීම | 15.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| | iv | | ප්‍රජා මූල සංවිධානවල ධාරිතා සංවර්ධනය කිරීම යටතේ ව්‍යාපෘති 50ක් ක්‍රියාත්මක කිරීම හා ප්‍රජා මූල සංවිධාන වල අවශ්‍යතා සඳහා උපකරණ ලබා දීම | 10.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| | v | | ආපදා අවස්ථාවලදී සහ අනෙකුත් හදිසි අවස්ථා වලදී ප්‍රජා මූල ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | 20.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| | vi | | දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජල දිනය සැමරීම සඳහා වන වැඩසටහන් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 10.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| 3 | | යුනිසෙෆ් වැඩසටහන | දේශගුණික වෙනස්කම් වලට ඔරොත්තු දෙන ප්‍රජා ජල ව්‍යාපෘති ඉදි කිරීම | 1.00 | ශ්‍රී ලංකා රජය | **100%** |
| **එකතුව** | | | | **12981.65** | | **100%** |

# 17 කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්

## 17.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සුවිශේෂී සන්ධිස්ථානයක් වන කොළඹ නෙළුම් කුළුණ, දකුණු ආසියාවේ උසම ස්වයං ආධාරක ව්‍යුහය වන අතර එය මීටර් 356 ක උසින් යුතුව කොළඹ අහසෙහි කැපී පෙනෙන අංගයක් බවට පත්ව තිබේ. එසේම ශ්‍රී ලංකාව තුළ වඩාත්ම කැපී පෙනෙන සන්ධිස්ථානයක් සහ ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් බවට මේ වන විට පත්ව ඇත.

කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ සමාගම, නෙළුම් කුළුණේ මෙහෙයුම් සහ වාණිජ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම දරණ අතර නෙළුම් කුළුණේ පහසුකම් සහ සේවාවන් කාර්යක්ෂම කළමනාකරණය සහ වාණිජකරණය සහතික කිරීම සඳහා මෙම සමාගම පිහිටුවන ලදී.

## 17.2 කොළඹ නෙළුම් කුළුණ පිළිබඳ දළ විශ්ලේෂණය

- ස්ථානය: කොළඹ, ශ්‍රී ලංකාව
- උස: මීටර් 356 (අඩි 1,168)
- ව්‍යුහය: තට්ටු 13ක් සහිත මිශ්‍ර භාවිත පහසුකම (පහළ පදනමේ 4, ටවර් හවුස්හි 9)
- සෝපාන සංඛ්‍යාව: 8
- වෙබ් අඩවිය: colombolotustower.lk
- පිරිවැය: ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 113 කි
- වැදගත්කම: දකුණු ආසියාවේ උසම ස්වයං ආධාරක ව්‍යුහය

## 17.3 ප්‍රධාන දිනයන්

| | |
|---|---|
| • සමාගම ලියාපදිංචිය: | 3 පෙබරවාරි 2022 |
| • CEIEC විසින් TRCSL වෙත භාරදීම: | 28 පෙබරවාරි 2022 |
| • කළමනාකරණ ගිවිසුම අත්සන් කරන ලදී: | 8 අගෝස්තු 2022 |
| • මහජන විවෘත කිරීම: | 15 සැප්තැම්බර් 2022 |
| • බදු ගිවිසුම අත්සන් කරන ලදී: | 10 අප්‍රේල් 2023 |

## 17.4 කොළඹ නෙළුම් කුළුණ වාණිජකරණය සහ ව්‍යාපාර උපාය මාර්ග සැළසුම

කොළඹ නෙළුම් කුළුණේ වාණිජකරණ උපායමාර්ගය අධ්‍යාපනය, තාක්ෂණය සහ විනෝදාස්වාදය යන ප්‍රධාන කුළුණු තුනක් මත ගොඩනගා ඇත. මෙම උපාය මාර්ගික රාමුව දැනුම හුවමාරු කිරීම, තාක්ෂණික දියුණුව සහ විවිධ විනෝදාස්වාදය සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස කුළුණ ස්ථාපිත කිරීම කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ සමාගම අරමුණු කරයි.

## 17.5 කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ සමාගම උපායමාර්ග

- අධ්‍යාපනය :

දැනුම හුවමාරු කර ගැනීමේ සහ ඉගෙනීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කුළුණ ස්ථානගත කිරීම.

- තාක්ෂණය:

අති නවීන තාක්ෂණික යුත් වාණිජ මධ්‍යස්ථානයක් ලෙස උසස් පහසුකම් සහිතව සංවර්ධනය කිරීම.

- විනෝදාස්වාදය:

කුළුණ ආශ්‍රිත, විවිධ විනෝද ක්‍රියාකාරකම් සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා ගමනාන්තයක් බවට පත් කිරීම.

**දැක්ම**

අපි විනෝදාස්වාදය සහ තාක්ෂණ ලෝකයේ ඉන්ද්‍රජාලික අවස්ථා නිර්මාණය කරමු.

**මෙහෙවර**

අපි විශ්මය ජනක විනෝදාස්වාදය සහ තාක්ෂණය සමඟ මිනිසුන් සතුටු කරන්නෙමු. සවිබල ගැන්වීම සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් සතුට ඇති කිරීමට අපි අපේ ජනතාව දිරිමත් කරමු. අපි විශිෂ්ටත්වයට සහ එකට වර්ධනය වීමට හවුල්කාරිත්වයන් ගොඩනගමු.

## 17.6 මූලික අගයන්

- නායකත්වය : නවෝත්පාදන සහ වෙනස්වීම් තුළින් ජාතිය සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම.
- හිමිකාරිත්වය : සාමූහික ප්‍රතිඵල සඳහා නිර්මාණශීලීත්වය සහ වගවීම සවිබල ගැන්වීම.
- විශ්වාසය : පාර්ශවකරුවන් සමඟ අවංක සහ ඒකාග්‍ර සබඳතා ගොඩනගා ගැනීම.
- එකමුතුකම : හවුල් දැක්මක් සහ පොදු අරමුණු සඳහා සහයෝගීතාවය.
- උද්යෝගිමත්බව : වර්ධනය අගය කරන සහ සාර්ථකත්වයන් සමරන සජීවී පරිසර පද්ධතියක් පෝෂණය කිරීම.

## 17.7 කොළඹ නෙළුම් කුළුණට මේ දක්වා පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යා ලේඛන

- නිරීක්ෂණ තට්ටුවේ මුළු නරඹන්නන්: 2,524,174 (2022 සැප්තැම්බර් 15 සිට - 2024 දෙසැම්බර් 31 දක්වා)
  - දේශීය නරඹන්නන්: 2,409,976
  - විදේශ නරඹන්නන්: 114,198
- Pixelbloom ඩිජිටල් කලා කෞතුකාගාරය නරඹන්නන්: 161,095 (2024 මැයි 8 සිට - 2024 දෙසැම්බර් 31)

## 17.8 අනාගත සැලසුම් ව්‍යාපෘති (2025)

### 17.8.1 Lotus Aqua Bay

ජලය මත පදනම් වූ විවිධ ක්‍රියාකාරකම්, විනෝදාස්වාදය සහ භෝජන අත්දැකීම් ලබා දෙන දිය ඇලි ආශ්‍රිත ආකර්ශණ ස්ථානයකි. එය බෝට්ටු සවාරි, ජල ක්‍රීඩා සහ පවුල් එකමුතු ක්‍රියාකාරකම් ඇතුළත් විවේක හා ත්‍රාසජනක ක්‍රීඩා කේන්ද්‍රස්ථානයක් වීම අරමුණු කරයි.

### 17.8.2 Go Bungy

ත්‍රාසජනක ක්‍රීඩා ඇලුම්කරන්නන් සොයන්නන් ආකර්ෂණය කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති කුළුණේ සිට ඇඩ්රිනලින් පොම්ප කරන Bungy පැනීමේ අත්දැකීමක්. මෙම සුවිශේෂී ආකර්ෂණය දේශීය හා ජාත්‍යන්තර අමුත්තන් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන අතර, කුළුණේ ආකර්ෂණය වැඩි කරයි.

### 17.8.3 Warehouse – Multi-Purpose Venue

වෙළඳ සංදර්ශන, ගෘහස්ථ ප්‍රසංග, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ සඳහා බහුකාර්ය පහසුකමක් ලබාදේ. මෙම අති නවීන ඉඩකඩ විවිධ මහා පරිමාණ සිදුවීම් සඳහා පහසුකම් සැලසීම සඳහා නවීන පහසුකම් සහ නම්‍යශීලී පිරිසැලසුම් වලින් සමන්විත වේ.

## 17.9 ව්‍යාපෘති ප්‍රගතිය

| | ව්‍යාපෘති යේ/ වාණිජ ඒකකයේ නම | මුලු ඇස්තමේන්තු ගත අගය (රු.මි.) | නරඹන් නන් සංඛ්‍යාව | 2024 ප්‍රතිපාදන (රු.මිලි.) | 2024.12.31 වන දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රාග්ධන වියදම 2023/2024 | | ප්‍රාග්ධන වියදම | ලැබූ ආදායම | වෙන්කල මුදල | % | |
| 1 | Core Business | 755 | 924,741 | 546 | 966 | 1,074 | 90 | 100 |
| 2 | CLC | 36 | 30,544 | 20 | 50 | 122 | 45 | 95 |
| 3 | Pixel Bloom | 85 | 138,791 | 16 | 43 | 157 | 27 | 85 |
| 4 | Citrus Project | 245 | 79,727 | 26 | 722 | 938 | 77 | 100 |

## 17.10. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන ජයග්‍රහණ සහ අභියෝග

### 17.10.1 නැරඹුම් පීඨිකාව

**ජයග්‍රහණ**

- 2024 ජනවාරි පළමුවන දින සිට දෙසැම්බර් 31 දින දක්වා පැමිණි දේශීය නරඹන්නන් ගණන - 1,012,311
- 2024 ජනවාරි පළමුවන දින සිට දෙසැම්බර් 31 දින දක්වා පැමිණි විදේශීය නරඹන්නන් ගණන - 69,842







**අභියෝග**

නැරඹුම් පිටිකාව අහසට විවෘතව පවතින බැවින් පැමිණෙන නරඹන්නන් හට වැසි සමයේ දී අවශ්‍ය පහසුකම් ලබාදීමට නොහැකි වීම.

### 17.10.2 ඩිජිටල් කලාගාරය ස්ථාපනය කිරීම Pixel bloom – Digital Art Museums

**ජයග්‍රහණ**

2024 මැයි මස 8 වැනි දින සිට මහජනතාවට විවෘත කිරීමෙන් පසු 2024 දෙසැම්බර් 31 දින දක්වා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව - 161,095







### 17.10.3 ලෝටස් ඇක්වා බේ - Lotus Aqua Bay

**ජයග්‍රහණ**

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය සංස්ථාව වෙතින් කුලී ගෙවීමේ පදනම මත මගීන් ප්‍රවාහන බෝට්ටුවක් ලබාගෙන තිස්පහක පමණ පිරිසකට ප්‍රිය සම්භාෂණ පැවැත්විය හැකි පරිදි නවීකරණය කිරීම. ඒ සඳහා අවශ්‍ය පරිදි සුදුසු ලෙස පහසුකම් වැඩි දියුණු කිරීම.







**අභියෝග**

බේරේ වැව තුළ එකී ව්‍යාපෘතිය සිදු කිරීමට අවශ්‍ය අනුමැතීන් මධ්‍යම පරිසර අධිකාරියෙන් හා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය සංස්ථාව වෙතින් ලබා ගැනීම සිදු කළ යුතුය.

### 17.10.4 මැජෙස්ටික් ප්‍රයිඩ් කැසිනෝ ව්‍යාපෘතිය

**ජයග්‍රහණ**

- බිම් මහලේ වර්ග අඩි 6350 ක ප්‍රමාණයක්, විසි අටවන මහලේ වර්ග අඩි 10610 ක ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම.
- පළමු මහලේ වර්ග අඩි 6743 ක ප්‍රමාණයක් ඔවුන්ගේ කාර්යාල කටයුතු සඳහා මාස හයකට කුලී පදනම මත ලබාදීම.
- දෙවන මහලේ වර්ග අඩි 45260 ක ව්‍යාපාර කටයුතු කිරීම සඳහා අවශ්‍ය නවීකරණ කටයුතු ආරම්භ කිරීම.

**අභියෝග**

ඉදිකිරීම්/නවීකරණය කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය අනුමැතිය රජයේ ආයතන වෙතින් ලබා ගැනීම.

## 17.11 තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුකූලව 2025 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම

| # | ප්‍රධාන කාර්ය සාධන දර්ශක / අරමුණු |
|---|---|
| 1 | 2024 දී රුපියල් බිලියන 1.4 ක සහ 2025 සිට රුපියල් බිලියන 1.6 ක වාර්ෂික ආදායමක් ලබා ගැනීම. |
| 2 | ධනය උපරිම කිරීම සඳහා 2025 වසර පුරා වඩාත් මූල්‍යමය වශයෙන් ශක්‍ය නව උපාය මාර්ගික වාණිජ ඒකක එකතු කරන අතරම මූලික අයවැයක් හරහා 2025 සඳහා රුපියල් මිලියන 123.6 ක වාර්ෂික ශුද්ධ ලාභයක් සුරක්ෂිත කිරීම. |
| 3 | 2025 වන විට කුළුණ නැරඹීමට පැමිණෙන විදේශීය අමුත්තන් 100,000 ක වාර්ෂික පහළ වැටීමක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවම වශයෙන් ජාත්‍යන්තර / දේශීය වෙළෙඳපොළ ප්‍රධාන පාර්ශවකරුවන් 80 ක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. |
| 4 | 2025 වන විට සේවක පිරිවැටුම 15% ට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යෑම. |
| 5 | 2025 වන විට ආරක්ෂිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් සියලුම පාර්ශ්වකරුවන් සඳහා නෙළුම් කුළුණ පරිශ්‍රය තුළ ආරක්ෂිත සහ සුරක්ෂිත පරිසරයක් සහතික කිරීම. |
| 6 | 2025 සිට සේවක තෘප්තිමත් අනුපාතය 90% ක් පවත්වා ගැනීම. |
| 7 | එක් පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් පැය 10 ක පුහුණුවක් ලබා දීම සඳහා රැකියා භූමිකාව කේන්ද්‍ර කරගත් පුහුණුව සහ සංවර්ධන සහ අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීම. |
| 8 | 2025 වන විට සන්ධිස්ථානවල ජයග්‍රහණ හඳුනා ගැනීම සඳහා කාලානුරූපී ප්‍රතිලාභ පද්ධති ක්‍රියාත්මක කිරීම සහ පද්ධතිය වැඩිදියුණු කිරීම සමඟ පවත්වාගෙන යාම |
| 9 | 2025 සිට ආදායමෙන් 0.1%ක් වෙන් කිරීම මගින් ඉහළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහිත ආයතනික සමාජ වගකීම් වැඩසටහන් සිදුකිරීම |
| 10 | බලශක්ති පරිභෝජනය අඩු කිරීමට මෙන්ම 2025 වන විට බලශක්ති අවශ්‍යතාවය 20% කින් සපුරාලීමට හරිත බලශක්ති විසඳුම් ක්‍රියාත්මක කිරීම |
| 11 | 2026 අවසානය වන විට සම්පූර්ණ ඒකාබද්ධ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් 90% කඩදාසි රහිත පරිසරයක් සාක්ෂාත් කර ගැනීම |
| 12 | 2024 වන විට අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර 2025 වන විට කසල 100% ශුන්‍ය බවට පත් කිරීම. |
| 13 | 2025 වන විට පාරිභෝගික සමාලෝචන ශ්‍රේණිගත කිරීම ලකුණු 4.4 ට වඩා ඉහළින් පවත්වා ගැනීම. |
| 14 | 2025 වන විට මූලික දීමනාවක් ලෙස අවම වශයෙන් 3ක්වත් අද්විතීය විනෝදාස්වාද ක්‍රියාකාරකම් සහ අත්දැකීම් ලබා දීම. |
| 15 | 2025 අවසානය වන විට සමාජ මාධ්‍ය තුළ 50000 ක අනුගාමිකයින් සාක්ෂාත් කර ගැනීමෙන් ඩිජිටල් පැවැත්මක් සෑදීම. (FB / IG / TikTok) |
| 16 | 2025 වන විට ප්‍රවේශය ඩිජිටල්කරණය කිරීම. |
| 17 | පාරිභෝගික සේවාව වැඩිදියුණු කර 2026 අවසන් වන විට දකුණු ආසියාවේ විවේක කාණ්ඩය යටතේ ඉහළම සන්නාම 10 වෙත ළඟා වීම. |
| 18 | 2025 අවසානය වන විට සේවක අත්පොත සහ ආචාර ධර්ම සංග්‍රහය සංවර්ධනය කර භාර දීම. |
| 19 | 2026 අවසානය වන විට සම්පූර්ණ තත්ත්ව කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම. |

# 18 දේශීය හා විදේශීය අරමුදල් මත සිදුකරන ව්‍යාපෘති

## 18.1 අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

### 18.1.1 හැඳින්වීම

උපායමාර්ගික නගර සංවර්ධන වැඩසටහන යටතේ සංස්කෘතික හා ස්වභාව උරුමයන් රැකගනිමින් අනුරාධපුර නගරයේ පූජනීය ස්ථාන සංවර්ධනය වෙනුවෙන් වූ තුලිත ක්‍රමවේදයක් ප්‍රචලිත කිරීම සහ විදේශිකයන්ට ආකර්ෂණය වන නගරයක් බිහිකිරිම මෙම අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

**මූලික කරුණු**

| | | |
|---|---|---|
| ව්‍යාපෘතියේ නම | : | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය |
| මුදල් ලැබෙන මූලාශ්‍රය | : | සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිත ආයතනය (AFD) |
| ව්‍යාපෘතිය ආරම්භ කල දිනය | : | 2016.12.01 |
| අවසන් කල යුතු දිනය | : | 2023.09.30 |
| ලබාදී ඇති කල්දිගුව | : | 2025.03.31 |
| විදේශ ණය මුදල | : | යූරෝ මිලියන 52 |
| දේශීය මූල්‍ය | : | යූරෝ මිලියන 10.4 |
| ව්‍යාපෘති බල ප්‍රදේශය | : | අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශය |

**විෂය පථය**

- නාගරික සංරචක වැඩි දියුණු කිරීම - ප්‍රවේශය, සංචරණය හා රථවාහන කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- පොදු අවශ්‍යතා වැඩි දියුණු කිරීම - ආකර්ශනීය ලෙස පොදු අවශ්‍යතා ගුණාත්මකභාවයකින් යුතුව වැඩි දියුණු කිරීම.
- ගංවතුර අවදානම අවම කිරීම සඳහා නාගරික ජලාපවහන වැඩිදියුණු කිරීම.
- ජාතික උරුමය වැඩිදියුණු කිරීම.
- මූල්‍ය තිරසාර කළමනාකරණය සඳහා යටිතල පහසුකම් හා වත්කම් හිමියන් සඳහා ධාරිතා ගොඩනැංවීම.
- මලාපවහන සහ අපජල කළමනාකරණ සැලැස්ම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.

### 18.1.2 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

| ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2024 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | (%) | |
| **ව්‍යාපෘතිය:** අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය **උප ව්‍යාපෘතිය:** අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,176.13 (මූලික) 1,795.31 (සංශෝධිත) | සමස්ථ ශ්‍රී ලාංකිකයන් සහ විදේශිකයන් | 995.91 | 303.27 | 30.45 | 46 |

### 18.1.3 2024 වසරේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ලබා ගත් ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

**ලබා ගත් ජයග්‍රහණ:**

- ආර්ථික අර්බුදය හමුවේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන යාමට රාජ්‍ය අනුමැතිය ලැබීම.
- ආර්ථික අර්බුදය හමුවේ ව්‍යාපෘතියේ ඉදිකිරීම සඳහා රාජ්‍ය මුදල් ලැබීම.
- අවම සේවක කණ්ඩායමක් යොදා ගෙන කෙසේ හෝ ඉදිකිරීම් ඉලක්කයන් සපුරා ගැනීම.

**මුහුණ දුන් අභියෝග**

- ඇස්තමේන්තුගත නොවූ වැඩ අයිතම මුලිකව සිදුකිරීමට සිදුවීම.
- ආර්ථික අර්බුදය හමුවේ ව්‍යාපෘතිය දෙවතාවක් අත්හිටුවීමට සිදු වීම.
- කොන්ත්‍රාත්කරුගේ දුර්වල මුදල් ප්‍රවාහය ඉදිකිරීම්වලට මුලිකම බලපෑම.
- 2025.03.31 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීම.



දෙමහල් බස් නැවතුම්පළ ඉදිකිරීම



දෙමහල් දුම්රිය ස්ථානය ඉදිකිරීම



ගුවන් පාලම ඉදිකිරීම



දුම්රිය පදික වේදිකාව ඉදිකිරීම



මළඅපවහන පවිත්‍රාගාරය ඉදිකිරීම



දුර ගමන් සේවා නැවතුම්පළ ඉදිකිරීම

## 18.1.4 2025 වසරේ ක්‍රියාකාරී සැලැස්ම

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය/වැඩසටහන | මූල්‍ය ඉලක්ක (රු.මිලි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය |
|---|---|---|---|---|
| පොදු අවශ්‍යතා වැඩි දියුණු කිරීම | **ව්‍යාපෘතිය:** අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය **උප ව්‍යාපෘතිය:** අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,795.31 (සංශෝධිත) | රාජ්‍ය මූල්‍ය | 100% |

## 18.1.5 වෙනත් කරුණු

විදේශ ණය මුදල් ලෙස යූරෝ මිලියන 52.0 සහ දේශීය මුදල් ලෙස යූරෝ මිලියන 10.4 මෙම ව්‍යාපෘතියට ලැබී ඇතත් දැනට වියදම් වී ඇත්තේ යූරෝ මිලියන 2.7 ක් පමණි. ඉතිරි මුදල් රජය මැදිහත් වී ලබාගැනීමට හැකියාව ලැබුනහොත් ඉතිරි වී ඇති අනෙකුත් ව්‍යාපෘති සිදු කිරීමට හැකිවේ. මුලිකවම හඳුනාගත් උප ව්‍යාපෘති 24 න් මේවන විට 10 ක වැඩ නිමකර අදාල ආයතන වෙත භාර දී ඇති අතර දැනට ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනු ලබන අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ උප ව්‍යාපෘතිය හැර අනෙකුත් උප ව්‍යාපෘති 13 ක මුලික ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය ලේඛනයන් මේ වන සකස් කර ඇත.

- නාගරික සංරචක වැඩි දියුණු කිරීම - ප්‍රවේශය, සංචරණය හා රථවාහන කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- පොදු අවශ්‍යතා වැඩි දියුණු කිරීම - ආකර්ශනීය ලෙස පොදු අවශ්‍යතා ගුණාත්මකභාවයකින් යුතුව වැඩි දියුණු කිරීම.
- ගංවතුර අවදානම අවම කිරීම සඳහා නාගරික ජලාපවහන වැඩිදියුණු කිරීම.
- ජාතික උරුමය වැඩිදියුණු කිරීම.
- මූල්‍ය තිරසාර කළමනාකරණය සඳහා යටිතල පහසුකම් හා වත්කම් හිමියන් සඳහා ධාරිතා ගොඩනැංවීම.
- මලාපවහන සහ අපජල කළමනාකරණ සැලැස්ම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම

ඒ අනුව අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය හරහා අනුරාධපුර නගරයේ පූජනීය ස්ථාන සහ පෞරාණික නගරය සංවර්ධනය කර විදේශිකයන්ට ආකර්ෂණය වන නගරයක් බිහිකර ගැනීමට හැකිවේ. එමගින් විදේශ විනිමය උපයාගත හැකිවේ. මේ පිළිබඳ විශේෂ අවදානය යොමු කලයුතු කාලය උදාවී ඇත.

## 18.2 බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම, නැගෙනහිර පළාත් උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්ම හා හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය

### 18.2.1 හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය සුවිශේෂී අරමුණු තුනක් මූලික කොට ගෙන ක්‍රියාත්මක වේ. බස්නාහිර ප්‍රදේශ ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ බස්නාහිර පළාතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇති බාධාවන් තක්සේරු කිරීම සහ කලින් හඳුනාගත් උත්ප්‍රේරක ව්‍යාපෘතිවලින් ප්‍රමුඛතා ව්‍යාපෘති හතරක් තෝරා ගැනීමයි. මෙම ව්‍යාපෘති සඳහා නාගරික සැලසුම් රෙගුලාසි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ රාමුවක් සැකසීම මෙහි අරමුණකි. නැගෙනහිර පළාතේ උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්ම නිර්මාණය වන්නේ නැගෙනහිර වෙරළ ආශ්‍රිත අවශ්‍ය යටිතල පහසුකම් සහිත සංචාරක කලාප හතරක් සඳහා ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙස සවිස්තරාත්මක ප්‍රධාන සැලැස්මක් සකස් කිරීමයි. හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා කලාපීය සැලැස්ම, තිරසාර නාගරික, කාර්මික සහ සමාජ-ආර්ථික වර්ධනය, ආයෝජන ආකර්ෂණය කර ගැනීම, කොළඹට විකල්ප වරාය මධ්‍යස්ථානයක් ලෙස එය ස්ථාපිත කිරීම, පාරිසරික සංරක්ෂණයට ප්‍රමුඛත්වය දෙමින් සහ ප්‍රධාන වර්ධන ක්ෂේත්‍ර සඳහා සවිස්තරාත්මක සැලසුම් ගෙනහැර දැක්වීම මූලික අභිමතාර්ථ කොට ගෙන ක්‍රියාත්මක වේ. මෙහිදී විශේෂයෙන්ම වාණිජ කටයුතු අවස්ථා උදාකර දීම, සංචාරක ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඇති විභවතා හඳුනාගැනීම ද මීට ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයනු ලබන්නේ සිංගප්පූරුවේ සර්බානා ජුරොංග් පුද්ගලික ආයතනයයි. එමෙන්ම මෙහි සේවාදායකයා වනුයේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයයි. මෙම ව්‍යාපෘතිය සඳහා මූලික පහසුකම් සපයන ආයතනය නාගරික සංවර්ධන අධිකාරිය වේ. මේ සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් ලබා දෙන අතර නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත ජාතික මෙහෙයුම් කමිටුව එම සැලසුම් සමාලෝචනයට ලක් කර අනුමැතිය ලබා දේ.

### 18.2.2 2024 වර්ෂයේ ලබා ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | අවධීන් | ගිවිසුම් අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘති ආරම්භක දිනය | භෞතික ඉල්ලකය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ඉලක්කය (ඇ.එ.ජ. ඩො.) | මූල්‍ය ප්‍රගතිය (ඇ.එ.ජ. ඩො.) |
|---|---|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර සැලැස්ම | 2023 අගෝස්තු මස 28 | 2024 ජනවාරි මස 08 | 100% | 97.5% | 336,000 | 294,000 |
| 2 | නැගෙනහිර සැලැස්ම | | | 100% | 98% | 392,000 | 343,000 |
| 3 | හම්බන්තොට සැලැස්ම | | | 100% | 62% | 912,000 | 285,000 |

### 18.2.3 2024 වර්ෂයේ දී ලබාගත් ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

**ජයග්‍රහණ**

- නැගෙනහිර පළාත සඳහා සංචාරක ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම හා බස්නාහිර ප්‍රදේශය සඳහා මහානගර ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම සාර්ථකව නිම කිරීම.
- විසල් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා අවසන් කරන ලද ව්‍යුහ සැලැස්ම සහ හඳුනාගත් ප්‍රධාන වර්ධන මධ්‍යස්ථාන හයක් සඳහා සවිස්තරාත්මක ප්‍රධාන සැලසුම් කෙටුම්පත් කිරීම.

**අභියෝග**

- ඉහළ භූ අවකාශීය දත්ත වැනි දත්ත රැස්කිරීමේ සහ අත්පත් කර ගැනීමේ දීර්ඝ ප්‍රමාදයන්ට මුහුණපෑමට සිදුවීම.
- උපදේශක ආයතනය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවන්වල පවතින සැලසුම්/යෝජනාවලීන්හි ප්‍රායෝගිකත්වය සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධයෙන් පවතින නොගැලපීම් හේතුවෙන් ඒවා සමාලෝචනය හා සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කමිටුවට විශේෂ අවධානයක් යොමු කිරීම හේතුවෙන් කාලය ගතවීම.
- 2024 වර්ෂයේ පැවති ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය හේතුවෙන් ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් කැඳවීම ප්‍රමාද වීම.

## 18.2.4 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් පිළිබඳ විස්තරය

| | අවධිය | භෞතික ඉලක්ක ප්‍රතිශතය | මූල්‍ය ඉලක්ක (රු.) |
|---|---|---|---|
| 1 | බස්නාහිර ප්‍රදේශය සඳහා මහානගර ප්‍රධාන සැලැස්මක් සකස් කිරිම | 10% | 12,348,000 |
| 1.1 | අවසන් අදියර | 10% | 12,348,000 |
| 2 | නැගෙනහිර පළාත සඳහා සංචාරක ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම | 8% | 14,406,000 |
| 2.1 | අවසන් අදියර | 8% | 14,406,000 |
| 3 | විසල් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා මහානගර ප්‍රධාන සැලැස්මක් සකස් කිරිම | 38% | 184,338,000 |
| 3.1 | දෙවන අදියර | 10% | 117,306,000 |
| 3.2 | තෙවන අදියර | 80% | 33,516,000 |
| 3.3 | සිව්වන අදියර | 100% | 33,516,000 |

සටහන - මෙහි දැක්වෙන මූල්‍ය ඉලක්කය 2025.01.02 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති නාමික විදේශ විනිමය අනුපාතය වූ ඇ.එ.ජ.ඩො. 01= රු.294ක් ලෙස සලකා සකස් කර ඇත.

## 18.3 කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය

### 18.3.1 හැඳින්වීම

2010 දී කොළඹ සහ ඒ අවට ජීවත් වන අඩු පහසුකම් සහිත පවුල් 50,000 ක් පදිංචි කිරීම සඳහා නාගරික පුනර්ජීවන වැඩසටහන (URP) ආරම්භ කරන ලදී. ඉහත නිවාස වැඩසටහන කඩිනම් කිරීම සඳහා 2025 වන විට තවත් නිවාස ඒකක 5,500 ක් ඉදිකිරීමට අපේක්ෂිතය. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) අරමුදල් පහසුකම යටතේ 2019 අප්‍රේල් මාසයේ සිට කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා ආධාරක ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කොළඹ නාගරික පුනර් ජීවන ව්‍යාපෘතියට සහාය වීම, තාක්ෂණික සැලසුම් වැඩිදියුණු කිරීම්, නැවත පදිංචි කිරීම් සහ පශ්චාත් නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති, නිවාස නඩත්තු කිරීම, ප්‍රතිසංවර්ධන ප්‍රවේශයේ නවෝත්පාදනය සහ නිවාසවල දිගුකාලීන තිරසාරභාවය හැඩගැස්වීම සඳහා මහජන මැදිහත්වීම් සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

**ව්‍යාපෘති අරමුණු**

අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ගේ නිවාස තත්ත්වය වැඩි දියුණු කිරීම, දැරිය හැකි නිවාස ඉදිකිරීම සහ ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා ආයෝජනය කිරීම තුළින් කොළඹ ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

### 18.3.2 ප්‍රධාන කාර්යයන්

මෙම ව්‍යාපෘතිය සංරචක තුනකින් සමන්විත වේ

**සංරචක 1: නිවාස ඉදිකිරීම්**

බහු මහල් නිවාස ගොඩනැගිලිවල අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා උප ව්‍යාපෘති පහක් යටතේ නිවාස ඒකක 5,500 ක් (ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවට අනුව දැනට යෝජිත ඒකක 3600) ඉදිකිරීම සඳහා අඩු පහසුකම් සහිත ජනාවාස හිමියන්ට සහාය වීම.

මෙම නිවාස යෝජනා ක්‍රමවල ආබාධිතයින්ට පහසුකම් සහිත ප්‍රජා ශාලා, ළමා ක්‍රීඩා ප්‍රදේශ සහිත පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, සිල්ලර බඩු, වෛද්‍ය මධ්‍යස්ථාන වැනි පූර්ණ යටිතල පහසුකම් සැපයෙනු ඇත.

**සංරචක 2: ඉඩම් වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම**

මෙම සංරචකය මගින් අඩු පහසුකම් සහිත ජනාවාසවල පවුල් URP යටතේ ඉදිකරන ලද නව මහල් නිවාස ඒකක වලට මාරු වීමෙන් පසු ලබා ගත හැකි හෝ ලබා ගත හැකි ඉඩම්වලින් ලැබෙන ආදායම උපරිම කරනු ඇත. දැනට අක්කර 92 ක් පමණ හඳුනාගෙන ඇති අතර ඒවා නැවත සංවර්ධනය කිරීම සඳහා ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කරන අතර, සංරචක 1 යටතේ දැනටමත් හඳුනාගෙන ඇති උප ව්‍යාපෘති හයක් යටතේ සිදු කරන ලද නැවත පදිංචි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අක්කර 55 ක් හිස් වනු ඇත. අනෙක් අක්කර 37 URP අදියර II යටතේ සිදු කරන ලද සම්පූර්ණ කරන ලද සහ දැනට ක්‍රියාත්මක නැවත පදිංචි කිරීමේ නිවාස වැඩසටහන් යටතේ හිස් කිරීමට කටයුතු කරමින් පවතී. අක්කර හයක් උද්‍යාන වැනි පොදු භාවිතය සඳහා වෙන් කරනු ලබන අතර ඉතිරි අක්කර 86 වාණිජ ප්‍රතිසංවර්ධනය සඳහා යොදා ගනු ඇත. මීට අමතරව, තෝරා ගනු ලබන ජනාවාස වලින් අක්කර 40 ක් පමණ නිදහස් කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා සංරචක 1 යටතේ හඳුනා ගත් උප ව්‍යාපෘති යටතේ ප්‍රතිස්ථාපන නිවාස ඉදිකෙරේ.

**සංරචක 3: තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය.**

නාගරික පුනර්ජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා, ව්‍යාපෘති කළමනාකරණය සහ අනෙකුත් ක්‍රියාමාර්ග සඳහා සහාය ලබා දීම.

## 18.3.3 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘති නාමය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු. මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන - 2024 (රු. මි) (A) | 2024.12.31 දිනට | | 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය (රු. මි) (B) | % (C=B/Ax 100) | |
| 1 | නිවාස ඒකක 624 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම කොළඹගේ මාවත ව්‍යාපෘතිය | 6,449.25 | 624 | 2,170.80 | 1,549.47 | 71.38 | 96.84 |
| 2 | නිවාස ඒකක 1000 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ස්ටේඩියම්ගම ව්‍යාපෘතිය | 13,134.96 | 1,000 | 1,861.97 | 691.42 | 37.13 | 98.83 |
| 3 | නිවාස ඒකක 300 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ඔබේසේකරපුර ව්‍යාපෘතිය | 3,239.20 | 300 | 7.00 | 198.73 | - | නැවත ටෙන්ඩර් කිරීම සිදුවෙමින් පවතී |
| 4 | නිවාස ඒකක 700 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ඇපල්වත්ත ව්‍යාපෘතිය | 7,213.70 | 700 | 565.03 | 1,068.57 | 292.73 | 40.47 |
| 5 | නිවාස ඒකක 750 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ෆර්ගියුසන් පාර ව්‍යාපෘතිය | 7,673.66 | 750 | 500.00 | 597.26 | 119.45 | 13.21 |
| 6 | නිවාස ඒකක 700 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ මාදම්පිටිය ව්‍යාපෘතිය | 7,268.76 | 700 | 600.00 | 1,807.59 ( රු. මි. 412.89 ක අමතර අත්තිකාරම් සහිතව) | 301.27 | 44.20 |

## 18.3.4 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග සහ ජයග්‍රහණ

### 18.3.4.1 කොළඹගේ මාවත ව්‍යාපෘතිය (නිවාස ඒකක 624)

**ජයග්‍රහණ**

- සියලු ගොඩනැගිලි පාහේ සම්පූර්ණයෙන් නිමකර 96% ක සමස්ත භෞතික, ප්‍රගතියක් ලබා අවසාන පවරා ගැනීමේ පරීක්ෂණ සිදුවෙමින් පවතී.





### 18.3.4.2 ස්ටේඩියම්ගම ව්‍යාපෘතිය (නිවාස ඒකක 1000)

**ජයග්‍රහණ**

- භාර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර නිවාස ඒකක 700 ක ත්‍රෛපාර්ශවීය පරීක්ෂාව අවසන් කිරීම.
- කොන්ත්‍රාත්තුවට අනුව කාර්යයේ විෂය පථය 99% සම්පූර්ණ කිරීම.




### 18.3.4.3 ඔබේසේකරපුර ව්‍යාපෘතිය (නිවාස ඒකක 300)

**ජයග්‍රහණ**

- ඉතිරි කටයුතු සඳහා අරමුදල් සැපයීම සඳහා AIIB බැංකුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ශේෂ කාර්යයන් නැවත ටෙන්ඩර් කිරීම සිදු වෙමින් පවතී.




### 18.3.4.4 ඇපල්වත්ත ව්‍යාපෘතිය (නිවාස ඒකක 700)

**ජයග්‍රහණ**

- A ගොඩනැඟිල්ලෙහි ව්‍යුහාත්මක කටයුතු අවසන් කර ඇත.
- 90% ක සැලසුම් කටයුතු අවසන් කර ඇත.
- කොන්ත්‍රාත්තුවට අනුව කාර්යයේ විෂය පථය 39% සම්පූර්ණ කර ඇත.




### 18.3.4.5 ෆර්ගසන් පාර ව්‍යාපෘතිය (නිවාස ඒකක 750)

**ජයග්‍රහණ**

- ගොඩනැඟිලි තුනෙහිම ටැම් කුළුණු කටයුතු අවසන් කර ඇත.
- A ගොඩනැඟිල්ලෙහි සුපිරි ව්‍යුහයෙහි ව්‍යුහාත්මක කාර්යයන් ආරම්භ කිරීම.





### 18.3.4.6 මාදම්පිටිය ව්‍යාපෘතිය (නිවාස ඒකක 700 ක්)

**ජයග්‍රහණ**

- ගොඩනැඟිලි හතරෙහිම උප ව්‍යුහයෙහි කටයුතු අවසන් කර ඇත.
- A, B සහ C ගොඩනැඟිලිවල ව්‍යුහාත්මක කටයුතු අවසන් කර ඇත.
- කොන්ත්‍රාත්තුවට අනුව කාර්යයේ විෂය පථය 42.38% සම්පූර්ණ කර ඇත.





## 18.3.5 ක්‍රියාකාරී සැලැස්ම 2025

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රභවය | භෞතික ඉලක්කය (%) |
|---|---|---|---|---|
| සංරචක 1 | නිවාස ඒකක 624 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කොළඹගේ මාවත ව්‍යාපෘතිය | 5538 | ආසියානු යටිතල ආයෝජන බැංකුව | 100 |
| | නිවාස ඒකක 1000 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ස්ටේඩියම්ගම ව්‍යාපෘතිය | 10348 | | 100 |
| | නිවාස ඒකක 300 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ඔබේසේකරපුර ව්‍යාපෘතිය | 1534 | | ඔබේසේකරපුර ව්‍යාපෘතියේ ශේෂ කටයුතු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම. |
| | නිවාස ඒකක 700 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ඇපල්වත්ත ව්‍යාපෘතිය | 4668 | | 84 |
| | නිවාස ඒකක 750 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ ෆර්ගසන් පාර ව්‍යාපෘතිය | 4073 | | 84 |
| | නිවාස ඒකක 700 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ මාදම්පිටිය ව්‍යාපෘතිය | 60021 | | 86 |

## 18.3.6 අභියෝග

- **කොළඹගේ මාවත ව්‍යාපෘතිය හා ස්ටේඩියම්ගම ව්‍යාපෘතිය** සමස්ත ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාම. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඇත.
- **කොළඹගේ මාවත ව්‍යාපෘතිය හා ස්ටේඩියම්ගම ව්‍යාපෘතිය** සේවා සම්බන්ධතා ගාස්තු වෙන් කරන ලද තාවකාලික මුදලට වඩා වැඩිය. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඇත.
- **කොළඹගේ මාවත ව්‍යාපෘතිය හා ස්ටේඩියම්ගම ව්‍යාපෘතිය** කොළඹ මහ නගර සභාවෙන් වැසිකිළි නළ පහසුකම් ලබා ගැනීම සඳහා කටයුතු කිරීම
- **කොළඹගේ මාවත ව්‍යාපෘතිය** කොන්ත්‍රාත් මුදලට වඩා 50% ක් පමණ වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ.
- **ඔබේසේකරපුර ව්‍යාපෘතිය** පෙර කොන්ත්‍රාත්කරුට හිමිකම් ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය;
- **ඔබේසේකරපුර ව්‍යාපෘතිය** ඇමරිකානු ඩොලර් මිලියන 28 ක AIIB බැංකු ණය මුදල සඳහා NPD අනුමැතිය සහ කැබිනට් අනුමැතිය ලබාගැනීමට ඇත.
- **ඇපල්වත්ත ව්‍යාපෘතියෙහි** කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ගැටළු නිසා ඔවුන්ගේ දුර්වල කාර්ය සාධනය
- **ෆගියුසන් පාර ව්‍යාපෘතියෙහි** කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ගැටළු නිසා ඔවුන්ගේ දුර්වල කාර්ය සාධනය
- **මාදම්පිටිය ව්‍යාපෘතිය** පරිශ්‍රයේ අනවසර පදිංචිකරුවන් සිටීම.

## 18.3.7 වෙනත් කරුණු

### 18.3.7.1 ඉඩම් වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම

මෙම සංරචකය මගින් අඩු පහසුකම් සහිත ජනාවාසවල පවුල් මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන නව මහල් නිවාස ඒකක වලට මාරු වීමෙන් පසු නිදහස්කර ගන්නා ඉඩම්වලින් ලැබෙන ආදායම උපරිම කරනු ඇත. අක්කර 40 ක් පමණ මෙමඟින් නිදහස් කිරීමට අපේක්ෂා කෙරේ.

### 18.3.7.2 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

නැවත පදිංචි කිරීමේ වැඩසටහන මගින් ලබා දී ඇති ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කරනු ලබන අතර, එම ප්‍රදේශවල පොදු පහසුකම් සැපයීම ද ඇතුළත් වේ. අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ගේ නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීම සහ කොළඹ ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙහි අරමුණයි.

GOSL හි ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (LAA), අංක 7 දරන රාජ්‍ය දේපළ අත්පත් කර ගැනීමේ පනත, ජාතික ස්වේච්ඡා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP) සහ AIIB හි පාරිසරික හා සමාජ රාමුව (ESF), විශේෂයෙන් පාරිසරික හා සමාජ ප්‍රමිති 2 (ESS2) ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීම සඳහා අනුකූලව ව්‍යාපෘතියෙන් පීඩාවට පත් පවුල්වල නැවත පදිංචි කිරීමේ සැලැස්ම සකස් කර ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ සංරචකය සඳහා සුදුසුකම් නිර්ණායක, ප්‍රතිලාභ, ක්‍රියා පටිපාටි සහ ප්‍රමිතීන් ඇතුළු සමස්ත ක්‍රියාවලිය මෙම ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇති නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව (RPF) තුළ දක්වා ඇත. RPF විසින් අවශ්‍ය පරිදි, නැවත පදිංචි කරන ලද පවුල්වල හිමිකම්, ජනතාවගේ ආදායම් සහ ජීවනෝපාය ප්‍රතිසංස්කරණය කිරීමේ උපාය මාර්ගය, ආයතනික විධිවිධාන, අධීක්ෂණ හා වාර්තාකරණ රාමුව, අයවැය සහ කාලානුරූපී ක්‍රියාත්මක කිරීමේ කාලසටහන විස්තර කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ සැලැස්මක් (RP) සකස් කරනු ලැබේ.

### 18.3.7.3 සමාජ සේවා කටයුතු

මෙම ව්‍යාපෘතියේ සංරචක 03 යටතේ, ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සහ සමාජ බලමුළු ගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම මගින් නිවාස ප්‍රතිලාභීන් සඳහා ජීවන තත්ත්වය ඉහළ නැංවීම ව්‍යාපෘතියට අදාළ වේ.

### 18.3.7.4 උපදේශන සේවා බඳවාගැනීම

- සමාජ-ආර්ථික සමීක්ෂණය, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම (RAP), සංවර්ධන ප්‍රජා බලමුලුළු ගැන්වීම, ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ උපදේශන සේවාව බඳවා ගැනීම. නියමිත කාල සීමාව තුළ කාර්යය සම්පූර්ණ කිරීම.
- නිවාස වෙන් කිරීම, පැවරීම සහ කළමනාකරණය පිළිබඳ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට අදාල ප්‍රතිපත්ති සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම. අදාල නිවාස ප්‍රතිපත්තිය සම්පූර්ණ කර ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත
- නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම (RAP) ස්වාධීන ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳ උපදේශන සේවා බඳවා ගැනීම. උපදේශකයන්ගේ අභිමතය ප්‍රකාශකිරීමට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වල ToR ප්‍රසිද්ධ කර ඇත.
- නැවත පදිංචි කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය සඳහා ව්‍යාපෘති අධීක්ෂණ මෘදුකාංග සහ ක්‍රමලේඛන ස්ථාපනය සහ යාවත්කාලීන කිරීම සඳහා උපදේශන සේවා බඳවා ගැනීම (SCURP)උපදේශක බඳවාගැනීමට අවශ්‍ය ToR සකස්කර නිම කිරීම.

## 18.3.8 සිදුකල උපකාර්යයන්

| අ. අ | සැලසුමට අනුව ප්‍රතිඵලය | අභියෝග |
|---|---|---|
| 1 | එක් එක් නිවාස ඒකක සඳහා ප්‍රතිලාභී ගොනුවක් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් නිවාස ප්‍රතිලාභීන් වෙත ගෘහ උපදේශන 4200ක් පවත්වන ලදී. | සමීක්ෂණය සඳහා ප්‍රතිලාභීන්ගේ පුරුෂ පාර්ශවය සමඟ සම්බන්ධ වීම දුෂ්කර කාර්යයකි. |
| 2 | සමුපකාර ඉතිරි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ප්‍රජා මූලික සංවිධාන (CBO) 10ක් පිහිටුවා ශක්තිමත් කිරීම, නිවාස යෝජනා ක්‍රමයේ පොදු පහසුකම් කළමනාකරණය කිරීම පිළිබඳ මූලික දැනුම CBO හරහා නිර්මාණය කෙරේ (මෙතෙක් කුඩා කණ්ඩායම් මඟින් රු. මිලියන 2.5 ක මුදලක් ස්ථාවර තැන්පත් කර ඇත. ඊට අමතරව රුපියල් මිලියන 1.2 ඉතිරි කර ඇත.) | නව අත්දැකීමක් නිසා, විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය හඳුන්වා දීම අපහසුය.<br>දෛනික ආදායම් උත්පාදන කටයුතු නිසා, කුඩා කණ්ඩායම් වශයෙන් ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීම අපහසුය. |
| 3 | කොළඹ සහ නාරාහේන්පිට ක්‍රීඩාංගනයේ සහ කොලඹගේ මාවත නව නිවාස සංකීර්ණවල සිරස් නිවාස පහසුකම් දැනට ඉදිකිරීම් අවසන් අදියරේදී ප්‍රතිලාභීන්ගේ නව නිවාස පිළිබඳ දැනුවත් කිරීමට චාරිකා 20ක් සංවිධානය කර රැගෙන යන ලදි. | ආරක්ෂාව සැලකිල්ලට ගනිමින්, ඉදිකිරීම් කාලය තුළ නිවාස සංකීර්ණ නැරඹීමට කටයුතු කිරීම අපහසු වීම.<br>ඉදිකිරීම් අවසන් අදියරේදී බැවින් ප්‍රජාවගේ අවශ්‍යතා අනුව ගෘහ නිර්මාණ කටයුතු වෙනස් කිරීම අපහසු වීම. |
| 4 | නායකත්වය, මූල්‍ය කළමනාකරණය, කණ්ඩායම් ගොඩනැගීම ප්‍රජා නායකයින්, නාභිගත කණ්ඩායම් හඳුනා ගැනීම පුහුණු වැඩසටහන්/වැඩමුළු 18ක් පවත්වන ලදී. | ප්‍රතිලාභීන්ගේ දෛනික ආදායම් උත්පාදනය හේතුවෙන් අඩු සහභාගීත්වයක් දැක්වීම. |
| 5 | දුක්ගැනවිලි කමිටු 5ක් පිහිටුවා සාමාජිකයන් දැනුවත් කර ඇත. | සමාජ ආරක්ෂණය, ප්‍රජා බලමුළු ගැන්වීම සහ ප්‍රජාවගේ සැබෑ අපේක්ෂාවන් පිළිබඳ අඩු දැනුමක් තිබීම. |
| 6 | පාර්ශවකරුවන්ගෙන් දුක්ගැනවිලි 184ක් සඳහා විසඳුම් ලබා දීම. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අභියාචනා ලිවීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ ලබා දී ඇති දැනුම නොතකා බොහෝ විට අභියාචනා ඉදිරිපත් කිරීම. |
| 7 | විශේෂ අභියාචනා කමිටුව (SAC) හරහා අභියාචනා 73ක් සඳහා විසඳුම් ලබාදෙන ලදී. | විශේෂ අභියාචනා කමිටුවෙහි මාර්ගෝපදේශයට අනුව, එය සමාජීය කාරණා හැර භෞතික අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දී ඇත. |
| 8 | LGBTQ, SGBV (ලිංගික ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිංසනය), ලිංගාශ්‍රිත රෝග (සමාජ රෝග), ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන සේවා, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ආදිය සඳහා වැඩසටහන් 02 පවත්වන ලදී. | LGBTQ, SGBV (ලිංගික ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිංසනය), ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සම්බන්ධයෙන් විරෝධී සහ නිෂේධාත්මක අදහස් ඇති ප්‍රජාව සමඟ කටයුතු කිරීමට සිදුවීම.<br>දෛනික ආදායම් උත්පාදනය හේතුවෙන් පිරිමි සහභාගීත්වය අඩු වීම. |

## 18.4 නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීම සඳහා තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය (UPPF)

### 18.4.1 හැඳින්වීම

තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපාදන මත නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එය පහත පරිදි අදියර දෙකක් යටතේ සිදුවේ.

1 වන අදියර - නාගරික ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම (UPPF). Loan No. SRI COL 3706 - ඩොලර් මිලියන 5.7 - ව්‍යාපෘති සූදානම සාක්ෂාත් කර ගැනීම සඳහා (ව්‍යාපෘති ශක්‍යතා සකස් කිරීම, සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන වාර්තා සකස් කිරීම).

2 වන අදියර - තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන (STSDP) ක්‍රියාත්මක කිරීම සඳහා වන ණය (මේ වන විට ණය ගිවිසුම් අත්සන් කොට නොමැත.). ඩොලර් මිලියන 30.

නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීමේ ණය කාලය 2024 මාර්තු 31 දින අවසන් විය. තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වාස්තු විද්‍යාත්මක සැලසුම්, විස්තරාත්මක සැලසුම්, සමාජ හා පරිසර සංරක්ෂණ වාර්තා, වියදම් ඇස්තමේන්තු හා ප්‍රසම්පාදන ලේඛන සකසා ගැනීම මෙමගින් සිදු කර ගන්නා ලදී.

තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ ක්‍රමෝපායික නගර හතරක් සංවර්ධනය කිරීමට සැලසුම් කල මෙම ව්‍යාපෘතිය, පසුව ත්‍රිකුණාමලය සහ දඹුල්ල යන ප්‍රමුඛ සංචාරක ගමනාන්තයන් දෙකෙහි සංචාරක ප්‍රවර්ධනය අරමුණු කරගත් ප්‍රමුඛ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පමණක් සංශෝධනය කර ඇත. අරමුදල් සැපයීමේ ක්‍රමය සංශෝධනය කරන ලද අතර, ඒ අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 100 කට අරමුදල් සඳහා සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම අරමුදලේ ණය ආකාර දෙකකි.

(i) ඇමරිකානු ඩොලර් මිලියන 70 ක ප්‍රතිපත්ති පාදක ණය (සංචාරක අමාත්‍යාංශය එකඟ වූ ප්රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මත පදනම්ව අරමුදල් සපයනු ලැබේ. මෙම සංරචකය සංචාරක අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ඇත); සහ

(ii) ඇමරිකානු ඩොලර් මිලියන 30ක ණය මුදල, ත්‍රිකුණාමලයේ සහ දඹුල්ලෙහි සංචාරක විභවය ඉහල නැංවීම සඳහා යෝජිත උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන සංරචකයක් ලෙස නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

තිරසර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් පහත සඳහන් අරමුණු ළඟා කර ගැනීමට අපේක්ෂිතය.

- සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට අදාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය
- පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කිරීම සහ සංචාරක ව්‍යාපාරය සඳහා ආකර්ෂණය කර ගැනීම
- පුද්ගලික පොදු හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම
- ආර්ථික සංවර්ධනය සහ ආදායම් උත්පාදනය
- දිළිඳුකම පිටුදැකීම
- සමාජ සංවර්ධනය
- පාරිසරික කළමනාකරණය
- ධාරිතාව ගොඩනැගීම මඟින් ආයතනික වශයෙන් ශක්තිමත් කිරීම

## 18.4.2 ප්‍රගතිය සහ අයවැය අවශ්‍යතා

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2024 වසර සඳහා වෙන්කරන ලද මුදල (මි.රු) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (මි.රු) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| නාගරික ව්‍යාපෘති සකස් කිරීම සඳහා පහසුකම සැපයීම (UPPF) | 1146.0 | 320.0 | 9.017 | 80 |

නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීමේ ණය (UPPF) මගින් සකස් කරන ලද තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහනෙහි උපව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා 2025 වර්ෂය තුළ රු.මි. 1700.16ක් ඇස්තමේන්තුගත කර තිබුනද, සංචාරක අමාත්‍යාංශය හරහා සකස් කිරීමට යෝජිත ප්‍රතිපත්ති තීරණගැනීම මේ වන තාක් අවසන් නොවී පවතින බැවින් තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන ණය ගිවිසුම් ගත වීම ප්‍රමාද වී ඇත. ණය ගිවිසුම් ගතවීමේ කටයුතු 2025 1 වන කාර්තුව තුල අවසන් වේ නම්, තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහනෙහි පැකේජ 1 සහ 2 සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට 2025 වර්ෂයේදී අපේක්ෂා කෙරේ.

## 18.4.3 විශේෂ ජයග්‍රහණ

පැකේජ 6කින් යුතු ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

**පැකේජය 1 :** නවගම්මානය රථගාල සංවර්ධනය කිරීම, සියවස් මාවත සංවර්ධනය කිරීම, විදේශික සංචාරකයන්ගේ නැවතුම් අංගනය සංවර්ධනය කිරීම, කෞතුකාගාරය සංවර්ධනය කිරීම හා සීගිරිය වැව සංවර්ධනය කිරීම

**පැකේජය 2 :** Heritage Trail (3400mt) සංවර්ධනය කිරීම, මාපාගල පුරාවිද්‍යා රක්ෂිතය වැඩිදියුණු කිරීම, පිදුරංගල පුරාවිද්‍යා රක්ෂිතය වැඩිදියුණු කිරීම හා කළුදිය පොකුණ පුරාවිද්‍යා රක්ෂිතය වැඩිදියුණු කිරීම

පැකේජය 1 හා 2 හි වාස්තු විද්‍යාත්මක සැලසුම්, විස්තරාත්මක සැලසුම්, සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා, වියදම් ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය ලියවිලි සකස් කර ප්‍රසම්පාදනය ආරම්භ කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබාගැනීම සඳහා යොමු කර ඇත.

**පැකේජය 3 :** ෆෝඩ් ෆෙඩ්රික් බලකොටුව ප්‍රතිසංස්කරනය කිරීම, කන්නියා උණුවතුර ළිං සංරක්ෂණය කිරීම හා පෞරාණික ගොඩනැඟිල්ල (Colonial Building) සංවර්ධනය කිරීම
**පැකේජය 4 :** Dutch bay සහ Back bay වෙරළ තීර සංවර්ධනය කිරීම
**පැකේජය 5 :** ගලේවෙල වැව, ළමා උද්‍යානය සංවර්ධනය කිරීම හා අවන්හල ඉදිකිරීම

ඉහත පැකේජ තුන සඳහා වාස්තු විද්‍යාත්මක සැලැසුම්, සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා සහ මූලික ඇස්තමේන්තු සකස් කර ඇත.

**පැකේජය 6:** ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම -දඹුල්ල
ශක්‍යතා වාර්තාව, සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා සහ මූලික ඇස්තමේන්තු සකස් කර ඇත.

ඉහත පැකේජ සඳහා සංකල්පිය සැලැසුම් (Concept Designs), සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා සහ මූලික ඇස්තමේන්තු සකස් කර ඇත.

## 18.4.4. 2025 වසර සඳහා සැලසුම්

පැකේජ 1 සහ 2 සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත.

## 18.5 නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

### 18.5.1 හැඳින්වීම

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය කොළඹ නගරය මුල්කොට ගෙන ක්‍රියාවට නැංවෙන අතර, හඳුනාගත් අඩු ආදායම්ලාභී ජනාවාස වල පදිංචිකරුවන් සඳහා පිළිගතහැකි මට්ටමේ ස්ථිර නව නිවාස ඒකක ලබාදීම තුළින් ඔවුන් සාමාජීය, සැලසුම්මය හා ආර්ථික වශයෙන් ඉහළට නංවාලීම ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව, 2010 වසරේ කරන ලද සමීක්ෂණය අනුව හඳුනාගත් කොළඹ නගරයේ 68,812 ක පමණ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඒකක 50,000 ක් ඉදිකිරීම පාදක කොටගෙන මෙම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය හඳුන්වා දෙනු ලැබීය. ඒ යටතේ මේ වන විට නිවාස ඒකක 15,768 ක ඉදිකිරීම් අවසන්කොට නිවාසලාභීන් පදිංචිකොට අවසන් කර ඇත.

#### දැක්ම

නාගරික අඩු පහසුකම් ජනාවාස වල පුරවැසියන්ගේ ජීවන තත්වය නංවාලීම සඳහා නවීන නිවාස ඒකක වෙත නැවත පදිංචි කිරීම මගින් කොළඹ නගරයේ පවතින පැල්පත් ආදී අඩු පහසුකම් සහිත නිවාස ඉවත් කිරීම.

#### අරමුණ

නාගරික අඩු පහසුකම් ජනාවාස වල පදිංචිකරුවන් ස්ථිර නවීන නිවාස ඒකක සඳහා පුනස්ථාපනය කිරීම මගින් නගරයේ පවතින අඩු පහසුකම් සහිත නිවාස ඉවත් කිරීම

### 18.5.2 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය | මූල ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2024 (රු. මිලි) | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 | | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | % | |
| 01 | 601 වත්ත නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 450) | 3,358.59 | 450 | 447.19 | 3,251.78 | 96 | 100 |
| 02 | කොලොන්නාව නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 336) | 3,303.64 | 336 | 423.00 | 2,915.89 | 88 | 99.9 |



කොලොන්නාව නිවාස ව්‍යාපෘතිය



601 වත්ත නිවාස ව්‍යාපෘතිය

### 18.5.3 මුහුණුදුන් අභියෝග

කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වලතා මත මෙයට පෙර කොළඹගේ මාවත, ටොරිංටන් මාවත හා කිඹුලා ඇල ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට සිදු වූ අතර, එම ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම මත ප්‍රමාද වුණි.

### 18.5.4 ලබාගත් ජයග්‍රහණ

රන්දොර උරුමය ඔප්පු ලබා දීම වැඩසටහන මඟින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ නිවාසලාභීන් වෙත ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, මේවන විට ව්‍යාපෘති 3කට (මෙට්‍රෝ හෝම්ස්, මිහිඳුසෙන්පුර, සිරිසර උයන) අදාල ඔප්පු 167ක් ලබා දී ඇත. ඉතිරි නිවාසලාභීන්ගේ ඔප්පු ලබාදීම ඔවුන් වෙත නියමිතව ඇති අවශ්‍යතාවයන් සැපිරීම අනුව ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිතය. අනෙකුත් ව්‍යාපෘතිවල ඔප්පු ලබාදීමට අවශ්‍ය අනුමැතීන් ලබාගනිමින් පවතී.

### 18.5.5 2025 වසර ක්‍රියාකාරී සැලැස්ම

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති | කොළඹගේ මාවත (615) | 1,063.70 | මහාභාණ්ඩාගාර අරමුදල | 45% |
| අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති | ටොරින්ටන් මාවත (115) | 261.90 | මහාභාණ්ඩාගාර අරමුදල | 20% |
| අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති | කිඹුලා ඇල (479) | - | මහාභාණ්ඩාගාර අරමුදල | - |

## 18.6 කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

### 18.6.1 හැඳින්වීම

දිනෙන් දින ඉහල යන නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව විසඳීම සඳහා සනීපාරක්ෂක කසල රඳවනයක හදිසි අවශ්‍යතාවය සහ අත්‍යාවශ්‍ය බව සැලකිල්ලට ගනිමින් පුත්තලම අරුවක්කාලු ප්‍රදේශය ආශ්‍රිත ව්‍යුහයක් සහිත සනීපාරක්ෂක කසල රඳවනයක් පිහිටුවීමට රජය විසින් මෙම අමාත්‍යාංශයට භාර දෙන ලදී.

ව්‍යාපෘතියට පහත පැකේජ 4ක් ඇතුලත් වේ.

1. පැකේජය A (කැලණිය සහ අරුවක්කාලු කසල හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීම)
2. පැකේජය B (අරුවක්කාලු සනීපාරක්ෂක කසල රඳවනය ඉදිකිරීම)
3. පැකේජය C (දුම්රිය මාර්ග දිගුව සහ සම්බන්ධතා මාර්ග ඉදිකිරීම)
4. පැකේජය D (දුම්රිය උපකරණ, යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් වැඩිදියුණු කිරීම් මිලදී ගැනීම)

ඉහත පැකේජ A, B, C හි සැලසුම් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් හා සවුත්වෙස්ට් මුනිසිපල් ඉංජිනියරින් ඇන්ඩ් රිසර්ච් ඉන්ස්ටිටියුඩ් ඔෆ් චයිනා වෙත 2017.12.29 දින ඇ.ඩො. 90,482,259.16 සහ ශ්‍රී ලංකා මුදලින් රු. 1,622,936,211.10 (VAT/බදු හැර) සම්පූර්ණ මුදලකට ප්‍රධානය කරන ලදී. පැකේජ D වලට බහාලුම් පෙට්ටි 94 ක්, දුම්රිය එන්ජින් 4 ක් සහ දුම්රිය ප්‍රවාහන ගැල් 34 ක් මිලදී ගැනීම ඇතුලත් වේ.

**දැක්ම**

පිරිසිදු හා වඩා යහපත් පරිසරයක් සඳහා තිරසර අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම.

**මෙහෙවර**

ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම, ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ වැඩි දියුණු කිරීම, මහජන සෞඛ්‍ය නගා සිටුවීම, පාරිසරික අඛණ්ඩතාවය සහ ආර්ථික ශක්‍යතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් සහිත විද්‍යාත්මක කසල රැඳවුම් පද්ධතියක් සැකසීම.

**අරමුණු**

මහ කොළඹ කලාපයට සහ අනෙකුත් විභව පළාත් පාලන ආයතන සඳහා ආර්ථික ශක්‍යතාව සහිත, සමාජීය වශයෙන් පිළිගත හැකි, පරිසර හිතකාමී සහ දිගුකාලීනව තිරසාර සහ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සැකසීම.

### 18.6.2 2024 ප්‍රගතිය

මේ වන විට ව්‍යාපෘතිය 98% ක භෞතික ප්‍රගතියක් ලබාගෙන ඇති අතර කැලණියේ සිට අරුවක්කාලු දක්වා අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා දුම්රිය එන්ජින් 4 ක්, බහාලුම් පෙට්ටි 94 ක් දැනටමත් මෙරටට ආනයනය කර ඇත. ශක්‍යතා අධ්‍යයනයට යටත්ව දුම්රිය ප්‍රවාහන ගැල් 34 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

| # | ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාල සීමාව | **TEC (රු.මි.)** | ප්‍රතිපාදන – **2024** (රු.මි.) | සමස්ථ ප්‍රගතිය **31.12.2024** දක්වා | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික **(%)** | මූල්‍ය (රු.මි.) |
| 1 | කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 2017 ජනවාරි - 2025 දෙසැම්බර් | 33,237.76 (ඇ.ඩො.මි. 130) | 5,500 | 98.7 | 1895.61 |
| **එකතුව** | | | **33,237.76** | **5,500** | **98.7** | 1895.61 |

### කැලණිය කසල හුවමාරු මධ්‍යස්ථානය



කසල හුවමාරු ගොඩනැගිල්ල



අපද්‍රියර පිරිපහදු බලාගාරය

### අරුවක්කාලු කසල හුවමාරු මධ්‍යස්ථානය



ගැන්ට්‍රි ක්‍රේන් දොඹකර පර්යන්තය



සේවක විවේකාගාරය

### අරුවක්කාලු සනීපාරක්ෂක කසළ රඳවනය



සනීපාරක්ෂක කසල රඳවනය



අපද්‍රියර පිරිපහදු පද්ධතිය

## 18.6.3 2025 සැලැස්ම

| # | ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාල සීමාව | TEC (රු.මි.) | මූල්‍ය අවශ්‍යතාව - 2025 (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 2017 ජනවාරි - 2025 දෙසැම්බර් | 33,237.76 | 5100.00 |
| එකතුව | | | 33,237.76 | **5100.00** |

## 18.7 චීනරජයේ ආධාරමත අඩුආදායම්ලාභී පුද්ගලයන් සඳහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය

### 18.7.1 හැඳින්වීම

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාමක් ලෙස චීන රජයේ මූල්‍ය පරිත්‍යාග (Grant) ලෙස නිවාස ඒකක 1996 ක් (අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති 4 ක් හා කලාකරුවන් සඳහා ව්‍යාපෘති 1 ක්) ඉදිකිරීමට පියවර ගනිමින් පවතී. සමස්ථ නේවාසික ගෙබිම් ප්‍රමාණය 100,000m$^2$ වන අතර, මුළු දළ ගෙබිම් ප්‍රමාණය ආසන්න ලෙස 160,000.00 m$^2$ වේ. චීන රජයේ ප්‍රධානය චීන යුවාන් (RMB) මිලියන 552 ක් වන අතර, රජයේ දේශීය ආයෝජනය රුපියල් මිලියන 8,128.91 ක් වේ. (රුපියල් බිලියන 22) මෙම සහයෝගීතාවය නාගරික පුනර්ජීවනය සහ සමාජ නගාසිටුවීමේ පුළුල් අරමුණ සඳහා දායක වෙමින් අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා උසස් තත්ත්වයේ නිවාස ඒකක ලබාදීම අරමුණු කරයි.

### 18.7.2 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු පිරිවැය | | ප්‍රතිලාභීන් | ප්‍රතිපාදන2024 | | මූල්‍ය ප්‍රගතිය 2024.12.31 | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය (RMB. මි.) | දේශීය (රු. මි.) | | විදේශීය (රු. මි.) | දේශීය (රු. මි.) | විදේශීය (RMB.මි.) | දේශීය (රු. මි.) | % |
| 01 | පැලියගොඩ නිවාස ව්‍යාපෘතිය (ඒකක 615) | 135.67 | 2,575.84 | 615 | 3000.00 | 200.00 | 20.35 | 0.47 | 7.5 |
| 02 | දෙමටගොඩ නිවාස ව්‍යාපෘතිය (ඒකක 586) | 126.74 | 2,204.41 | 586 | | | 19.01 | 12.52 | 7.5 |
| 03 | මොරටුව, නිවාස ව්‍යාපෘතිය (ඒකක 575) | 141.13 | 2,585.31 | 575 | | | 21.17 | 142.61 | 7.5 |
| 04 | මහරගම නිවාස ව්‍යාපෘතිය (112) | 24.72 | 422.42 | 112 | | | 3.71 | 0.52 | 7.5 |
| 05 | කොට්ටව නිවාස ව්‍යාපෘතිය (108) | 38.25 | 340.90 | 108 | | | 5.74 | 0.55 | 7.5 |


යෝජිත මොරටුව නිවාස ව්‍යාපෘතිය


යෝජිත පැලියගොඩ නිවාස ව්‍යාපෘතිය


යෝජිත දෙමටගොඩ නිවාස ව්‍යාපෘතිය

### 18.7.3 මුහුණදුන් අභියෝග

ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා අදාළ ඉඩම්වල පැවති තත්වයන් ඉදිකිරීම් වලට සුදුසු තත්වයට රැගෙන ඒමට ගොඩකිරීම් (පැලියගොඩ) බැටරි අපද්‍රව්‍ය ඉවත් කිරීම් (මොරටුව) අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම් (දොමටගොඩ, කොට්ටාව) පවතින ඉදිකිරීම් ඉවත්කිරීම් (මහරගම) සඳහා කාලය ගතවීම. එමෙන්ම, මොරටුව, කොට්ටාව හා දෙමටගොඩ ව්‍යාපෘති භූමි සඳහා විවිධ පාර්ශව මගින් අධිකරණමය ක්‍රියාමාර්ග වලටද යොමුවූ අතර, ඒවා ද කළමනාකරණ කරගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ තත්වයට හරවා ගෙන ඇත.

### 18.7.4 ලබාගත් ජයග්‍රහණ

චීන රජයේ ප්‍රදානය ලබා ගැනීම සඳහා අවස්ථා ගණනාවක් ඔස්සේ විවිධ සාකච්ඡා, ක්ෂේත්‍ර පරීක්ෂා, පවත්වන ලද අතර, ඒ අනුව, චීන රජයේ නියෝජිතායතනය සමඟ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ ගිවිසුම 2023.11.27 දින අත්සන් කරන ලදී. ඒ සඳහා 2024.05.14 දින කැබිනට් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව, නිවාස ඉදිකිරීමට අදාළව ලංසු කෙටි ලැයිස්තුගත චීන ලංසුකරුවන් මගින් ලංසු කැඳවීම් කොට පැකේජ 3ක් යටතේ කොන්ත්‍රාත් පිළිගන්වා ඇත. එනම්.
පැකේජය 01 - මොරටුව හා කොට්ටාව නිවාස යෝජනා ක්‍රම
පැකේජය 02 - දෙමටගොඩ හා මහරගම නිවාස යෝජනා ක්‍රම
පැකේජය 03 - පැලියගොඩ නිවාස යෝජනා ක්‍රමය වශයෙනි

ව්‍යාපෘතිය නිල වශයෙන් මුල්ගල් තබා ආරම්භය 2024.12.27 දින පවත්වන ලදි

### 18.7.5 2025 වසර ක්‍රියාකාරී සැලැස්ම

| ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය | | ප්‍රභවය | ඉලක්කගත භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|
| | | විදේශීය (රු. මිලි.) | දේශීය (රු. මිලි.) | | |
| අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස | පැලියගොඩ නිවාස යෝජනා ක්‍රමය | 2,678.43 | 1,250.25 | චීන ආධාර + රජයේ අරමුදල් | 46.68% |
| අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස | දෙමටගොඩ නිවාස යෝජනා ක්‍රමය | 2,502.25 | 982.85 | චීන ආධාර + රජයේ අරමුදල් | |
| අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස | මොරටුව නිවාස යෝජනා ක්‍රමය | 2,786.29 | 1,427.59 | චීන ආධාර + රජයේ අරමුදල් | |
| අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස | මහරගම නිවාස යෝජනා ක්‍රමය | 488.05 | 244.78 | චීන ආධාර + රජයේ අරමුදල් | |
| කෘතහස්ත කලාකරුවන් සඳහා | කොට්ටාව නිවාස යෝජනා ක්‍රමය | 755.10 | 239.26 | චීන ආධාර + රජයේ අරමුදල් | |

# 19 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සහ වැඩසටහන්

## 19.1 ජල සම්පාදන අංශය හා ක්‍රියාත්මක ව්‍යාපෘති

### හැඳින්වීම

ජලය, මිනිසාගේ ප්‍රභවය මෙන්ම පැවැත්මද තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයයි. එබැවින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2010 වර්ෂයේදී ආරක්ෂිත ජලය සඳහා ප්‍රවේශය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. ඉහත අයිතිවාසිකම තවදුරටත් සහතික කිරීම සඳහා ප්‍රකාශයට පත්කරන ලද තිරසාර සංවර්ධන අරමුණු 17 අතරින් 06 වන අරමුණ ලෙස "සැමට ආරක්ෂිත පානීය ජලය සඳහා වූ ප්‍රවේශය සහ ප්‍රමාණවත් සනීපාරක්ෂාව සහතික කිරීම ඇතුළත් කිරීම තුළින් මෙහි ඇති වැදගත්කම අවධාරණය කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB) ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ සනීපාරක්ෂක සේවා සඳහා පහසුකම් සැලසීමේ වගකීම දරන ප්‍රධාන ආයතනය ලෙස නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවලට ආරක්ෂිත නල ජලය හා නල මලාපවහන පහසුකම් ලබා දීමේ වගකීම ඉටු කරනු ලබයි. ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශ සඳහා ආරක්ෂිත පානීය ජලසම්පාදනය හා සනිපාරක්ෂක පහසුකම් සැපයීමේ වගකීම ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව (DNCWS) වෙත පැවරි ඇත.

### දැක්ම

සැමට තිරසාර පානීය ජල සැපයුම හා සනීපාරක්ෂාව

### මෙහෙවර

විශ්වාසනීය ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා සැපයීම තුළින් ප්‍රවේශය සහ තෘප්තිය සහතික කිරීම

### ජල සම්පාදන අංශයේ කාර්යභාරය (2024 .11.25 වන දින නිකුත් වූ ගැසට් පත්‍රිකාව අනුව)

- සියලුම පුරවැසියන්ට පිරිසිදු පානීය ජලය ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම.
- ජල සැපයුම් සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් පරීක්ෂා කිරීම, ඒවා සඳහා නව සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ඒවා නඩත්තු කිරීම.
- ග්‍රාමීය වැව් හා ජලාශ සහ වාරිමාර්ග පද්ධති සම්බන්ධීකරණය කිරීමෙන් ජල සුරක්ෂිතතාව සහ නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම.
- පානීය ජල බෙදා හැරීමේ පද්ධතියේ ජලය අපතේ යෑම වැළැක්වීම.
- ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති කාර්යක්ෂමව හා ක්‍රමානුකූලව සිදුකිරීමට පියවර ගැනීම.
- ග්‍රාමීය ජනතාව සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම සහතික කිරීම සඳහා ජල සම්පාදන ව්‍යාපෘති නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශවල පානීය ජල සැපයුම ස්ථාවර කිරීම, ජලාශ සංවර්ධනය කිරීම.

### ජල සම්පාදන අංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘති

1. ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)
2. ජල තාක්ෂණය සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානය (JRDC)
3. සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක වැඩසටහන්

## 19.1.1 ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)

2015 වර්ෂයේ ආරම්භ කරන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) ශ්‍රී ලංකාවේ බදුල්ල, මොනරාගල, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, කිළිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කයන් හි පානීය නළ ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුවේ ඒකාබද්ධ මුල්‍ය ප්‍රතිපාදන මත ආරම්භ වූ ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ සමස්ථ මුල්‍ය ඇස්තමේන්තු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 226.74 කි. (පළමු අදියර ඇමරිකානු ඩොලර් මිලියන 183.90 ක් සහ දෙවන අදියර ඇමරිකානු ඩොලර් මිලියන 42.84 කි). වර්ෂ 2021 දී ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම සඳහා අතිරේක මුල්‍ය අරමුදල් ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 42.84ක ප්‍රධානයක් ලැබුණු අතර එමගින් ගම්පහ, කුරුණෑගල, මාතලේ සහ මාතර යන දිස්ත්‍රික්කයන් හි ප්‍රජාව වෙනුවෙන් පානීය නළ ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතිය මඟින් 1,144,500ක ප්‍රජාව උදෙසා ආරක්ෂිත නළ ජලය ලබාදීමට යෝජනාවූ අතර, එයින් නිවාස 57,850ක් නාගරික ප්‍රදේශවලද, නිවාස 8,050ක් වතු ප්‍රදේශවලද, ඉතිරි නිවාස 57,400ක් ග්‍රාමීය ප්‍රදේශවලද පිහිටුවා ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල පවතින ජල ව්‍යාපෘතිවල සංවර්ධනය සඳහා පුනුරුත්තාපන කටයුතු සිදුකිරීම මඟින් නිවාස 48,500ක ප්‍රජාව වෙත ප්‍රතිලාභ සලසා ඇත. මේ වන විට ව්‍යාපෘතියේ I හා II අදියර මඟින් නව ජල සම්බන්ධතා 113,060ක් ලබා දී ඇත.

